වර්තමානයේ බොහොමයක් පාසල් දරුවන් නිසි කලට ප්‍රථම පාසල් හැරයාම බහුලව දැකිය හැකිය. මීට හේතු විමසා බැලීමේදී පාසල් සිසුන් මත්ද්‍රව්‍යවලට යොමු වී ඇති බව පැහැදිලි විය. ග්‍රාමීයත්වය හා නාගරිකත්වය මත ශිෂ්‍ය ප්‍රජාවගේ මෙම ඇබ්බැහිවීම්වල විෂමතාවන් පවතීද, යන්න අධ්‍යයනය කිරීම පර්යේෂණයේ අරමුණ වේ. මේ සඳහා ගම්පහ දිස්ත්‍රික්කයේ නාගරික පාසල් දෙකක් හා ග්‍රාමීය පාසල් දෙකක් ආශ්‍රයෙන් පර්යේෂණයක් සිදු කරන ලදී. එම පාසල් වල 6-11 ශ්‍රේණිවල පිරිමි සිසුන් ගෙන් 100 ක නියැදියක් ගෙන ප්‍රශ්නාවලි ක්‍රමය හා සම්මුඛ සාකච්ඡා ක්‍රමය මඟින් දත්ත රැස් කරගෙන විශ්ලේෂණය සිදු කරන ලදී. මෙහිදී නිගමනය වූයේ, නගරයට සාපේක්ෂව ග්‍රාමීය පාසල් ශිෂ්‍යයා මත්ද්‍රව්‍යවලට ඇබ්බැහිවීමේ වර්ධනයක් පෙන්නුම් කරන බවයි. ඊට හේතු වශයෙන් පර්යේෂණ අධ්‍යයනයේ දී පැහැදිලි වූයේ, ග්‍රාමීය පාසල් තුළ ශිෂ්‍යයන් පාසල අවට ම පදිංචිකරුවන් වීම හේතු කොට ගෙන පාසල් කාලයෙන් පරිබාහිරව ද එකිනෙකාට නිතර මුණ ගැසීමේ අවස්ථා වැඩිකම මත ඔවුන් කල්ලි වශයෙන් මෙම ක්‍රියාවල නිරත වන බවයි. එසේම පාසල් කාලයෙන් පරිබාහිරව මුණ ගැසීමේ අවස්ථා සීමිත වීම මත නාගරික ශිෂ්‍යයා මත්ද්‍රව්‍ය කෙරෙහි ඇබ්බැහි වීමේ ප්‍රවණතාව අඩු බව පැහැදිලි විය. එසේම, මෙම ඇබ්බැහිවීම්වලට බලපාන බාහිර සාධක අධ්‍යයනය කිරීමේදී පාසල් අසල පවතින ඇතැම් කුලීරථ රියදුරන්ගේ ඇසුර පාසල් ශිෂ්‍යයන්ගේ මත්ද්‍රව්‍ය ඇබ්බැහිවීම්වලට හේතු සාධක ලෙස පෙනී ගියේය. මේ සියලු හේතු සාධකයන් මත සිදුවන අනිවාර්ය කරුණක් ලෙස පෙනී ගියේ, වත්මන් පාසල් සිසුන්ගෙන් බහුතරයක් නිසි කලට ප්‍රථම පාසල් හැර යාම හා ඒ හේතුවෙන් සමාජයට අහිතකර පුද්ගලයින් බොහොමයක් නිර්මාණය වීමයි. පර්යේෂණය සිදුකරගෙන යාමේදී, ඉදිරිපත් වූ යෝජනා අතර පාසල් ශිෂ්‍යයින් ඇසුරු කරන කරන කණ්ඩායම් හා ඔවුන්ගේ ක්‍රියාකාරකම් පිළිබඳ දෙමාපියන් දැඩි අවධානයක් යොමු කළයුතු බව ප්‍රත්‍යක්ෂ විය.

**මුඛ්‍ය පද :** ඇබ්බැහි වීම, කල්ලි ගැසීම, මත්ද්‍රව්‍ය, ශිෂ්‍යයා, ඇසුර

[1] ආර්ථික විද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, rushanthidilshani@gmail.com

# Usage of Internet among School Students (Research based on Siridhamma College- Galle [mixed school])

**M. Y. G. V. Jayawardena**[1]

## Abstract

Along with the development of technological devices around the world, there is an enormous tendency towards the utilization of internet. It has become an inevitable factor within the parameters of communication. Hence, this research displays the usage of the internet and the impact creating through these technological advancements. The research based on the data, collected from a mixed school in Galle district, Siridhamma College and the sample included 100 school students representing from Grade 6-13. Moreover, it based on the primary data, which have collected using a questionnaire. According to the data analysis, 85% out of the total amount was using internet and 50% out of it was boys and the rest 35% was girls. The recorded data elucidates that the most of the students (52%) use internet to connect with Social Media sites, 25% for educational purposes, 14% for movies and games and the rest 7% use internet for other purposes. About 25% from the sample uses Internet and social media sites confidentially. There were students who had fake age profiles also in social media sites. Out of 52%, who use internet to connect with social media sites are from grade 9-13. Most of students' opinion was that internet should be limitless despite of age range. Thus, this research reveals that most of the school students from grade 6-13 use internet to connect with social media sites.

**Keywords** : Internet, Social Media, School Students.

[1]Department of Economics, University of Kelaniya, yahamaleejayawardena@gmail.com

# ශ්‍රී ලංකාවේ අ.පො.ස. උසස් පෙළ සහ ඊට ඉහළ සුදුසුකම් ලැබූ පුද්ගලයින්ගේ සේවා වියුක්තික අනුපාතය ආර්ථිකයට ඇතිකරනු ලබන බලපෑම

ඒ. ඩී. එන්. පී. අස්සැල්ල[1]

**සංක්ෂේපය**

සේවා වියුක්තිකයන් යනුවෙන් හැඳින්වෙන්නේ, රැකියාවක් කිරීමට සූදානම්, රැකියාවක් සොයන, එහෙත් යෙදීමට රැකියාවක් නොමැති පුද්ගලයින් වන අතර ශ්‍රී ලංකාවේ සේවා නියුක්ති සංඛ්‍යාවේ ඉහළ යෑමට වඩා වැඩි වේගයකින් සේවා වියුක්ති අනුපාතය ඉහළ යනු දක්නට ලැබේ. වයස් මට්ටම, අධ්‍යාපන මට්ටම, ස්ත්‍රී/පුරුෂ භාවය, ප්‍රදේශය, පළපුරුද්ද අනුව සේවා වියුක්තිය වර්ග කිරීමේදී අධ්‍යාපන මට්ටම අනුව, අ.පො.ස. උසස් පෙළ සහ ඊට ඉහළ සුදුසුකම් ලැබූ පුද්ගලයින්ගේ සේවා වියුක්තිය වාර්ෂිකව ඉහළ අගයක් ගැනීම කැපී පෙනෙන ලක්ෂණයකි. අධ්‍යාපනය සහ නිපුණතා වර්ධනය සඳහා වැය කෙරෙන මහජන මුදල් නිශ්ඵල වීම තුළින් ආර්ථිකයෙහි දීර්ඝ කාලීන ඍණාත්මක බලපෑම් ඇති වීම අ.පො.ස. උසස් පෙළ සහ ඊට ඉහළ සුදුසුකම් ලැබූ පුද්ගලයින්ගේ සේවා වියුක්තිය හේතුවෙන් ඇතිවූ ප්‍රධාන ගැටලුවක් බවට පත්ව ඇත. මේ හේතුවෙන් අ.පො.ස උසස් පෙළ සහ ඊට ඉහළ සුදුසුකම් ලැබූ පුද්ගලයින්ගේ සේවා වියුක්තියට බලපාන හේතු සොයා බැලීමත් එමගින් ආර්ථිකයට ඇති කරනු ලබන බලපෑම අධ්‍යයනය කිරීමත් මූලික අරමුණු විය. ඒ අනුව, 1990-2015 දක්වා කාල සීමාව තුළ ප්‍රකාශයට පත් කරනු ලැබූ වාර්ෂික මහ බැංකු වාර්තා සහ ජනලේඛන සහ සංඛ්‍යාලේඛන වාර්තා යන මූලාශ්‍රවල ද්විතියික දත්ත උපයෝගී කරගනිමින් කාලශ්‍රේණි විශ්ලේෂණය ඔස්සේ දත්ත විශ්ලේෂණය කරමින් වගු ප්‍රස්තාර ඇසුරෙන් ලබාගත් දත්ත ඉදිරිපත් කරනු ලැබී ය. මේ අනුව 1990 වර්ෂයේදී 29.4%ව පැවති අ.පො.ස.උසස් පෙළ සහ ඊට ඉහළ සුදුසුකම් ලැබූ පුද්ගලයින්ගේ සේවා වියුක්තික අනුපාතය 2004 දී 16.8%ත්, 2010 දී 11.6% ත්, 2014 දී 8.1% ක අඩුවීමකුත් පෙන්නුම් කළ ද, 2015 වර්ෂයේදී 9.2% ක වර්ධනයක් පෙන්නුම් කරනු ලැබීමෙන් සමස්ත සේවා වියුක්තික අනුපාතයද 2014 වර්ෂයේ දී 4.3% සිට 2015 වර්ෂයේ දී 4.6% දක්වා වර්ධනය වී ඇත. මේ අනුව, ශ්‍රී ලංකාවේ තෘතීයික පිළිගත් අධ්‍යාපනික ආයතන විසින් ලබාදෙන විෂයමාලා නූතන ආර්ථිකය සරිලන ශිල්පීය දැනුම උත්පාදනය කළ හැකි තාක්ෂණික ක්‍රමවේදයක් ඉලක්ක කර නොගැනීමත්, තරුණ අපේක්ෂා සහ අවබෝධයත්, ඔවුන්ගේ දැනුමත්, කුසලතාවයත්, අපේක්ෂිත නිපුණත්වය මත ශ්‍රම ඉල්ලුම සහ ශ්‍රම සැපයුම අතර පවතින නොගැලපීම මෙම සේවා වියුක්තියට හේතු වී ඇති බව අවබෝධ විය. ඒ තුළින් තරුණ පිරිස අතර ඇතිවන සමාජ අසහනය ආර්ථික ඵලදායිතාවය අඩු කිරීමට හේතු වන බව අනාවරණය විය.

**මුඛ්‍ය පද :** සේවා වියුක්තිය, ආර්ථික ඵලදායිතාවය, අ.පො.ස. උසස් පෙළ

[1] ආර්ථික විද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, nireshaassalla@gmail.com

# The reasons for customers interesting to deal with the Private banks more than Government banks

**W. M. A. S. Koshila**[1]

## Abstract

The current trend of the world is that the private banks are coming up than the government banks. According to this trend, the private bank sector is very popular among the Sri Lankan customers' more than public banks. 100 people in semi urban area of Kirindiwela of Gampaha District were selected as the sample of the research. The objective of this research is to identify the reasons of people more interesting to deal with private banks more than public banks. Questionnaire method was used to collect data. According to the answers of questionnaire, it provides some major factors are affecting why, more people are like to private bank. However, the factors would be affected are, the services who are providing, the efficiency service of the bank, and the convenience that provides to their customers, the level of distribution of the bank etc…. Eventually, more than 60%of the busy people, business and citizen who are dealing with the private banks and 40% of the crowed deal with the government bank sector who are villages, students, long-term customers. According to the conclusion would be government bank must be built up with new strategies more than current even improving these factors influence to attracting new customers and retain current customers.

**Keywords** : Private Banks, Government Banks, Distribution, Convenience, Busy people

[1] Department of the Marketing, University of Sri Jayawardenepura,
akilakoshila@gmail.com

# ශ්‍රී ලංකාවේ රෙදිපිළි හා ඇඟලුම් කර්මාන්තය මුහුණපාන ගැටලු පිළිබඳව විමර්ශනාත්මක අධ්‍යයනයක්

**ආර්. එන්. කේ. රාජපක්ෂ**[1]

**සංක්ෂේපය**

1970 ට පෙර කාලයේ, ශ්‍රී ලංකාවේ සාම්ප්‍රදායික කෘෂි අපනයන භෝග කෙරෙහි දැඩි රැඳියාවක් දැක්වූ තත්වයටම, රෙදිපිළි හා ඇඟලුම් කර්මාන්තය කෙරෙහිද දැඩි රැඳියාවක් දැක්වීමට සිදු වී ඇත. එසේම වර්තමාන ශ්‍රී ලංකාවේ රෙදිපිළි හා ඇඟලුම් කර්මාන්තය දළ දේශීය නිෂ්පාදිතයට, අපනයන ඉපැයුම්වලට සහ සේවා නියුක්තිය සම්බන්ධයෙන් වැදගත් දායකත්වයක් සපයමින් ආර්ථිකයේ වැදගත් අංගයක් බවට පත් වී ඇත. 2002 වර්ෂයට සාපේක්ෂව ලංකවේ දල දේශීය නිෂ්පාදිතයට රෙදිපිළි හා ඇඟලුම් නිෂ්පාදන අංශයෙන් 17% ක් පමණ දායක වන අතර මුළු අපනයන ඉපැයුම්වලින් 52% ක් පමණ ද, මුළු කාර්මික අපනයන ඉපැයුම්වලින් 70% ක් පමණ ප්‍රමාණයක් ද, රෙදිපිළි හා ඇඟලුම් අපනයනයන්ගෙන් සමන්විත වේ. මෙම අධ්‍යයනයේ අරමුණ වන්නේ, ශ්‍රී ලංකාවේ රෙදිපිළි හා ඇඟලුම් කර්මාන්තය වර්තමානයේ දී මුහුණ දෙනු ලබන ගැටලු සහ උපනතීන් පිළිබඳව විමසා බැලීමයි. මේ සඳහා දත්ත ලබා ගැනීමේ ප්‍රධාන ක්‍රමවේදය ලෙස ද්විතීක දත්ත භාවිතා කරන ලදී. එහිදී 2002 වර්ෂයට අදාළ වාර්ෂික මහ බැංකු වාර්තාව උපයෝගී කරගන්නා ලදී. මෙම අධ්‍යයනය සිදු කිරීමේ දී, මෙම කර්මාන්තය මුහුණපාන ප්‍රධානතම ගැටලුව ලෙස හඳුනා ගනු ලැබුවේ, මෙම අංශය තුළ වැඩි වශයෙන් ආනයනික අමුද්‍රව්‍ය සහ යන්ත්‍ර භාවිතා කිරීමයි. එබැවින් මෙම අංශයේ ශුද්ධ විදේශීය විනිමය ඉපැයුම් අඩු මට්ටමක පවතී. ආනයනික අමුද්‍රව්‍ය මිල ගණන් වැඩිවන විට මෙම අංශයේ නිෂ්පාදන පිරිවැය ද ඉහළ යයි. මෙම තත්ත්වය මගහරවා ගැනීම සඳහා දේශීය අමුද්‍රව්‍ය භාවිතය වැඩි කිරීමත් නව තාක්ෂණික ක්‍රම යොදා ගැනීමත් ක්‍රමවත් කළමනාකරණය තුළින් ශ්‍රම ඵලදායිතාවය වැඩි කිරීමත් ආදී ක්‍රියාමාර්ග ගත හැකිය. මෙම ගැටලු මගහරවා ගනිමින් අනාගතයේ දී ලංකාවේ රෙදිපිළි හා ඇඟලුම් කර්මාන්තයේ වර්ධනය තුළින් ධනවාදී සංවර්ධනයක් ලබාගත හැකි අතර එසේ නොවුනහොත් ලංකා ආර්ථිකයේ බිඳ වැටීමක් සිදුවිය හැකි බව නිගමනය කළ හැක.

**මුඛ්‍ය පද :** රෙදිපිළි, ඇඟලුම් කර්මාන්තය, ගැටලු, නිෂ්පාදන, අමුද්‍රව්‍ය

[1] ආර්ථික විද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, kawmadirajapaksha@gmail.com

# විශ්වවිද්‍යාල පද්ධතිය තුළ ඉංග්‍රිසි මාධ්‍යයෙන් පැවැත්වෙන දේශන සඳහා උපාධි අපේක්ෂකයින්ගේ සහභාගිත්වයේ ප්‍රවණතාවය විමසීම.

ජේ. එම්. ඒ. රෝහණ[1]

**සංක්ෂේපය**

විශ්වවිද්‍යාල පද්ධතිය තුළ වඩාත් කතාබහට ලක්වෙන මාතෘකාවක් ලෙස ඉංග්‍රීසි මාධ්‍යයෙන් පවත්වනු ලබන දේශන දැක්විය හැක. ශ්‍රී ලාංකිකයන් වන අපගේ මව් භාෂාව සිංහල වුවද විශ්වීය භාෂාව වන ඉංග්‍රීසි අකමැත්තෙන් හෝ ඉගෙන ගතයුතු භාෂාවකි. භාෂාවක් යනු, මිනිසුන් අන්‍යෝන්‍ය ක්‍රියාකාරකම් හා සන්නිවේදනය සඳහා යොදාගනු ලබන වාග් සංකේත වේ. මෙහිදි සිංහල, මව් භාෂාව වන අපගේ උසස් අධ්‍යාපන කටයුතු වලදී ඉංග්‍රීසි මාධ්‍ය දේශන සඳහා යොමුවීම මෙන්ම එම විභාග සඳහා පෙනී සිටීම අනිවාර්ය වී ඇත. එබැවින් මෙහි මූලික අරමුණ වූයේ, සිංහල මාධ්‍ය විෂයන්ට සාපෙක්ෂව ඉංග්‍රීසි විෂයයන්ගේ දේශන සඳහා සහභාගිත්වයේ වෙනසක් පවතිනවා ද යන්න හඳුනා ගැනීම විය. ඒ සඳහා ඉංග්‍රීසි මාධ්‍යයෙන් පැවැත්වෙන දේශන සඳහා උපාධි අපේක්ෂකයින්ගේ සහභාගිත්වයේ ප්‍රවණතාවය පිළිබඳ රුහුණු විශ්වවිද්‍යාලයීය සිසුන් 100ක් ඇසුරින් ලබාගත් නියැදියක් මඟින් මෙම අධ්‍යයනය කරන ලදී. ප්‍රශ්නාවලි ක්‍රමය මඟින් ප්‍රාථමික දත්ත රැස්කර ගනිමින් මෙම අධ්‍යයනය සිදු කරන ලදී.ලබාගත් දත්ත බොහොමයක් ගුණාත්මක දත්ත වන බැවින් ඒ සඳහා වඩාත් උචිත සංඛ්‍යාන ශිල්පීය ක්‍රමයන් භාවිතා කරමින් දත්ත විශ්ලේෂණය කරන ලදී. දත්ත විශ්ලේෂණය අනුව, උපාධි අපේක්ෂකයින්ගේ, සිංහල මාධ්‍ය විෂයන්ට සාපේක්ෂව ඉංග්‍රීසි මාධ්‍ය විෂයයන්ගේ දේශන සඳහා සහභාගිත්වය 78% න් අඩු වී ඇති බව හෙළි විය. මේ සඳහා හේතු විමසීමේදී හෙළි වූයේ, ඉංග්‍රීසි මාධ්‍ය දේශන සඳහා සහභාගි වීමට උපාධි අපේක්ෂකයින් තුළ වූ අකමැත්ත, දේශන නොතේරීම, දේශන වලදි අසනු ලබන ප්‍රශ්න වලට පිළිතුරු ලබාදීමේ නොහැකියාව යන කරුණු දැක්විය හැක. මේ අනුව සිංහල මාධ්‍ය විෂයන්ට සාපේක්ෂව ඉංග්‍රීසි මාධ්‍ය විෂයයන්ගේ දේශන සඳහා සහභාගිත්වය අඩු වී ඇති බව නිගමනය කළ හැක. මෙම ගැටලුව අවම කර ගැනීමට පාඨමාලා හැදෑරීමේදි තම කැමැත්ත පරිදි ඒවා සිංහල හෝ ඉංග්‍රීසි මාධ්‍යයයෙන් හැදැරීමට අවස්ථාව ලබා දීම, සෑම ශිෂ්‍යයකුගේම ඉංග්‍රීසි භාෂාව තේරුම් ගැනීමේ හැකියාව එක හා සමාන නොවන නිසා ඉගැන්වීම් ක්‍රියාවලියට ප්‍රායෝගික ක්‍රියාකාරකම් ඇතුළත් කිරීම යෝජනා ලෙස දැක්විය හැක.

**මුඛ්‍ය පද :** ඉංග්‍රීසි භාෂාව, දේශන, විද්‍යාර්ථීන්, විෂයන්

[1] ආර්ථික විද්‍යා අධ්‍යයන අංශය, රුහුණ විශ්වවිද්‍යාලය, athula.hln@gmail.com

# කොළඹ නගරයේ නාගරීකරණය

**ටී. ඩබ්. එස්. කාංචනමාලා[1]　　කේ. එල්. සී. එස්. චන්ද්‍රසිරි[2]**

**සංක්ෂේපය**

නාගරීකරණය ලෝකය පුරා විශාල ලෙස පැතිරී ඇති සමාජමය විපර්යාසයන් අතර ප්‍රධාන එකකි. එමෙන්ම නාගරීකරණය හැමතැනම ඒකාකාරව වර්ධනය වූ ක්‍රියාකාරකමක් නොවන අතර 'නගර' යන්නට ඍජු නිර්වචනයක සහාය ගැනීමද දුෂ්කරය. නගරයක්, වාණිජ, මූල්‍ය, අධ්‍යාපන, සෞඛ්‍යය, පරිපාලන ආදී විවිධ කාර්යයන් සංකේන්ද්‍රණය වූ ජනාවාසයකි. කොළඹ නගරයේ නාගරික පද්ධතිය තුළ සුවිශේෂී ස්ථානයක් හිමි කරගෙන ඇති බව ප්‍රත්‍යක්ෂ වන අතර කොළඹ නගරයේ නාගරීකරණය නිසා ජනතාවගේ සාමාජික, ආර්ථික, සදාචාරය ආදී තත්ත්වයන්ට ඇති වී ඇති ගැටලුකාරී තත්ත්වයන් මෙම අධ්‍යයනයේ ප්‍රධාන ගැටලුව වේ. මේ නිසා කොළඹ නගරවාසීන්ගේ ජීවන තත්ත්වයට නාගරීකරණයේ බලපෑම අධ්‍යයනය කිරීම මෙහි අරමුණ වේ. අධ්‍යයනය සඳහා ද්වීතියික මූලාශ්‍ර මඟින් අධ්‍යයනය සඳහා දත්ත රැස් කරගන්නා ලදී. අධ්‍යයනයට අනුව කොළඹ නගරය නාගරික පද්ධතිය තුළ සුවිශේෂ ස්ථානයක් හිමි කරගෙන ඇති අතර අනෙක් නගර සූරාකමින් කොළඹ නගරය ඉදිරියට පැමිණ ඇත. කොළඹ නගරයේ ජනගහනය 1981 සිට 2001 දක්වා ජන සංඛ්‍යාව වර්ධනය වී ඇත්තේ 10.1% පමණකි. දිනෙන් දින සිදුවන වාහන තදබදයට හේතුව සංකීර්ණ වන නාගරික පසුබිම තුළ ජනගහනය වර්ධනය, සේවා නියුක්තිය වර්ධනය මහ බැංකු වාර්තා ඔස්සේද තවදුරටත් තහවුරු වේ. සමාජ තත්ත්වය ඉහළ යමින් නව සංකල්ප ජනතාව තුළට පැමිණීමත්, කොළඹ වාණිජ නගරය බවට පත් වෙමින්, වෙළඳපොළ පුළුල් වීම නිසා ජීවන තත්ත්වය ඉහළ ගොස් ඇති බවද දැකිය හැක. මුඩුක්කු හා පැල්පත්වාසී ජනතාව තුළ දක්නට ලැබෙන ප්‍රචණ්ඩකාරී ක්‍රියා, අපරාධ වැනි නීති විරෝධී ක්‍රියා ක්‍රියාත්මක වන බවද දැකිය හැක. රාජ්‍ය ඉඩම් ගොඩකිරීමේ සංස්ථාවේ සංඛ්‍යාලේඛනයට අනුව, පවුල් 543ක් කොළඹ අවට ප්‍රදේශවල ද, කොළඹ නගරයේ අවිධිමත් නාගරීකරණය නිසා කොළඹ නගරය ගංවතුර වලට මුහුණ දෙන බවද සඳහන් වී ඇත. මෙම අධ්‍යයනය සිදු කිරීමේදී නාගරීකරණයට, අභ්‍යන්තරව සිදුවන ග්‍රාමීය නාගරික සංක්‍රමණ, ස්වාභාවික වර්ධනය වැනි සාධක පසුබිම් වී ඇත. මෙම අධ්‍යයනයේ දී, ප්‍රජා විද්‍යාත්මක, මුඩුක්කු පැල්පත් වාසීන්ගේ අඩු ආදායම් මට්ටම, නුපුහුණු ශ්‍රමිකයන්ගේ වර්ධනය, රැකියා විරහිත තරුණයන් බිහි වී තිබීම ,මිනිස් භූමි අනුපාතය පහළ වැටීම ආදී ජනතාවගේ විවිධ ප්‍රශ්නයන් ද හඳුනා ගත හැකි විය. මෙයට විධිමත් නාගරික පද්ධතියක අවශ්‍යතාවය පැහැදිලි ලෙස දක්නට ලැබුණ අතර නගර නිර්මාණය, ආර්ථික හා සමාජීය ගැටලු නිරාකරණය විධිමත්ව හා කඩිනම් පියවර ගැනීමෙන් කොළඹ නගරයේ ජීවන තත්ත්වය වඩා සුභදායී කරගත හැකි වේ.

**මුඛ්‍ය පද :** කොළඹ නගරය, නාගරීකරණය

[1] ආර්ථික විද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, savi26kanchana@gmail.com

[2] ආර්ථික විද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, chathu28subodhi@gmail.com

# සමාජ ජාල හා වර්තමාන පුද්ගල සම්බන්ධතා

**කේ. ඒ. ඩී. එල්. වයි. එම්. සේනාපාල**[1]

**සංක්ෂේපය**

තාක්ෂණයේ දියුණුවත් සමග සන්නිවේදනය යන්න ඉතාමත් සරල ක්‍රියාවක් බවට පත් වූයේ, ලොව දෙතැනක සිටින පුද්ගලයන් මුහුණට මුහුණ බලා සජීවී රූප රාමු දෙනෙතට ගෙන ඒමත් සමගයි. දුර සිටින පුද්ගලයන් සමීප කරමින් ළඟ සිටින පුද්ගලයන් දුරස් වන සමාජ විපර්යාසයන්, සදාචාරාත්මක හා සාරධර්ම පිළිබඳ ගැටලු සන්නිවේදන මාධ්‍යයේ අතුරු ඵලයන් ලෙස බිහිවෙමින් පවතී. එයින් සමාජ ජාල දියුණු වීමත් සමග පුද්ගල සබඳතා බිඳවැටීම වර්තමානයේ දැකිය හැකි ප්‍රධාන ගැටලුවකි. සමාජ ජාල භාවිතය හා එය පුද්ගල සම්බන්ධතා කෙරෙහි ඇති කරන බලපෑම අධ්‍යයන අරමුණු කරගනිමින් අන්තර්ජාලය හරහා සමාජ ජාල භාවිතා කරන්නන් 50 දෙනෙකු හට ප්‍රශ්නමාලාවක් ලබා දී තොරතුරු ලබා ගන්නා ලදී. පැය 2-6ත් අතර 72%ක් අන්තර්ජාලය භාවිතා කරන අතර පැය 10ක් භාවිතා කරන අය 16.3% කි. විනෝදාංශයක් ලෙස හා දැනුම සොයා ගැනීමට විශාල පිරිසක් අන්තර්ජාලය භාවිතා කරන අතර කාලය ගෙවා ගැනීමට හා පුද්ගලයන් මග හැරීමට 37% ක් වැනි විශාල පිරිසක් අන්තර්ජාලය භාවිතා කරයි. දෙමව්පියන් සමග අවමය පැය 1ක් ගත කරන පිරිස ඉතාමත් ඉහළ අගයක් ගන්නා අතර දෙමව්පියන්ට සාපේක්ෂව මිතුරන් සමග වැඩි වේලාවක් ගත කරයි. මානසික නිදහස හා පවුල් ගැටලු නිසා බොහෝ දෙනා දෙමව්පියන් මිතුරන්ගෙන් වෙන්ව සමාජ ජාලයන්හි කාලය ගත කිරීමට පුරුදු වී සිටින අතර 83.8% කට පමණක් එය සාර්ථක පිළිතුරක් වී තිබේ. 72% ක් සමාජ ජාල නිසා පුද්ගල සබඳතා බිඳී යන බව පිලිගන්නා අතර 74.4% ක් මෙය වෙනස් විය යුතු බව අවධාරණය කරයි. සමාජ ජාලයන්ට තම ගැටලු විසඳීමට ඉඩ ලබා නොදී ස්වයං පාලනය හා තම තමාගේ සීමා හඳුනා ගැනීම අත්‍යවශ්‍ය වන අතර ම ආකල්පමය වශයෙන් විශාල වෙනසක් සිදු විය යුතුය. පුද්ගල සම්බන්ධතාවයන්ගෙන් මිදී සමාජ ජාලයන්හි කාලය ගත කිරීමට තරුණ පරපුර උත්සාහ දරන අතර දරුවන් දෙමාපියන්ගෙන් දුරස් වීම මෙම පර්යේෂණය මගින් නිගමනය වේ.

**මුඛ්‍ය පද :** සමාජ ජාල, අන්තර්ජාලය, පුද්ගල සම්බන්ධතා

[1] ආර්ථික විද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, yashiyashoda94@gmail.com

# Service quality of canteens in University of Keleniya

**A. K. M. De Silva**[1]

.

## Abstract

Sometimes state universities are considered as inexact place for higher education due to the lack of enough facilities, language barriers, limited time etc. Out of those reasons the healthiness of foods and nutrition of the university students can be considered as one of the major reasons. It is potential matter to discover the perception of university students on this factor. The objective of this research is to identify the service quality of the canteens of University of Keleniya. The overall service quality is contain major three variables; cleanliness of the canteens, employee commitment and physical layout of the canteens. Service quality is depend on these three variables. The targeted sample was 30 and it was randomly selected from university students including all faculties and the method used for this research can be described as mix method which focuses on both quantitative and qualitative methods and data was gathered through questionnaires, interviews and observation. Data is in Likert scale type and descriptive statistics, linear regression have been used to analyze the data. Universities have to concentrate their efforts on improving quality of service in canteens and from this research it was conclude that among all three independent variables the cleanliness of canteens has the considerable influence on the service quality rather than other two variables. The cleanliness variable has divided into five sub variables and from those, the employee external appearance (Sig= 0.000) and well cleaned canteen materials (Sig= 0.010) has significant influence to the service quality of university canteens. So that among all three variables university management have to consider about cleanliness of the canteens and it is important to maintain a clean environment, and attractive staff in order to give a good service quality to university students.

**Keywords**: Canteen, University, Service quality, Regression, Likert

[1] Department of Economics, University of Kelaniya, kalpi.madu@gmail.com

# අර්ධ නාගරික ආර්ථිකය ඉහළ නැංවීම උදෙසා ගෙවතු වගාවේ දායකත්වය පිළිබඳ අධ්‍යයනය. (අත්තනගල්ල ප්‍රදේශය ඇසුරින්)

**එච්. කේ. ඒකනායක**[1]

**සංක්ෂේපය**

ස්වයංපෝෂිත ආර්ථික රටාවකට හුරුව තිබූ මෙරට ජනයා යටත්විජිත පාලන ක්‍රමයෙන් පසු නාගරික මධ්‍යම පාන්තික ජීවන රටාවකට හුරු විය. එහෙත් තවමත් අර්ධ නාගරික ජන ජීවිතය තුළ ද කෘෂිකර්මය ශේෂව පවතී. ඔවුහු තම දායාදයෙන් ලැබෙන කෘෂිකර්ම ජීවන රටාව තුළින් තම ආර්ථික රටාව පුළුල් කර ගැනීමට උත්සාහ දරති. වර්තමානය වනවිට ග්‍රාමීය ආර්ථිකය දිරි ගැන්වීම උදෙසා ගැමි දිරිය, සමෘද්ධි වැඩසටහන් ක්‍රියාත්මක වූවත් පවතින ආර්ථික රටාව හමුවේ එය එතරම් ප්‍රමාණවත් වේ යැයි සැලකිය නොහැක. මෙම පර්යේෂණයේ අරමුණ වන්නේ, අර්ධ නාගරික ආර්ථිකය ඉහළ නැංවීම උදෙසා ගෙවතු වගාවේ ඇතිවන දායකත්වය, ඇතිවන ආර්ථික බලපෑම අධ්‍යයනය කිරීමයි. මේ සඳහා යොදාගනු ලැබුවේ, ගම්පහ දිස්ත්‍රික්කයේ අත්තනගල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ 347/B කෝළවත්ත ග්‍රාමසේවා වසමේ තෝරාගත් පවුල් 100කි. මෙහිදී මෙම ග්‍රාමසේවා වසමේ 78% ක් විස්තෘත පවුල් වන අතර 22% ක් න්‍යෂ්ටික පවුල් විය. ඒ අතර ම පවුල් 68 ක් ස්ත්‍රී හා පුරුෂ දෙදෙනා ම රැකියාවක නිරතවේ. ගෘහණියන් එදිනෙදා ජීවිතයේ ගෙවතු වගාවේ නිරතව ඇත. තවද විනෝදාංශයක් ලෙස ද භූමිය පරිභෝජනය කිරීමේ අරමුණින් සුලු වශයෙන් නිරත වේ. ගෘහණියන් ආර්ථික ප්‍රතිලාභ උදෙසා පමණක් ම නොව නැවුම් ආහාර ද්‍රව්‍ය ලබා ගැනීමේ අරමුණින් ගෙවතු වගාවේ නිරත වේ. පවුලේ පරිභෝජනයෙන් පසු අතිරික්තයක් ඇත්නම් ඒවා විකිණීමට පෙළඹේ. එහෙත් අඩු ආදායම්ලාභී පවුල් සිය ආර්ථික මට්ටම ඉහළ නංවා ගැනීම උදෙසා ම ගෙවතු වගාවෙහි නිරතව ඒවා විකුණා ආදායම උපයා ගන්නා බව අනාවරණය විය. මෙහි දී මොවුහු මුහුණපාන ගැටලු ලෙස තවමත් සාම්ප්‍රදායික ක්‍රම යටතේ වගාවේ නිරත වීම, නව ක්‍රම පිළිබඳ අවබෝධයක් නොතිබීම, මොවුන්හට දිගුකාලීන වෙළඳපළක් නොතිබීම යනාදිය දැක්විය හැක.

**මුඛ්‍ය පද :** අර්ධ නාගරික ආර්ථිකය, ගෙවතු වගාව, කෘෂිකර්මය, අඩු ආදායම්ලාභී

[1] ආර්ථික විද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, 93816@gmail.com

# ශ්‍රී ලංකාවේ පෞද්ගලික රෝහල් කෙරෙහි ජනතාවගේ ඇති දැඩි රුචිකත්වය

**ඒ. ඒ. එම්. කේ. අමරසිංහ**[1]

**සංක්ෂේපය**

පුද්ගලයෙකුට යහපත් දිවිපෙවෙතක් ගත කිරීම සඳහා නිරෝගිමත් බව අත්‍යවශ්‍ය සාධකයක් බවට වර්තමානයේ පත්ව ඇත. පුද්ගලයෙකුගේ සෞඛ්‍යය සම්පන්න බව එරට අනාගතය තීරණය කිරීමෙහිලා වැදගත් සාධකයකි. එහිදී ජනතාව නීරෝගී වීම උදෙසා ප්‍රතිකාර හා උපදෙස් නිසි අයුරින් ලැබෙනවා ද යන්න පිළිබඳ ගැටලුවක් පැනනගී. මෙම අධ්‍යයනය තුළින් ශ්‍රී ලංකාවේ පෞද්ගලික රෝහල් කෙරෙහි ජනතාවගේ ඇති දැඩි රුචිකත්වය පිළිබඳ විමර්ශනය කර ඇත. මේ උදෙසා මාවනැල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ පිහිටි පෞද්ගලික රෝහලක් වන මෙඩි සෙවන සහ රජයේ රෝහල කරා ඇදී එන රෝගීන් 100 දෙනෙකුගෙන් යුත් නියැදියක් පහසු නියැදීම් ක්‍රමය යටතේ තෝරාගෙන ඇත. දත්ත ලබා ගැනීම සිදු කරනු ලැබුවේ, සම්මුඛ සාකච්ජා ක්‍රමය භාවිතයෙනි. මෙම අධ්‍යයනය තුළින් අනාවරණය වූයේ, එම ප්‍රදේශය තුළ පෞද්ගලික රෝහල් ආරම්භ වීමත් සමඟ විශාල රෝගීන් සංඛ්‍යාවක් ඒ කරා ඇදී ඒමත් , ඒ තුළින් පුද්ගලයන්ගේ සෞඛ්‍ය තත්ත්වය කෙරෙහි ගුණාත්මක තත්ත්වයෙන් යුතු ප්‍රතිකාර හා උපදෙස් , කාර්යක්ෂම මෙන්ම සුහදශීලී සේවාවක් ලැබී ඇති බවත් ය. කෙසේ වුවද, මෙම පෞද්ගලික රෝහල් නිසා රජයේ රෝහල් කරා පුද්ගලයන් ඇදී යාමේ ප්‍රවණතාවය අඩු වී ඇත. එයට හේතුව වී ඇත්තේ, රජයේ රෝහල් වල ඇති අකාර්යක්ෂම බව , අකාරුණික බව හා කාලය නිකරුණේ නාස්ති කිරීම යනාදී කරුණු බව හෙළි විය. මේ හේතුවෙන් බොහොමයක් පුද්ගලයින් පෞද්ගලික රෝහල් කරා ඇදී යාමේ දැඩි රුචිකත්වයක් ඇති බව නිගමනය කළ හැකිය.

**මුඛ්‍ය පද :** සෞඛ්‍යය, පෞද්ගලික රෝහල්, රජයේ රෝහල්, රෝගීන්

[1] ආර්ථික විද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, k.amarasinghe92@gmail.com

# ශ්‍රී ලංකාවේ සියදිවිනසා ගැනීම සඳහා බලපාන සාධක

**පී. එස්. මධුභාෂිණී**[1]

## සංක්ෂේපය

ඉංග්‍රීසි බසින් " Suicide " යන පදයට පර්යාස වශයෙන් සිංහල භාෂාවෙහි සියදිවි නසා ගැනීම ආත්ම ඝාතනය, ආත්ම ගුණය යනාදි වශයෙන් ව්‍යවහාරයත් රාශියක්ම සමාජ ගතව පවති. වර්තමානය වන විට දල වශයෙන් ලෝකයේ මිනිසුන් ලක්ෂ 8 - 10 ත් අතර සංඛ්‍යාවක් සියදිවි නසා ගැනීම නිසා ජීවිතය නැතිකර ගන්නා අතර එය 100,000 ට 11.4 ක් වේ. ශ්‍රී ලංකාවේ වාර්තා වන ප්‍රමාණය 2012 වර්ෂය වන විට 100,000 ට 28.8 පමණ වේ. මෙසේ සිය දිවි නසා ගැනීමේ ලෝක තත්ත්වය අනුව, ශ්‍රී ලංකාව සිව්වන ස්ථානයෙන් වාර්තා වේ. නමුත් ලංකාව තුල සියදිවි නසා ගන්නා සංඛ්‍යාව වසරින් වසරට අඩුවෙමින් පවතී. එනම්, 1995 වසරේදී 8500 ක් පමණ සියදිවි නසාගෙන තිබූ අතර එය 2014 වන විට 3140 දක්වාද පහළ බැස ඇත. මෙරට අඛණ්ඩව සැලකිය යුතු කාලයක් වැඩිම සියදිවි නසා ගැනීම් සංඛ්‍යාවක් වාර්තා වූ කුරුණෑගල දිස්ත්‍රික්කය ඇසුරින් සියදිවිනසා ගැනීම සඳහා බලපාන සාධක හඳුනා ගැනීම අධ්‍යයනයේ ප්‍රධානතම අරමුණ විය. අධ්‍යයනය සඳහා ප්‍රධාන වශයෙන්ම භාවිත ක්‍රමවේදය වූයේ, ප්‍රත්‍යක්ෂ අධ්‍යයන ක්‍රමයයි. 2014 වසරේ කුරුණෑගල දිස්ත්‍රික්කය තුළ සියදිවිනසා ගත් පුද්ගලයින් 362 දෙනාගේ පවුල් අතරින් අහඹු ලෙස තෝරා ගත් පවුල් 20 ක් අධ්‍යයනයේ නියැදිය විය. මෙම පවුල් 20 ඇසුරින් සිද්ධි අධ්‍යයනය කරන ලදී. ව්‍යුහාත්මක හා ව්‍යුහාත්මක නොවන සම්මුඛ සාකච්ජා මාර්ගයෙන් ප්‍රාථමික දත්ත ලබා ගන්නා ලදී. අධ්‍යයනයේ ප්‍රධාන නිගමනයන් ලෙස, ශ්‍රී ලංකාවේ කාන්තාවන්ට සාපේක්ෂව පුරුෂයින් අතර සියදිවි නසා ගැනීමේ අනුපාතය ඉහළ බවත්, සියදිවිනසා ගැනීමට බලපානු ලබන ප්‍රධානතම සාධකය බවට පවුල් ආරවුල් බවට පත්ව තිබීමත්, සියදිවිනසා ගැනීමට භාවිතා කරන උපක්‍රමයක් ලෙස බහුල වශයෙන්ම වස පානය කිරීමත් දැක්විය හැකිය.

**මුඛ්‍ය පද :** සියදිවිනසා ගැනීම, වස පානය, පවුල් ආරවුල්

---

[1] ආර්ථිකවිද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, madhupalliyaguru@gmail.com

# මිනිසුන් පළමු වතාවට මත්ද්‍රව්‍යයට යොමුවීම කෙරෙහි බලපාන හේතු සාධකයන් විමසා බැලීම පිළිබඳ අධ්‍යයනයක් (නවදිගන්තය ප්‍රතිකාර හා පුනරුත්තාපන මධ්‍යස්ථානය ඇසුරින්)

**එම්. කේ. එන්. එස්. ලියනගේ**[1]

**සංක්ෂේපය**

වර්තමානයේ බහුල වශයෙන් සාකච්ඡාවට ලක්වන සමාජ පිළිලයක් ලෙසින් මත්ද්‍රව්‍ය හඳුනාගත හැකි ය. එනම් ඒවා එන්නත් කරගැනීම, පෙති වර්ග ලෙස භාවිතයට ගැනීම වැනි තත්ත්වයන් දක්වා අයහපත් අන්දමින් වර්ධනය වී තිබේ. ඒ නිසා සමාජයේ බොහෝ දෙනා මත්ද්‍රව්‍යයට ඇබ්බැහි වීම සුලබ කරුණක් වී තිබේ. මත්ද්‍රව්‍යයට ඇබ්බැහි වූ පුද්ගලයන් පුනරුත්තාපනය සඳහා අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයට අනුබද්ධ ප්‍රතිකාර හා පුනරුත්තාපන මධ්‍යස්ථානවලට පුද්ගල කැමැත්ත හා උසාවි නියෝග පදනම් කරගනිමින් යොමු කෙරේ. මිනිසුන් පළමු වරට මත්ද්‍රව්‍ය කෙරෙහි යොමුවීම සඳහා බලපෑ හේතු සාධක විමසා බැලීම මෙහි අධ්‍යයන පරමාර්ථය වේ. ඒ සඳහා නියැදිය වශයෙන් නවදිගන්තය ප්‍රතිකාර හා පුනරුත්තාපන මධ්‍යස්ථානයේ නේවාසික ව ප්‍රතිකාර ලබන සේවාලාභීන් 30 දෙනෙකු සසම්භාවී ලෙස තෝරාගැනුණු අතර මෙම අධ්‍යයනය සඳහා අවශ්‍ය ප්‍රාථමික දත්තයන් ප්‍රධාන වශයෙන් සම්මුඛ සාකච්ඡා පැවැත්වීම හරහා ද එමෙන් ම ප්‍රශ්නාවලි මඟින් ද ,ද්වීතියීක දත්තයන් අන්තර්ජාලය භාවිතයෙන් රැස්කිරීම සිදුවිය. එම දත්තයන් ප්‍රමාණාත්මක ව හා ගුණාත්මක ව විශ්ලේෂණය කිරීමෙන් අනතුරු ව මත්ද්‍රව්‍යයට ඇබ්බැහි වූ පුද්ගලයන් පළමු වරට මත්ද්‍රව්‍යයට යොමුවීම කෙරෙහි බලපෑ හේතු සාධක අනාවරණය කරගන්නා ලදි. ඒ අනුව සේවාලාභීන්ගෙන් 47%කගේ මතයට අනුව ඔවුන් මත්ද්‍රව්‍යයට මුල්වතාවේ යොමුවීමට බලපෑ හේතු සාධකය වන්නේ මිතුරු ඇසුරයි. 23%ක් වූ සේවාලාභීන් පිරිසකගේ අදහස වූයේ මත්ද්‍රව්‍ය සඳහා වූ කුතුහලය නිසා ඔවුන් ඊට පෙළඹුණු බවයි. එපමණක් නොව මත්ද්‍රව්‍ය සඳහා පවතින දැඩි කැමැත්ත, විනෝදය නිසා මුල් භාවිතයට යොමු වූ බව 17%ක සේවාලාභීන් පිරිසකගේ මතය වූ අතර, සේවාලාභීන් 13%ක ප්‍රමාණයක් පවසා සිටියේ වේදනාව නැතිකර ගැනීමට තමන් මත්ද්‍රව්‍ය මුල්වරට භාවිතා කළ බවයි.මේ අනුව මිනිසුන් වැඩි ප්‍රමාණයක් පළමුවර මත්ද්‍රව්‍යයට යොමු වන්නේ මිතුරු ඇසුර නිසා බැව් පැහැදිලි ය. ඒ අනුව පුද්ගලයින් පළමුවරට මත්ද්‍රව්‍යයට යොමුවීම නතර කිරීම තුළ ඊට වන ඇබ්බැහි වීම ද දුරු කළ හැක. කුඩා කල සිට ම දරුවන්ගේ මිත්‍ර සබඳතා යහපත් ලෙස පවත්වා ගැනිමට දෙමාපියන්ට ද වගකීමක් පවතී. අනෙක් අතට ඒ සඳහා පුද්ගලානුබද්ධ මෙන් ම ජාතික හා සමාජීය වශයෙන් සිදුවිය යුතු කාර්යභාරය ද සුවිශාල ය.

**මුඛ්‍ය පද :** මත්ද්‍රව්‍ය, සේවාලාභීන්, ඇබ්බැහි වීම

[1] දර්ශන අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, nadeesha640@ gmail.com

# Impact of Training and development Programmes on performance of Employee in Privet Sector.

**R. S. S. Kamalawarna**[1]

## Abstract

This report follows the study about Impact of Training and development Programmes on performance of Employee in Privet Sector**.** Training is a very important aspect present days in making the organization high profitable. There are various factors of the employee develop under the training and development known as Employee satisfaction, Quality of the employees, Relationship between employer and employee as well as relationship among employees and motivation of the employee. Each factor contributes to overall employee performance. This study concludes that programmes of the training and development of an organization contribute greatly to employee's performance. In line with the focus, Data collected through the interview method from John Keells Holdings in Sri Lanka. It is a largest listed conglomerate company in the Colombo Stock Exchange. Executives, Non-executives, senior managers, Managers, Supervisors selected as samples form the company. As the primary data indicates, there is positive relationship between the training and development programs and employee's performance. The result of the study shows that training and development programs have positive impact on performance of employees in privet sector. It is conclude that john Keells holdings having good training and development programs for employees. Most of the employees were of the view that training and development were effective tools for both Individual and organizational success. The findings revealed that training practices, methods and activities at John Keells holdings are in line with the best practices regarding the planned and systematic nature of the training process as is generally known. It can enhance the performance of employees through the factors that I mentioned early.

**Keywords:** Training and development programs, Employee's performance, Privet sector, Motivation, Quality

[1] Department of Economics, University of Kelaniya, ranasinghessk@gmail.com

# විශ්වවිද්‍යාල සිසුන් ඉංග්‍රීසි පාඨමාලා සඳහා යොමු වීමේ ප්‍රවණතාවය (කැලණිය විශ්වවිද්‍යාලයේ සමාජීය විද්‍යා පීඨය ඇසුරින්)

**ජී. ඒ. එස්. මධුවන්ති**[1]

## සංක්ෂේපය

වර්තමාන අධ්‍යාපන ක්‍රමය තුළ ඉංග්‍රීසි භාෂාව සඳහා හිමිවන්නේ වැදගත් ස්ථානයකි. විශ්වවිද්‍යාල අධ්‍යාපනය ලබන සිසුන් සඳහා එම විශ්වවිද්‍යාල මගින් ඉංග්‍රීසි දැනුම වර්ධනය කිරීම සඳහා විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කර ඇත. ඒ අතරින් ඉංග්‍රීසි භාෂා පාඨමාලා පැවැත්වීම, ඉංග්‍රීසි මාධ්‍යයෙන් යම් විෂය ඒකකයන් ඉගැන්වීම ආදිය මඟින් සිසුන්ගේ ඉංග්‍රීසි භාෂාව ඉහළ නැංවීමට කටයුතු සූදානම් කර ඇත. විශ්වවිද්‍යාල අධ්‍යාපනය ලබන සිසුන් ඉංග්‍රීසි පාඨමාලාවලට සහභාගි වීමේ ප්‍රවණතාවය පිළිබඳ සෙවීම මෙම අධ්‍යයනයේ අරමුණ වේ. මෙම අධ්‍යයන සඳහා ප්‍රධාන වශයෙන් ප්‍රාථමික දත්ත යොදාගත් අතර, කැලණිය විශ්වවිද්‍යාලයේ සමාජීය විද්‍යාපීඨයේ අධ්‍යයන වර්ෂ 4 නියෝජනය වන පරිදි සිසුන් 100 කින් යුත් සසම්භාවී නියැදියක් යොදා ගන්නා ලදී. අධ්‍යයන සඳහා ප්‍රශ්නාවලියක් මාර්ගයෙන් දත්ත රැස් කරගත් අතර, මීට අමතරව ද්විතීයික මූලාශ්‍ර ලෙස සඟරා, අන්තර්ජාලය ඇසුරින් දත්ත ලබාගන්නා ලදී. දත්ත ඉදිරිපත් කිරීම වගු, ප්‍රස්තාර ආදිය මගින් සිදු කළ අතර, දත්ත විශ්ලේෂණය සඳහා සංඛ්‍යාත්මක විශ්ලේෂණ ක්‍රම භාවිත කරන ලදී. විශේෂයෙන්ම කැලණිය විශ්වවිද්‍යාලයේ සමාජීය විද්‍යා පීඨයේ සිසුන්ගෙන් 43% ක්ම මෙම ඉංග්‍රීසි පාඨමාලා සඳහා යොමුවන අතර, 57% ක් ඉංග්‍රීසි පාඨමාලා සඳහා යොමු නොවීමේ ප්‍රවණතාවයක් දක්නට ලැබේ. එයින් ප්‍රථම වසර සිසුන්ගෙන් 72% ක් ද, දෙවන වසර සිසුන්ගෙන් 48% ක්ද, තෙවන වසර සිසුන්ගෙන් 32% ක්ද, සිව්වන වසර සිසුන්ගෙන් 20 % ක්ද ඉංග්‍රීසි පාඨමාලා සඳහා සහභාගි වීම දක්නට ලැබේ. මෙසේ ඉංග්‍රීසි පාඨමාලාවලට සහභාගි වීම අඩු ප්‍රතිශතයක් පැවතීමට හේතු ලෙස ඉංග්‍රීසි පාඨමාලා සඳහා කාලය වෙන් කරගත නොහැකි වීම, අධ්‍යයන කටයුතු සමඟ වෙනත් පාඨමාලා හැදෑරීමට ඉඩකඩක් නොමැතිකම, විශ්වවිද්‍යාල අධ්‍යාපනයට පෙර ඉංග්‍රීසි පාඨමාලා හදාරා තිබීම, ඉංග්‍රීසි පාඨමාලා හැදෑරීම නොසලකා හැරීම ආදි කරුණු දැක්විය හැකිය. මෙම අධ්‍යයනයෙන් නිගමනය කළ හැක්කේ, විශ්වවිද්‍යාලය තුළ අධ්‍යාපනය ලබන සිසුන් එම විශ්වවිද්‍යාල මඟින් පවත්වනු ලබන ඉංග්‍රීසි පාඨමාලා සඳහා යොමු වීමේ ප්‍රවණතාවය අඩු බවයි. විශේෂයෙන්ම යම් විෂය මාලාවන් ඉංග්‍රීසි මාධ්‍යයෙන් පැවැත්වීම හේතු කොටගෙන ඉංග්‍රීසි භාෂා පාඨමාලා අනිවාර්ය කළ යුතු බව මේ සඳහා යෝජනා කළ හැකි අතර, එමඟින් විශ්වවිද්‍යාල සිසුන් තුළ ඉංග්‍රීසි දැනුම වර්ධනය වීම ද අපේක්ෂා කළ හැකිය.

**මුඛ්‍ය පද :** විශ්වවිද්‍යාල සිසුන්, ඉංග්‍රීසි භාෂාව, ඉංග්‍රීසි පාඨමාලා

[1] ආර්ථිකවිද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, sachithra731@gmail.com

# ග්‍රාම සංවර්ධනය කෙරෙහි සමෘද්ධි ව්‍යාපාරයෙහි දායකත්වය

**එච්. එම්. එන්. දිල්හානි හේරත්**[1]

**සංක්ෂේපය**

ජාතික සංවර්ධන ධාරාව පෝෂණය කරන කේන්ද්‍රීය සාධකය වන්නේ, ග්‍රාම සංවර්ධනයයි. නිදහසින් පසු බලයට පත් සෑම රජයක්ම ආර්ථික සැලසුම්කරණයේ දී ග්‍රාමීය ආර්ථික සංවර්ධනය සඳහා විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කර ඇත. 1970 දශකය දක්වාම ග්‍රාමීය දරිද්‍රතාවය අවම කිරීම සඳහා භාවිත කළ වචනය වූයේ, ග්‍රාම සංවර්ධනය යන්නයි. නමුත් 1970 දශකයෙන් පසුව ඇති වූ සමාජ, ආර්ථික වෙනස්කම් නිසා ග්‍රාම සංවර්ධනය වෙනුවට දුප්පත්කම අවම කිරීම යන ලේබලය යටතේ ගම සංවර්ධනය කරන ලදී. 1994 වර්ෂයේ බලයට පත් රජය දරිද්‍රතාව තුරන් කිරීම සහ දුප්පත් ජනතාව සවිබල ගැන්වීම සඳහා ආරම්භ කරන ලද වැදගත් ව්‍යාපෘතියක් වූයේ, සමෘද්ධි ව්‍යාපාරයයි. මුල්කාලීන ව අධිකාරියක් යටතේ පැවති සමෘද්ධි වැඩසටහන 2014 වන විට දෙපාර්තමේන්තුවක් යටතට පත් කළ අතර වර්තමානයේ එය දිවිනැගුම වැඩසටහන ලෙස ක්‍රියාත්මක වෙමින් පවතී. මෙම අධ්‍යයනය තුළින් බලාපොරොත්තු වන්නේ, ග්‍රාම සංවර්ධනයේ දී සමෘද්ධි වැඩසටහනේ දායකත්වය පිළිබඳ සොයා බැලීම සහ දිවිනැගුම වැඩසටහන යටතේ යෝජිත වැඩසටහන්වල ක්‍රියාත්මකභාවය තුළ ඇති වූ ගැටලු හඳුනාගැනීමත් ,එම වැඩසටහන් කෙරෙහි සමෘද්ධි ප්‍රතිලාභීන්ගේ සහභාගීත්වය කෙබඳු මට්ටමක පවතීද යන්න සොයා බැලීමත්ය. මෙම අධ්‍යයනයේදී ක්ෂේත්‍ර අධ්‍යයනය සඳහා සමෘද්ධි ප්‍රතිපත්තිය පුළුල් ලෙස ව්‍යාප්ත වන කුරුණෑගල දිස්ත්‍රික්කය තෝරාගෙන ඇති අතර නියැදිය සඳහා තෝරාගත් ගත් ග්‍රාමසේවා වසම් 05ක සමෘද්ධි ප්‍රතිලාභීන් අතුරින් අහඹු ලෙස තෝරාගත් පවුල් 60 ක් තෝරා ගෙන තිබේ. දත්ත රැස්කිරීමේදී ප්‍රාථමික දත්ත රැස්කිරීමේ ක්‍රමයන් වන ප්‍රශ්නාවලි ක්‍රමය, සම්මුඛ සාකච්ඡා ක්‍රමය හා නිරීක්ෂණ ක්‍රමය යොදා ගන්නා අතර ද්විතියික දත්ත රැස්කිරීම සඳහා සමෘද්ධි ව්‍යාපාරය සම්බන්ධ ලිපි, වාර්තා, මහ බැංකු වාර්තා, වාර්ෂික වාර්තා ආදිය යොදාගනී. පර්යේෂණයේ ප්‍රමාණාත්මක දත්ත සරල සංඛ්‍යානමය විධික්‍රම ඔස්සේද, ගුණාත්මක දත්ත විස්තරාත්මක ක්‍රමවේදය ඔස්සේ ද විශ්ලේෂණය කරයි. වැඩසටහන් සැලසුම් කිරීමේදී බිම් මට්ටමේ අදහස් නොවිමසීම, මෙම වැඩසටහන් තුළින් දේශපාලන අභිලාශයන් ඉටුකර ගැනීමට කටයුතු කිරීම ,ප්‍රතිලාභි ප්‍රජාව යැපීම් මානසිකත්වයකින් කටයුතු කිරීම, සමාජ සජීවීකරණය තුළ පවතින ගැටලු නිසා එම වැඩසටහන් තුළින් අපේක්ෂා කළ අරමුණු ඒ ආකාරයෙන්ම ග්‍රාමීය මට්ටම තුළදී ඉටුකර ගැනීමට නොහැකි වී ඇතිබව පැහැදිලි වේ. එම නිසා ග්‍රාමීය ජනතාව යැපීම් මානසිකත්වයෙන් මිදී සංවර්ධනයේ කොටස්කරුවන් බවට පත් කර ගත හැකි ක්‍රමවේදයක් සැලසුම් කළ යුතුය.

**මුඛ්‍ය පද :** සංවර්ධනය, සුභසාධනය, දරිද්‍රතාවය, ග්‍රාමීය ආර්ථිකය

[1] ආර්ථික විද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, hmdilhaniherath@gmail.com

# ශ්‍රී ලංකාවේ පරිගණක සාක්ෂරතාව සහ එහි ප්‍රවණතා

**එල්. ජී. ඩී. පෙරේරා**[1]

**සංක්ෂේපය**

නින්දට යන වේලාවේදීත්, සයනයේ අත පෙවිය හැකි දුරකින් ම ජංගම දුරකථනය තබාගෙන නින්දට යාමට තරම් සාමාන්‍ය ජන ජීවිතය තුළට විද්‍යුත් හා ඉලෙක්ට්‍රොනික මාධ්‍යයන් මෙම යුගයේ මුල් බැසගෙන තිබෙන අතර අද වනවිට රැකියා, කලා, විනෝදාංශ, ක්‍රීඩා සහ අධ්‍යාපනය වැනි බොහොමයක් ක්ෂේත්‍රයන් සඳහා පරිගණකය නැතිවම බැරි මෙවලමක් බවට පත් වී හමාරය. ශ්‍රී ලංකාව වැනි දියුණු වෙමින් පවත්නා රටක පරිගණක සාක්ෂරතාව සහ එහි ප්‍රවණතා පිළිබඳව විමසා බැලීම මෙම අධ්‍යයනයේ අරමුණ වේ. පරිගණක සාක්ෂරතාවය හා පරිගණක දැනුම ගැන සැලකීමේදී පාසැල් සිසුන්ගේ පරිගණක අධ්‍යාපනය, උසස් අධ්‍යාපනයේදී, රැකියා කටයුතු සඳහා මෙන්ම වැඩිහිටි අධ්‍යාපනය තුළ පරිගණක භාවිතය වැනි ක්ෂේත්‍ර සමුදායක් සැලකිය යුතුය. මෙම අධ්‍යයනය සඳහා ද්විතියික දත්ත භාවිතා කළ අතර ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව මගින් දත්ත ලබාගන්නා ලදී. එමෙන්ම ප්‍රමාණාත්මක දත්ත විශ්ලේෂණ ක්‍රම දත්ත විශ්ලේෂණ සඳහා භාවිතා කරන ලදී. දත්ත විශ්ලේෂණය මඟින් අනාවරණය කරගත් කරුණු අතර, 2010 වන විට ශ්‍රී ලංකාවේ පරිගණක සාක්ෂරතාවය 20% ක පමණ පහළ අගයක් ගත්ත ද වර්තමාන ශ්‍රී ලංකාවේ සාක්ෂරතාවය 26.8% ක් වේ. සංඛ්‍යාත්මකව මෙසේ දැක්විය හැකි වෙතත් ප්‍රායෝගික මට්ටමින් සලකා බැලීමේදී පරිගණක භාවිතය මෙන්ම පරිගණක අධ්‍යාපනය ද නාගරික ප්‍රදේශ වලටම සීමා වී ඇති ආකාරයක් මනාව නිරීක්ෂණය කළ හැකි නමුත් අනාගතයේදී දිනෙන් දින ඉහළ යන පරිගණක සාක්ෂරතාවය පිළිබඳ සැලකීමේදී නගරයේ සේම ගමටද පරිගණක දැනුම ව්‍යාප්ත වෙමින් මීටත් වඩා ඉහළ පරිගණක සාක්ෂරතාවයක් ගනු ඇතැයි පෙනේ.

**මුඛ්‍ය පද :** පරිගණක, සාක්ෂරතාව, තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය

[1] ආර්ථික විද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, gdinusha.perera@gmail.com

# Problems Associate with the Vegetable Trading To the Economic Centers
# (Special reference with Economic center in Dambulla)

**U. R. G. D. A. K. Moragolla[1]**

## Abstract

Agricultural sector plays a predominant role in national GDP and economic growth. It contributes 7.9% to the GDP and generates 28.2% of employment opportunities. Majority of people in developing countries, live in rural areas and depend on rural activities as their main occupation. Agriculture is their main source of economic support. Agricultural sector can be considered as one of the most difficult industries, frequently leading to some form of market failures. Further, success of green revolution increased problems of storing, transporting, packaging, trading and other institutional and economical problems. The objective of this study is to identify the main problems that associate with vegetable trading to economic centre in Dambulla. Purposive sampling method was used to select the sample and the sample size was hundred farmers. Questionnaire method was used to collect primary data. Quantitative and qualitative data analysing model was used to analyse the data. The study was derived some results. Farmers in rural areas face many problems in trading vegetables to economic centres such as price fluctuations, middlemen exploitation, storing problems, transporting problems, packing difficulties and incomplete knowledge of farmers about the market. In conclusion, farmers in rural areas face many problems in trading vegetables to economic centre. Therefore, regular trading process is a current necessity. Hence, government and non-governmental organizations must take urgent steps. Because protecting Sri Lankan historical agriculture is an important step for sustainable development.

**Keywords :** Agriculture, Vegetable, Trading, Economic Center

[1] Department of Economics, University of Kelaniya, dilini.moragolla@gmail.com

# තේ කර්මාන්තයේ වත්මන් ප්‍රවණතා හඳුනා ගැනීම.

කේ. පී. එල්. මධුභාෂිණී.[1]

**සංක්ෂේපය**

ශ්‍රී ලංකාවේ තේ වල රසය හා සුවඳ සඳහා ලෝකයේ දක්නට ලැබෙන්නේ, ඉතා ඉහළ පිළිගැනීමකි. ශතවර්ෂයකට අධික කාලයක සිට තේ කර්මාන්තය රැකියා, අපනයන ආදායම, රජයේ ආදායම් සම්බන්ධයෙන් විශාලතම සැපයුම්කරු බවට පත් ව තිබේ. කෙසේ වෙතත් කෙන්යාව වැනි නැගී එන නිෂ්පාදකයන් නිසා වෙනත් රටවලට සිය තත්ත්වය පවත්වා ගැනීමේදී දුෂ්කරතා වලට මුහුණ දීමට සිදු වී තිබේ. තේ වගා කිරීම තුළින් ඉහළ ආදායමක් ලබා ගත හැකි වීමත්, එය නිදහස් රැකියා මාර්ගයක් වීමත් , සමාජීය ලෙස ඉහළ පිළිගැනීමක් තිබීමත් වැනි සාධක සමඟ සලකා බලන විට කාර්මික අංශ වල තරම් ඉහළ වර්ධන වේගයකින් මෙම අංශය වර්ධනය නොවීම ගැටලු සහගත වේ. මෙම අධ්‍යයනය සඳහා ද්විතීක දත්ත ද භාවිත කර ඇත. මෙම අධ්‍යයනය තුළින්, තේ වගාවේ ඓතිහාසික පසුබිම හා එහි වැදගත්කම, ශ්‍රී ලංකාවේ තේ නිෂ්පාදනය, ශ්‍රී ලංකාවේ තේ අපනයනය, ශ්‍රී ලංකාවේ තේ මිල හා ද්විතික දත්ත භාවිතයෙන් ඒවායේ වෙනස් වීම් සම්බන්ධව විශ්ලේෂණයක් ද සිදු කොට තිබේ. තේ නිෂ්පාදන ප්‍රමාණය වසරෙන් වසර ඉහළ ගිය බවක් පෙන්නුම් කරන ලද අතර නිෂ්පාදන පිරිවැය ද ක්‍රමක්‍රමයෙන් ඉහළ යන බවක් පෙන්නුම් කරයි. 2005 වර්ෂය වනවිට නිෂ්පාදන පිරිවැය 149.13 ක් වුවද එය 2013 වන විට 422.67 දක්වා සීඝ්‍ර ලෙස වර්ධනය වී තිබේ. එමෙන්ම වගා කරන ලද භූමි ප්‍රමාණයද 2013 වන විට අඩු වීමක් දැක ගත හැකිය. තවද දත්ත විශ්ලේෂණය මඟින් පැහැදිලි වන්නේ, තේ කිලෝවක් සඳහා ගොවියෙක් සඳහා ලැබෙන මුදලට වඩා වැඩි මුදලක් තේ කිලෝවක් නිෂ්පාදනය කිරීම සඳහා වැයවන බවයි. එමෙන්ම තේ නිෂ්පාදනය සඳහා ගෙවන මිල විශාල ලෙස වැඩි වීමක් පෙන්නුම් කළ ද එයට සාපේක්ෂව තේ නිෂ්පාදනය එතරම් වර්ධනයක් පෙන්නුම් නොකරයි.

**මුඛ්‍ය පද :** තේ නිෂ්පාදනය, අපනයනය, මිල

[1] ආර්ථිකවිද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, kplmadhubhashini@gmail.com

# ශ්‍රී ලංකාවේ පවතින 5 ශ්‍රේණිය ශිෂ්‍යත්ව විභාගයට පවතින දෙමාපිය බලපෑමේ ඵලදායිතාවය (බස්නාහිර පළාතේ දිස්ත්‍රික්ක 3ක් ඇසුරින්)

**බී. එම්. එන්. එම්. තිලකරත්න**[1]

## සංක්ෂේපය

වර්තමානයේ ශ්‍රී ලංකාවේ පාසල් අධ්‍යාපනය තුළ පවතින විභාග ක්‍රමයේ පළමුවන කඩඉම ලෙස ශිෂ්‍යත්ව විභාගය හඳුන්වා දිය හැකිය. රජය මගින් මෙම විභාගය පැවැත්වීමේ ප්‍රධාන අරමුණක් වශයෙන් අඩු ආදායම්ලාභී පවුලවල ළමුන්ට ශිෂ්‍යාධාර අරමුදල් ලබාදීම හා ළමුන්ගෙන් අධ්‍යාපනය ඉහළ නැංවීම සඳහා වැඩි පහසුකම් සහිත පාසල්වලට ළමුන් යොමු කිරිම දැක්විය හැකිය. නමුත් වර්තමානය වන විට ශිෂ්‍යත්ව විභාගය සම්බන්ධයෙන් දෙමාපියන්ගේ ප්‍රධාන අරමුණ වනුයේ, තම දරුවා ජනප්‍රිය පාසලකට ඇතුළත් කර ගැනිම ය. එම නිසා දෙමාපියන් අතර ශිෂ්‍යත්ව විභාගය කෙරේ දැඩි තරඟකාරික්වයක් පවති. මෙම තරඟකාරිත්වයේ සැබෑ ඵලදායිතාවයක් තිබේද යන්න අධ්‍යනය කිරිම අරමුණු කරගෙන මෙම පර්යේෂණය සිදු කරන ලදි. එහිදී බස්නාහිර පළාතේ දිස්ත්‍රික්ක 3 නියෝජනය වන පරිදි අහඹු ලෙස තෝරාගත් සිසුන් 150ක නියැදියට ප්‍රශ්නාවලි ක්‍රමයක් සම්මුඛ සාකච්ඡා ක්‍රමය මඟින් ප්‍රශ්න යොමු කරන ලදී . එහිදි බහුතරයක් සිසුන්ට මෙම විභාගය මානසික පීඩාවක් බවට පත්වී ඇති බව අනාවරණය විය. තවද දෙමාපිය බලපෑම මත මිස ශිෂ්‍යත්ව විභාගය ඉහළින් සමත් වීමේ හෝ වෙනත් පාසලකට යොමුවීමට සිසුන්ගේ දැඩි අරමුණක් නොමැති බව තහවුරු විය. තවද ප්‍රතිඵල අරමුණු කරගෙන දෙමාපියන් දරුවන් පන්ති බොහෝමයකට යොමු කළත් එයින් ප්‍රතිඵලයක් ඇති නොවන බව දරුවන්ගේ අදහස් වලින් ප්‍රත්‍යක්ෂ විය. ඔවුන් පවසන පරිදි අමතර පන්ති කිහිපයකට සහභාගී වීම නිසා නිවැරදි දේ හඳුනා ගැනීමට ඔවුන්ට නොහැකි වන බවයි. තවද විශේෂයෙන් පෙනීගිය කරුණක් වනුයේ, සමස්ත නියැදියෙන් 90% කට පමණ දෙමාපිය බලපෑම දැඩිව පැවතියද මෙම ශිෂ්‍යත්ව විභාගය සමත්ව තිබුනේ 24% පමණ ප්‍රමාණයකි. එහෙත් බහුතරයක් ශිෂ්‍යයින් ලකුණු 100 කඩඉම ඉක්මවා යහපත් ප්‍රතිඵල ලබාගෙන තිබුණි. එයින් යම්තාක් දුරට දෙමාපියන්ගේ උත්සහය සාර්ථක වී ඇති බවක් පෙන්නුම් කළ ද දරුවන්ගේ පැත්තෙන් ඔවුන්ට ඉතා පීඩනයක් වී ඇති බව පැහැදිලි විය. පර්යේෂණය යෝජනා අතර රජය විසින් සියලුම පාසල්වලට සමාන පහසුකම් ලබා දීමට කටයුතු කරන්නේ නම්, ශිෂ්‍යත්ව විභාගය පිළිබඳ දෙමාපියන්ගේ දැඩි තරඟකාරිත්වය තරමක් දුරට මැඩ පවත්වා ගැනීමට හැකියාව ලැබෙනු ඇත. එමෙන්ම ශිෂ්‍යත්ව විභාගය අධ්‍යාපනයේ එකම සංධිස්ථානය නොවන බව දෙමාපියන්ට අවබෝධ කරවීම ද යෝජනා විය.

**මුඛ්‍ය පද :** ශිෂ්‍යත්ව විභාගය, දෙමාපිය බලපෑම, තරඟකාරිත්වය

[1] ආර්ථික විද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, medhya8@gmail.com

# මාර්ග අනතුරු සිදුවීම කෙරෙහි මානව සාධක හඳුනා ගැනීම.

**ඩී. එච්. සසිකා මධුවන්ති**[1]

**සංක්ෂේපය**

පෞද්ගලික රථ වාහන පාරිභෝජනය අධික වීම, මාර්ග සංවර්ධනය වීම හා සමගාමීව සමස්ථයක් ලෙස පෙර වර්ෂවලට සාපේක්ෂව 2015 වර්ෂයේ ශ්‍රී ලංකාව තුළ මාර්ග අනතුරු සිදුවීමේ ප්‍රවණතාවය සීඝ්‍ර ලෙස වර්ධනය වීමක් දක්නට ලැබේ. ශ්‍රී ලංකාව තුළ මාර්ග අනතුරු වළක්වා ගැනීම කෙරෙහි බලපාන මානව සාධක හඳුනා ගැනීම මෙම අධ්‍යනයේ ප්‍රධාන අරමුණ වේ. අධ්‍යයනය සඳහා ද්විතියික දත්ත මූලාශ්‍රයන් මඟින් දත්ත රැස් කරන ලදී. ජාතික ගමනාගමන කොමිෂන් සභාව, ශ්‍රී ලංකා පොලිසිය, ජන ලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව මඟින් නිකුත් කරන දත්ත මේ සඳහා භාවිතා කර ඇත . විස්තරාත්මක සංඛ්‍යාන විශ්ලේෂණ ක්‍රම මඟින් දත්ත විශ්ලේෂණය කරන ලදි. අධ්‍යයනය අනුව, බහුතරයක් එනම් ප්‍රතිශතයක් ලෙස 92 මාර්ග අනතුරු සිදුවීම කෙරෙහි මානව සාධකවල බලපෑමක් පවතින බව අනාවරණය විය. මෙම අනතරුවලින් වලින් විශාල ප්‍රමාණයක් රියදුරන් නොසැලකිලිමත් ලෙස යතුරු පැදි ධාවනය කිරීමෙන් සිදු වූ අනතුරු වේ. මෙහිදී පුද්ගල මරණ 814 ක් වාර්තා වී ඇති අතර මෙම අනතුරු සිදු වූ ස්ථාන වල ගමන් කරමින් සිටි පදිකයින් 777 දෙනෙක්ද මරණයට පත් වී ඇත . එමෙන්ම 2015 වසරෙ වැඩි ම අනතරු සංඛ්‍යාවක් බස්නාහිර පළාත තුළ සිදු වී ඇති බව අනාවරණය විය. මෙහිදී පුද්ගල මරණ 750 ක් සිදු වී ඇත . මෙම අධ්‍යයනයට අනුව රියදුරන් රිය පැදවීමේදී මාර්ග සංඥා නීති රීතිවලට අවනත වීම, අධික වේගයෙන් රිය පැදවීම පාලනය කරගැනීම, දැඩි අවධානයකින් හා සංයමයකින් රිය ධාවනය කිරීම, රිය ධාවනය කිරීමට පෙර මනා පුහුණුවක් ලබා තිබීම මඟින් රිය අනතුරු වළක්වා ගැනීමට හැකියාවක් පවතින බැව් මෙම අධ්‍යයනය මඟින් තහවුරු විය.

**මුඛ්‍ය පද :** මාර්ග අනතුරු, රථ වාහන, රිය ධාවනය, මානව සාධක, රියදුරන්

[1] ආර්ථික විද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, shachimadhuwanthi@gmail.com

# උඩරට අර්තාපල් ගොවියා මුහුණ දෙන ගැටලු (වැලිමඩ උඩුහාවර ග්‍රාමය ඇසුරෙන්)

ඩබ්. ඩබ්. එම්. ටී. ඩී. විජේතුංග[1]

**සංක්ෂේපය**

දේශීය අර්තාපල් වගාව ආරම්භයේ සිටම අස්වැන්න විකුණාගැනීම දක්වා වූ විවිධ අවස්ථාවන් තුළ උඩරට ගොවිහු විවිධ ගැටලු වලට මුහුණ පාමින් සිටී. එහි වඩාත්ම අහිතකර ප්‍රතිඵලය වන්නේ, විශාල මුදලක් යටකර අර්තාපල් වගාවේ යෙදුන ද අවසානයේ අර්තාපල් සඳහා හොඳ වෙළඳපලක් නොවීමත් ස්වභාවික හා අනෙකුත් සාධක නිසා අස්වැන්න පහත බැසීමත් ය. පර්යේෂණ අධ්‍යයන ගැටලුව ලෙස හඳුනා ගෙන ඇත්තේ, යොදවන මුදලට සාපේක්ෂව අර්තාපල් වගාවෙන් ගොවීහු ලබන ශුද්ධ ආදායම අවම මට්ටමක පැවතීමයි. ආදායම අඩුවීමට වගාවට යොදා ගන්නා බීජ අර්තාපල් වල, පොහොර, රසායනික ද්‍රව්‍යවල මිල ඉහළ යෑම හා දේශගුණික සාධක බලපා ඇති බව උපකල්පනය කර ඇත. වගාව සඳහා යොදන පිරිවැයෙහි වටිනාකමට වඩා දෙගුණයක්වත් ආදායම නැතිනම් අවාසිදායක වගාවක් ලෙස කල්පිතයක් ගොඩනගා ඇත. 2016 වර්ෂයේ පළවෙනි මඩඉඩම් වල අර්තාපල් කන්නය (ජූනි - සැප්තැම්බර්) වැලිමඩ උඩුහාවර ග්‍රාමයේ ගොවීහු 20ක් සසම්භාවි ලෙස තෝරාගෙන ව්‍යුහගත සම්මුඛ සාකච්ඡා ක්‍රමය යටතේ ප්‍රාථමික දත්ත ද ඌවපරණගම ගොවිජන සේවා මධ්‍යස්ථානයෙන් හා කහගොල්ල කෘෂි පර්යේෂණ මධ්‍යස්ථානයෙන් ලබාගන්නා ද්විතික දත්ත පාදක කොට ගෙන මෙම පර්යේෂණය සිදු කොට ඇත. එක්රැස් කරගත් තොරතුරු දත්ත විස්තරාත්මක විශ්ලේෂණ ක්‍රම ඔස්සේ විශ්ලේෂණය කර ඇත. අධ්‍යයනයේ ප්‍රතිඵල අනුව, ඉහත උපකල්පනයන් පර්යේෂණ ගැටලුවට හේතු වූ බව පැහැදිලි ය. මීට අමතරව වර්තමානයේ පවතින වියළි කාලගුණය අර්තාපල් වගාවට අයෝග්‍ය ලෙස බලපා ඇත. අඛණ්ඩව ප්‍රමිතියකින් තොරව රසායනික ද්‍රව්‍ය යෙදීම නිසා ප්‍රදේශයේ පාංශු හායනය හේතුවී ඇත.මේ සඳහා ජාතික ප්‍රතිපත්ති වශයෙන් පොහොර සහනාධාරය නැවත ක්‍රියාත්මක කිරිම, ණය අරමුදල් ලබාදීම, පාංශු හායනය වලක්වා ගැනීමට උපදෙස් ලබාදීම, ජලසම්පාදනය ක්‍රමවත් කිරිම ආදිය යෝජනා ලෙස දැක්විය හැක.

**මුඛ්‍ය පද :** වැලිමඩ, අර්තාපල් වගාව

[1] ආර්ථික විද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, thiwankadanze@gmail.com

# රැකියා පුහුණු වැඩසටහන (INTERNSHIP) තුළින් ලබන පුහුණුව විද්‍යාර්ථයා රැකියා වෙළඳපොළට හැඩගැසීම සඳහා ප්‍රමාණවත් ද යන්න විමසීම

**ඩී. එම්. සුනේත්‍රා සෙව්වන්දි දයාරත්න [1]**

**සංක්ෂේපය**

ශ්‍රී ලංකාවේ නූතන විශ්වවිද්‍යාල පද්ධතියෙන් බිහිවන විද්‍යාර්ථයා සතුව වෘත්තීය පුහුණු අධ්‍යාපනයක් නොපවතී. හුදෙක් ඔවුන් සතුව පවතින්නේ, න්‍යායාත්මක දැනුම පමණි. ප්‍රායෝගික පුහුණුවක් දක්නට නොලැබේ. මේ නිසා, විශ්වවිද්‍යාල ශිෂ්‍යයා සහ ශ්‍රම වෙළඳපොළ අතර දැඩි පරතරයක් පවතී. ඒ හේතුවෙන්, උපාධිධාරී ශිෂ්‍යයා ශ්‍රම වෙළඳපළෙන් ප්‍රතික්ෂේප වීමේ ප්‍රවණතාවක් පවතී. ඊට ප්‍රතිකර්මයක් ලෙස, විශ්වවිද්‍යාලය තුළ ආයතනික පුහුණු වැඩසටහන (INTERNSHIP) දින 25-30 ක අතර කාලයක්, එනම් පැය 200-240 ක් විෂය ඒකකයක් ලෙස ක්‍රියාත්මක වේ. නමුත්, එම වැඩසටහන විශ්වවිද්‍යාල ශිෂ්‍යයාව ශ්‍රම වෙළඳපළට හැඩ ගැස්වීම සඳහා ප්‍රමාණවත්ද යන්න මෙහිදී මතුවන ගැටලුව වේ. එම වැඩසටහන තුළ පවතින දුර්වලතා හඳුනා ගැනීම මෙම අධ්‍යයනයේ අරමුණ වේ. ඒ සඳහා සියලු පීඨයන් නියෝජනය කරමින් සිසුන් 100 කගේ නියැදියක් ලබා ගත් අතර සම්මුඛ සාකච්ඡා ක්‍රමය හරහා දත්ත ලබා ගන්නා ලදී. එහිදී, ලබා ගත් දත්ත අනුව , විද්‍යාර්ථයින් 80% කගේ අදහස වූයේ, INTERNSHIP සඳහා ලබා දී ඇති කාලය ප්‍රමාණවත් නොවන බවයි. 75% කගේ අදහස වූයේ, නිවැරදි පුහුණුවක් එම ආයතන වලින් නොලබන බවයි. 70% ක් මුදල් මත පදනම්ව දෛනික වැටුපක් ලබාදෙන සේවා ස්ථාන පුහුණුව සඳහා තෝරාගෙන තිබුණි. 30% ක් තමන් හදාරන විෂය ධාරාවට අදාළ ක්ෂේත්‍රයක තම දැනුම වර්ධනය කර ගනිමින් ප්‍රායෝගික ක්‍රියාකාරකම්වල නියැලෙමින් වඩාත් නිවැරදි පුහුණුවක් ලබන බව ප්‍රකාශ විය. මේ අනුව, නිගමනය කළ හැකි වන්නේ, පුහුණු වෙමින් කරන රැකියා වැඩසටහන සඳහා ලබා දී ඇති කාලය ප්‍රමාණවත් නොවන බවත්, නිවැරදි මඟ පෙන්වීමක් නොමැති බවත්, මෙම වැඩසටහන ක්‍රියාත්මක කිරීමේ අරමුණු අසාර්ථක වී ඇති බවත් ය .

**මුඛ්‍ය පද :** විද්‍යාර්ථයන්, INTERNSHIP, දත්ත, පුහුණුව

[1] ආර්ථික විද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, sunethrasewmi@gmail.com

# පුස්තකාලයේ පවතින දත්තපදනම් භාවිතය පිළිබඳව අධ්‍යයනයක් (කැලණිය විශ්වවිද්‍යාලය ඇසුරෙනි)

**යූ. ආර්. එන්. එස්. රණසිංහ**[1]

**සංක්ෂේපය**

පුස්තකාලය යනු, විශ්ව ඥාණයේ කෝෂ්ඨාගාරය ලෙස නිර්වචනය කළ හැකිය. විශ්වවිද්‍යාල පුස්තකාලයක මූලික අරමුණ වන්නේ, ඉගෙනුම් සහ පර්යේෂණ අවශ්‍යතා ඉටු කිරිමයි. ඒ අනුව, විශ්වවිද්‍යාල පුස්තකාලවල දැනුම අඩංගු මුද්‍රිත මාධ්‍යන්ට අමතරව තොරතුරු තාක්ෂණයේ දියුණුවත් සමග බිහි වූ දත්ත පදනම් ද විද්‍යාර්ථයන්ගේ භාවිතය සඳහා තිබිය යුතු අත්‍යවශ්‍ය අංගයක් වී ඇත. මෙම අධ්‍යයනයේ අරමුණ වන්නේ, විද්‍යාර්ථයින් ඉගෙනුම් සහ පර්යේෂණ අවශ්‍යතා සඳහා කොතෙක් දුරට දත්ත පදනම්වල තොරතුරු ගවේෂණය කරන්නේ ද සහ මේවා අධ්‍යයනය කිරිමේ දී ගැටලුකාරී තත්ත්වයක් පවතින්නේ ද යන්න පිළිබඳව සොයා බැලීමය. මේ අධ්‍යයනය සඳහා කැලණිය විශ්වවිද්‍යාලයේ පීඨ හතරෙන් විද්‍යාර්ථයින් 150ක සසම්භාවී නියැදියක් මඟින් ප්‍රාථමික දත්ත ලබා ගත් අතර ඒ සඳහා සම්මුඛ සාකච්ඡා ක්‍රමය භාවිත කරන ලදී. මෙම අධ්‍යයනය තුළින් පෙනී ගියේ, විද්‍යා හා සමාජ විද්‍යා පීඨයේ ඇතැම් අධ්‍යයන අංශ හැර අනෙක් පීඨ හා අධ්‍යයන අංශවල විද්‍යාර්ථයින්ට දත්ත පදනම් පිළිබඳව අවබෝධයක් නොමැති බවයි. පුස්තකාලයේ මුද්‍රිත මාධ්‍යය වෙත පමණක් විද්‍යාර්ථයින් නැඹුරු වූ ආකාරයක් හඳුනා ගත හැකි විය. මෙයට ප්‍රධාන හේතු සාධක ලෙස පුස්තකාලය විසින් සහ අධ්‍යයන අංශ විසින් විද්‍යාර්ථයින් දැනුවත් නොකිරීම සහ විද්‍යාර්ථයින් ද නව මාධ්‍යය ඔස්සේ බිහිවන දැනුම් මූලාශ්‍ර වෙත යොමු නොවීමට දරන අකමැත්ත යනාදිය දැක්විය හැක. මේ හේතුව නිසා විද්‍යාර්ථයින්ට තම අධ්‍යයන අවශ්‍යතා සඳහා නව්‍ය සහ කාලීන තොරතුරු ග්‍රහණය කරගැනීමේ හැකියාව නොලැබී ගොස් ඇත. විද්‍යාර්ථයින් අදාළ අධ්‍යයන අංශ විසින් දත්ත පදනම් පිළිබඳව දැනුවත් කිරිම, විෂය කරුණු, නිබන්ධ සහ විභාග ආදිය සඳහා දත්ත පදනම්වල අන්තර්ගත කරුණු ගවේෂණය අනිවාර්ය කිරීම සහ පුස්තකාලය විසින් දැන්වීම්, අත්පත්‍රිකා සහ නව මාධ්‍යය භාවිත කරමින් විද්‍යාර්ථයින් දැනුවත් කිරීම යනාදිය විද්‍යාර්ථයින් දත්ත පදනම් ගවේෂණය සඳහා යොමු කරවීමේ යෝජනා ලෙස ඉදිරිපත් කළ හැකිය. ඒ තුළින් විද්‍යාර්ථයින්ට ඉගෙනුම් සහ පර්යේෂණ ක්‍රියාවලිය සාර්ථක ලෙස ඉටු කර ගැනීමට මෙන්ම නව්‍ය තොරතුරු අධ්‍යයනය කිරීමට හැකි වේ.

**මුඛ්‍ය පද :** පුස්තකාලය, දත්ත පදනම්, විද්‍යාර්ථයා, තොරතුරු, අධ්‍යයන

[1] පුස්තකාල හා විඥාපන විද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය,
nimasha ranashinghe.93@gmail.com

# සර්වජන ඡන්ද බලය ලැබීමෙන් පසු කාන්තා අයිතිවාසිකම් වල තත්ත්වය ( ගම්පහ දිස්ත්‍රික්කය ඇසුරින්)

**එල්. එච්. සී. දිල්රුක්ෂි**[1]

## සංක්ෂේපය

නියෝජන ප්‍රජාතන්ත්‍රවාදය ක්‍රියාත්මක කිරීමට අත්‍යවශ්‍ය උපකරණයක් ලෙස සර්වජන ඡන්දබලය හඳුනාගත හැකිය. ශ්‍රී ලංකාවට සර්වජන ඡන්දබලය හඳුන්වා දෙන ලද්දේ, 1931 වර්ෂයේදී ය. කාන්තා අයිතිවාසිකම් දිනා ගැනීමේ ක්‍රියාදාමයේදී සර්වජන ඡන්ද බලය ඉතා වැදගත් වේ. මෙම අධ්‍යයනයේ අරමුණ වන්නේ, සර්වජන ඡන්දබලය ලැබීමෙන් පසු ශ්‍රී ලංකාවේ කාන්තාවන්ට හිමිවිය යුතු අයිතිවාසිකම් කොපමණ දුරකට ප්‍රායෝගික තත්ත්වයේදී හිමිව තිබේද යන්න අධ්‍යයනය කිරීමයි. සර්වජන ඡන්ද බලය හිමිවීමෙන් පසු කාන්තාවන්ගේ අයිතිවාසිකම් වල වෙනසක් සිදු වී තිබේද, නැද්ද යන්න මෙම අධ්‍යයනයේ ගැටලුව වේ. අධ්‍යයනයේ නියැදිය ලෙස ශ්‍රී ලංකාවේ වැඩිම දෙවන ජනගහනය මෙන්ම සෑම ජනවර්ගයක්ම නියෝජනය වන ගම්පහ දිස්ත්‍රික්කය තෝරාගත් අතර අතර ප්‍රශ්නාවලි මඟින් ප්‍රාථමික දත්ත හා තොරතුරු සපයා ගන්නා ලදී. කාන්තා අයිතිවාසිකම් විශ්ව ව්‍යාප්ත මට්ටමින් දැකිය හැකි වුවද, ශ්‍රී ලංකාවේ කාන්තා අයිතිවාසිකම් පිළිබඳව පමණක් අධ්‍යයනය කිරීම මෙම අධ්‍යයනය හරහා සිදු කොට තිබේ. අධ්‍යයනයෙන් අනාවරණය කර ගත් අන්දමට කාන්තාවන්ගේ ඡන්දය භාවිත කිරීමේ අයිතිය සැලකිය යුතු ප්‍රමාණයකින් භුක්ති විඳීමට හැකියාව ලැබී තිබුණ ද ක්‍රියාකාරී දේශපාලනය තුළ කාන්තාවන්ගේ සහභාගීත්වය අවම මට්ටමක පවතී. ඒ අනුව මෙම අධ්‍යයනය හරහා සර්වජන ඡන්දබලය ලැබීමෙන් පසු කාන්තාවන්ගේ අයිතිවාසිකම් යම් තරමක් හිමි වුව ද එය සැලකිය යුතු මට්ටමකින් වර්ධනය වීමක් දැකිය නොහැකි බව නිගමනය කළ හැකිය.

**මුඛ්‍ය පද :** සර්වජන ඡන්දබලය, නියෝජන ප්‍රජාතන්ත්‍රවාදය, කාන්තා අයිතිවාසිකම්

[1] ආර්ථිකවිද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, cdilrukshi64@gmail.com

# අධ්‍යාපන කාර්ය සාධනය කෙරෙහි භෞතික සාධක වල බලපෑම

ඩබ්. එච්. ශානිකා ප්‍රියදර්ශනී [1]

## සංක්ෂේපය

අධ්‍යාපනය ලැබීම මූලික මිනිස් අයිතිවාසිකමක් වන අතර ඒ සඳහා විවිධ ආයතන ද පිහිටුවා තිබේ. ප්‍රධාන වශයෙන්ම ශ්‍රී ලංකාවේ පාසල්, අධ්‍යාපනය ලබා දීමේ කාර්යයේ ප්‍රමුඛ ස්ථානයක පවතියි. නාගරික පාසල් මෙන්ම ග්‍රාමීය පාසල් ද අධ්‍යාපනය ලබා දීමේ කාර්යයේ නිරත වන අතර එම පාසැල් වල පවත්නා භෞතික සම්පත්, අධ්‍යාපනය සාර්ථක ලෙස ලබා දී සිසුන්ගේ අධ්‍යාපන කාර්ය සාධනය ඉහළ නැංවීමට දරන දායකත්වය ඉතා වැදගත් වේ. ඒ අනුව, එම පාසැල් වල පවත්නා භෞතික සාධක සිසුන්ගේ කාර්ය සාධනය කෙරෙහි බලපෑමක් සිදු කරනවා ද යන්න සොයා බැලිම සඳහා මෙම පර්යේෂණය සිදු කරන ලදී. මේ සඳහා අනුරාධපුර දිස්ත්‍රික්කයේ තෝරාගත් ග්‍රාමීය පාසැල් හා නාගරික පාසැල් වල අධ්‍යාපනය ලබන සිසුන්ගෙන් සසම්භාවී ලෙස තෝරාගත් සිසුන් 50 කින් යුත් නියැදියකට ප්‍රශ්නාවලියක් ලබා දීම මඟින් මෙම තොරතුරු රැස් කරන ලදී. මෙම පර්යේෂණයේ දී අවධානය යොමු වුණ කරුණක් වන්නේ, පාසල් වල පවතින භෞතික සාධක ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගේ අධ්‍යාපන කාර්ය සාධනය කෙරෙහි යම් කිසි බලපෑමක් සිදු කරනවාද යන්නයි. එහිදී විශේෂයෙන්ම පාසල් වල පවතින භෞතික පහසුකම් අධ්‍යාපන කාර්ය සාධනය කෙරෙහි බලපාන බව විශ්ලේෂණයේදී අනාවරණය විය. ඒ අනුව, පරිගණක මධ්‍යස්ථාන පවතින පාසල් 66% ක් පවතින අතර එම පාසල් වල සිසුන්ගේ තාක්ෂණ දැනුම ඉහළ බවත් එම පහසුකම් නැති සිසුන්ගේ තාක්ෂණ දැනුම අවම බවත් අනාවරණය විය. පර්යේෂණ නියැදිය තුළ 100%ක්ම පුස්තකාල පහසුකම් පැවතියද එයින් ඵලදායී ලෙස ක්‍රියාත්මක වන්නේ, 76%ක් පමණ වන නිසා සිසුන්ගේ කාර්ය සාධනයද එයට සාපේක්ෂව පවතියි. සෑම පාසලකටම පර්යේෂණාගාරයක් නොමැති බව මෙහිදී අනාවරණය වු අතර 88%කට පර්යේෂණාගාරයක් හිමි වුවද එයින් 38%කට අවම පහසුකම්ද, 36% කට සාමාන්‍ය පහසුකම්ද, 14% ඉහළ පහසුකම්ද පවතින අතර එම පාසල් වල සිසුන්ගේ අධ්‍යාපන කාර්ය සාධනය ඉහළ මට්ටමක පවතින බව ද අනාවරණය විය. මේ අනුව මෙම පර්යේෂණයේදී භෞතික සාධක අධ්‍යාපන කාර්ය සාධනය කෙරෙහි බලපෑමක් පවතින බව අනාවරණය විය. මේ අනුව ග්‍රාමීය හෝ නාගරික පාසැල් වල සිසුන්ගේ න්‍යායාත්මක දැනුම මෙන්ම ප්‍රායෝගික දැනුම වර්ධනය කරමින් අධ්‍යාපන කාර්ය සාධනය උපරිම කිරීම සඳහා භෞතික සාධක වල අවශ්‍යතාව අනිවාර්ය බව නිගමනය වූ අතර කාර්ය සාධනය උපරිම සිසු පරපුරක් බිහි කිරීම සඳහා රජයේ අවධානය යොමු විය යුතුය.

**මුඛ්‍ය පද :** අධ්‍යාපන, කාර්ය සාධනය, භෞතික සාධක, ප්‍රායෝගික, න්‍යායාත්මක

[1]ආර්ථිකවිද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය,
shanikapriyadarshaniwalpola@gmail.com

# විශ්වවිද්‍යාල සිසුන් දේශනවලට සහභාගි වීම ඔවුන්ගේ ප්‍රතිඵල සාධනය කෙරෙහි සිදු කරන බලපෑම

**සී. ටී. සමරසිංහ**[1]

## සංක්ෂේපය

විශ්වවිද්‍යාල සිසුන්ගේ ප්‍රතිඵල විවිධ මට්ටම්වල පවතී. ප්‍රතිඵල අඩු, වැඩි වීමට විවිධ හේතු බලපානු ලබයි. විශ්වවිද්‍යාල සිසුන් දේශන වලට සහභාගි වීම කොතෙකුත් දුරට ඔවුන්ගේ ප්‍රතිඵල සාධනය කෙරෙහි ඇතිකරනු ලබන බලපෑම පිළිබඳ සොයා බැලීම මෙම අධ්‍යයනයේ අරමුණයි. ඒ සඳහා කැලණිය විශ්වවිද්‍යාලයෙන් ස්තෘත සසම්භාවී නියැදුම් ක්‍රමය භාවිතා කරමින් පීඨ 04 න් එක් පීඨයකින් 20 දෙනා බැගින් 80 ක නියැදියක් තෝරා ගත් අතර සම්මුඛ සාකච්ඡා සහ ප්‍රශ්නාවලි ක්‍රමය භාවිතයෙන් ප්‍රාථමික දත්ත ලබා ගන්නා ලදි. රැස් කරගත් දත්තයන් ප්‍රස්තාර සහ වගු ආදී විස්තරාත්මක සංඛ්‍යානමය ක්‍රම ඔස්සේ විශ්ලේෂණය කරන ලදි. විශ්ලේෂණයට අනුව, 78.75% දේශන වලට සහභාගි වීම ප්‍රතිඵල සාධනයට බලපාන බව ප්‍රකාශ කරන අතර 21.25% ප්‍රතිශතයක් දේශන වලට සහභාගි වීම තම ප්‍රතිඵල සඳහා බල නොපාන බව සඳහන් කරයි. ඉහළ ප්‍රතිඵල ලබා ගැනීමට දේශන වලට සහභාගි වීම අවශ්‍ය බව ස්ත්‍රීන්ට අනුව 68.25% ක් ද පුරුෂයන්ට අනුව 31.74% ක් බව අනාවරණය විය. මෙම තත්ත්වය පීඨ අනුව සැලකීමේ දී මානව ශාස්ත්‍ර සහ සමාජ විද්‍යා පීඨවලට අනුව පිළිවෙළින් 14.28% ක් සහ 20.63% ක් ද වාණිජ හා කළමනාකරණ සහ විද්‍යා පීඨවලට අනුව පිළිවෙළින් 26.98% ක් සහ 38.09% ක් විය. එමෙන්ම දේශන වලට සහභාගි වීම සහ සිසුන්ගේ ප්‍රතිඵල වර්ධනය අතර ධන සහසම්බන්ධතාවයක් පවතින බව තහවුරු විය. ඒ අනුව, විශ්වවිද්‍යාල සිසුන්ගේ ප්‍රතිඵල සාධනය සඳහා දේශනවලට සහභාගි වීම ඍජුවම බලපාන බව ප්‍රත්‍යක්ෂ විය. ඊට අමතරව මානවශාස්ත්‍ර සහ සමාජීය විද්‍යා පීඨ වල සිසුන් වාණිජ හා කළමනාකරණ සහ විද්‍යා පීඨ වල සිසුන්ට සාපේක්ෂව දේශන වලට සහභාගි වීම පහළ අගයක් වාර්තා කරන අතර වාණිජ සහ විද්‍යා පීඨවල සිසුන් දේශන වලට සහභාගී වීම ඉහළ අගයක පවතින බව නිගමනය කළ හැකිය. තමන්ගේ විභාග ප්‍රතිඵල වර්ධනය කර ගැනීමට විශ්වවිද්‍යාල සිසුන් නොකඩවා දේශන වලට සහභාගි වීම අවශ්‍ය බව මෙහිදී දැක්විය හැකිය.

**මුඛ්‍ය පද :** විශ්වවිද්‍යාල සිසුන්, ප්‍රතිඵල, දේශන වලට සහභාගී වීම

[1] ආර්ථික විද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, chathurasamarasinghe.94@gmail.com

# Changing Population Growth Rate & Its Determinants with the Beginning of 21th Century

**L. N. M. Liyanapathirana[1]**

## Abstract

In 19th century, Sri Lankan population increased slowly like other developing countries. But Sri Lanka began the 20th century with 3.6 million population. At the end of 20th century Sri Lankan population was 18.8 million. Furthermore at the mid of 20th century reported the largest population growth in Sri Lanka. In 1960 both death rate and birth rate began to decrease representing the next stage of population growth. Therefore at the beginning of 21th century population growth rate was less than before. However this changes of the population has effected more problems in Sri Lanka. Thus the main objective of this study is to identify the relationships between the population growth rate and its determinants with the beginning of 21th century in Sri Lanka. The study used time series data from secondary sources in Sri Lanka. To satisfy the objective of the study, charts, descriptive statistics and correlation coefficients have been employed. The data was analyzed by SPSS and Excel software. According to the results, with the beginning of 21th century the population has been increasing similar to the past. The highest population was in 2011. But population growth rate has been going down. The population growth rate is positively related with the birth rate, net migration rate, fertility rate, life expectancy and urban population. The death rate is negatively related with the population growth rate. There are strong relationships between birth rate, life expectancy and urban population. There are not strong relationships between population and its determinants such as death rate, net migration rate and fertility rate. The most related variable for population growth rate is the birth rate. Hence the population changing mostly depend on the birth rate in Sri Lanka with the beginning of 21th century.

**Keywords:** population, population growth, population changing

[1] Department of Economics, University of Kelaniya, nishara.malki@gmail.com

# ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල තුළ පැවරුම් නිබන්ධන ලබා දීමේ ඵලදායීතාව.

යූ. කේ. ඩී. ශාන්ති[1]

**සංක්ෂේපය**

වර්තමානයේ ශ්‍රී ලංකාවේ පවතින විශ්වවිද්‍යාල පද්ධතිය තුළ ක්‍රියාත්මක වන අධ්‍යාපන රටාවේ ප්‍රධාන තීරකය වශයෙන් ගැනෙන්නේ වර්ෂ අවසාන හෝ අර්ධ වර්ෂ අවසාන විභාගයයි. එසේම ඇතැම් විශ්වවිද්‍යාලවල මෙම පරීක්ෂණයට සමගාමීව ශිෂ්‍යයින්ට පැවරුම් නිබන්ධන ලබා දිම සිදු වේ. එහෙත් මෙම පැවරුම් නිබන්ධන ලබාදීම ප්‍රයෝගික වශයෙන් ඵලදායී වන්නේද යන්න පරීක්ෂා කිරීමේ අරමුණින් මෙම පර්යේෂණය සිදුකරන ලදී. මේ සඳහා කැලණිය විශ්වවිද්‍යාලයේ පීඨ 4 නියෝජනය වන පරිදි ස්ථරායන නියැදීමෙන් අහඹු ලෙස සිසුන් 200 ලබා දෙන ප්‍රශ්නාවලි ක්‍රමය මගින් දත්ත රැස්කර ගන්නා ලදී. එහිදී අනාවරනය වූ කරුණුවලට අනුව, සමාජීය විද්‍යා පීඨයේ, මානව ශාස්ත්‍ර පීඨය හා විද්‍යා පීඨය යන පීඨයන්වල ශිෂයන්ට වැඩි වශයෙන් ලිඛිත පැවරුම් නිබන්ධන ලබා දෙන බවත් කළමනාකරණ පීඨයේ වාචික නිබන්ධන බහුතරයක් ලබාදෙන බව තහවුරු විය. එසේම එහි ඵලදායිත්වය විමසීම අරමුණු කරගෙන සිදු කරන ලද මෙම පර්යේෂණයේදි න්‍යායාත්මක වශයෙන් විද්‍යාර්ථියාගේ ගවේෂණ හැකියාව වැඩි දියුණු කිරිමේ අරමුණින් මෙම පැවරුම් නිබන්ධන ලබා දුන්නද, ප්‍රායෝගික වශයෙන් එහි දී සිදු වන්නේ ශිෂ්‍ය කණ්ඩායම් වශයෙන් නිබන්ධන සිදු කිරීම හා බහුල වශයෙන් අන්තර්ජාලය හරහා ලබාගන්නා තොරතුරු නිසි අධ්‍යනයකින් තොරව නිබන්ධනයට යොදා ගැනීමයි. එමගින් විද්‍යාර්ථියා අමතර දැනුමක් ලබා ගැනීමේ සම්භාවිතාව බොහෝ අඩු මට්ටමක පවතින බව තහවුරු විය. එසේම විද්‍යාර්ථියාගේ ආකල්ප අනුව පැවරුම් නිබන්ධන හුදෙක් ඔවුන්ට අවසාන විභාගය සඳහා ලකුණක් ලබාගැනීම සඳහා පමණක් වූ අතර අමතර දැනුම ගවේෂණය හෝ එය මතකයේ තබා ගැනිම ඔවුන් නොසලකා හරින බව පැහැදිලි විය. එසේම නියැදියෙන් 40% පිරිසක් පැවරුම් නිබන්ධනයේදි ආවරණය වන විෂය පථය අවසාන විභාගයේදී අදාළ නොවේය යන පදනම මත අධ්‍යයනයෙන් බැහැර කරයි. එය ඉතා අහිතකර තත්ත්වයක් බව පර්යේෂණය අවසානයේ දී පැහැදිලි විය. මේ අනුව බලන කල විශ්වවිද්‍යාල තුළ මෙම පැවරුම් නිබන්ධන ලබාදීම පවතින තත්ත්වයට වඩා විධිමත් වුවහොත් ඉන් උපරිම ඵලදායීතාවයක් ලැබිය හැකි බව පර්යේෂණය අවසානයේ දී තහවුරු විය.

**මුඛ්‍ය පද :** නිබන්ධන, විද්‍යාර්ථයා, පැවරුම්

[1] ආර්ථික විද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, divangika214@gmail.com

# අ.පො.ස. (සා/පෙළ) සිසුන්ගේ අධ්‍යාපන සාධනය කෙරෙහි බලපාන සාධක හඳුනා ගැනීම.

**ඒ. ඒ. පී. එම්. මධුභාෂිණී**[1]

**සංක්ෂේපය**

ආර්ථික සංවර්ධනයට අවශ්‍ය මානව ප්‍රාග්ධනය ගුණාත්මක බවකින් යුතුව සැපයීමේ මූලාශ්‍රය වන්නේ, අධ්‍යාපනයයි. ඒ නිසා රටක අධ්‍යාපන ක්‍රමය ක්‍රමානුකූල, විධිමත් මෙන් ම රටේ සංවර්ධන අභිමතාර්ථ හා ගැළපෙන ක්‍රමයක් විය යුතුය. ශ්‍රී ලංකාවේ රජයේ පාසල්වල ඉගෙනුම ලබන සිසුන්ගේ විෂයානුබද්ධ හැකියාවන් ජාතික මට්ටමෙන් මනිනු ලබන විභාගය ලෙස අ.පො.ස. (සා/පෙළ) විභාගය නම් කළ හැකි වේ. එකම විෂය නිර්දේශයක් යටතේ එකම වයස් කාණ්ඩයක සිසුන් අ.පො.ස (සා.පෙළ) විභාගයේදී සිසුන් ලබාගන්නා සාධන මට්ටම් අතර විවිධත්වයක් පැවතීම කෙරෙහි බලපාන සාධක හඳුනා ගැනීම මෙම අධ්‍යයනයේ අරමුණ විය. මෙහිදී ප්‍රාථමික හා ද්විතියික යන දත්ත වර්ග දෙකම රැස් කෙරුණි. ප්‍රාථමික දත්ත රැස් කිරීම සඳහා ක්ෂේත්‍ර සමීක්ෂණයක් සිදු කළ අතර ඒ සඳහා ප්‍රශ්නාවලි ක්‍රමය යොදාගැනුණි. ද්විතීයික දත්ත රැස් කිරීමට ග්‍රන්ථ, සඟරා ආදී මුද්‍රිත ලේඛන ද ශ්‍රව්‍ය දෘෂ්‍ය විද්‍යුත් මාධ්‍ය ද පරිශීලනය කරන ලදී. දත්ත විශ්ලේෂණය සඳහා වගු, ප්‍රස්තාර විස්තරාත්මක සංඛ්‍යාන ශිල්ප ක්‍රම භාවිත කරන ලදී .මේ අනුව දරුවන්ගේ අධ්‍යාපන සාධනය කෙරෙහි දෙමාපියන්ගේ අධ්‍යාපන මට්ටම, පවුල් පසුබිම, ඉගැන්වීමේ ක්‍රියාවලියේ ගුණාත්මක බව, උපකාරක පන්ති, විෂය බාහිර ක්‍රියාකාරකම්, පාසල සතු භෞතික සම්පත්වල ප්‍රමාණය ධනාත්මක ලෙස බලපා ඇති බව ය.

**මුඛ්‍ය පද** : අධ්‍යාපනය, සාධනය, ආර්ථික සංවර්ධනය, මානව ප්‍රාග්ධනය

[1] ආර්ථිකවිද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, aapmm.piyumi@gmail.com

# පාසල් ළමුන්ගේ උදෑසන ආහාර වේල සහ ඔවුන්ගේ පෝෂණ මට්ටම පිලිබඳ අධ්‍යයනයක්
# (ගම්පහ දිස්ත්‍රික්කයේ කැලණිය අධ්‍යාපන කලාපයේ පාසල් ඇසුරින්)

එච්. ඒ. ඩී. ටී. හපුආරච්චි[1]

## සංක්ෂේපය

යහපත් හා සාර්ථක ජීවිතයක් ගත කිරීම සඳහා පෝෂ්‍යදායී ආහාර ලබාගැනීම මූලික මිනිස් අවශ්‍යතාවයකි. නිසි පරිදි උදෑසන ආහාරය ලබාගැනීම එදිනෙදා කටයුතු කාර්යක්ෂමව කරගෙන යාමට සෑම මිනිසෙකුටම උපකාරී වන්නකි. වර්ධනය වන වයසේ පසුවන පාසල් ළමුන් නිසි පරිදි උදෑසන ආහාරය ලබාගැනීම අත්‍යවශ්‍ය වන අතර එය ඔවුන්ගේ ශරීර ස්කන්ධ දර්ශකය (BMI) ප්‍රශස්ත මට්ටමක පවත්වා ගැනීමට පාදක වේ. ඒ අනුව පාසල් ළමුන්ගේ පෝෂණ මට්ටම සහ උදෑසන ආහාර වේල අතර පවතින සම්බන්ධතාව පිළිබඳ අධ්‍යයනය කිරීම මෙම පර්යේෂණයේ අරමුණ විය. මෙහිදී පර්යේෂණ ගැටලුව බවට පත්වූයේ, පාසල් ළමුන්ගේ පෝෂණ මට්ටම සහ උදෑසන සමබල ආහාර වේලක් ලබාගැනීම අතර කිනම් සම්බන්ධතාවක් පවතීද යන්නයි. සම්මුඛ සාකච්ඡා ක්‍රමය හා ප්‍රශ්නාවලිය යන පර්යේෂණ ක්‍රමවේද සහ පාසල් සෞඛ්‍ය සංගම් මඟින් පවත්වාගෙන යන ද්විතීයික දත්ත ආශ්‍රයෙන් පර්යේෂණයට අදාළ තොරතුරු රැස් කරගන්නා ලදී. කැලණිය අධ්‍යාපන කලාපයේ නාගරික හා ග්‍රාමීය පාසල් 25ක සංගහනයකින් සසම්භාවීව තෝරා ගත් පාසල් 10 ක 6, 7 හා 8 ශ්‍රේණිවල ළමුන් පදනම් කරගෙන ලබාගත් දත්ත අනුව නාගරික පාසල්වල ළමුන්ගේ BMI අගය පහත මට්ටමක පවතින බවත්, නිතර විවිධ රෝගාබාධයන්ට ගොදුරු වීමේ ප්‍රවණතාවය ඉහළ මට්ටමක පවතින බවත් නිගමනය විය. මෙම දත්ත සහසම්බන්ධතාව සහ ප්‍රතිපායනය පදනම් කරගෙන විශ්ලේෂණය කළ අතර ප්‍රමාණාත්මකව එය 0.687 ක් විය. ඒ අනුව සමබල ආහාර වේලක් ලබාගැනීම සහ පෝෂණ මට්ටම අතර අනුලෝම සම්බන්ධතාවක් දක්නට ලැබිණි. ග්‍රාමීය පාසල්වල ළමුන් පෝෂ්‍යදායී සමබල ආහාරයක් උදෑසන ආහාර වේල වශයෙන් ලබාගත්ත ද නාගරික පාසල්වල ළමුන් බහුතරයක් ක්ෂණික ආහාර ලබාගැනීමේ වැඩි ප්‍රවණතාවයක් විය. ක්ෂණික ආහාර ලබාගන්නා බොහොමයක් ළමුන්ගේ BMI අගය ප්‍රශස්ත මට්ටමක නොපවතින බව දැකගත හැකි විය. ඒ සඳහා ළමුන්ට දිනපතා උදෑසන කොළ කැඳ වීදුරුවක් නොමිලේ ලබාදීමටත්, පෝෂ්‍යදායී ධාන්‍ය වර්ග හා ආහාර පහසු මිලට අලෙවි කරන අවන්හලක් සෑම පාසලකම ස්ථාපිත කිරීමටත්, ළමුන්ගේ සෞඛ්‍ය තත්ත්වයේ වැදගත්කම පිළිබඳ දෙමාපියන් දැනුවත් කිරීමටත් යෝජනා ඉදිරිපත් කරන ලදී.

**මුඛ්‍ය පද :** මූලික මිනිස් අවශ්‍යතා, ළමා සෞඛ්‍යය, BMI අගය, උදෑසන ආහාර වේල, පෝෂණ ඌණතා

[1] ආර්ථික විද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, dimanihapuarachchi@gmail.com

# විශ්වවිද්‍යාලීය විද්‍යාර්ථීයාගේ අධ්‍යයන පරිසරය තුළ ඇති ගැටලු පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයකි (කැලණිය විශ්වවිද්‍යාලය ඇසුරින්)

**එම්. පී. එන්. පී. මැණික්ගේ[1]**

## සංක්ෂේපය

නව දැනුම බිහි කිරීමේ සහ බෙදාහැරීමේ මධ්‍යස්ථානයක් ලෙස, විශ්වවිද්‍යාලයක් විශිෂ්ට වූ සේවාවක් සමාජයට ඉටු කරනු ලබයි. මෙකී මෙහෙවර තුළින් ඵල නෙලාගැනීම සඳහා විශ්වවිද්‍යාලයට ප්‍රවේශ වන්නා වූ විද්‍යාර්ථීන්ගේ ඇතැම් පිරිසකට විවිධ වූ හේතු සාධක මත මෙහිලා පූර්ණ ප්‍රතිලාභය අත්කර ගැනීමට අසමත් වේ. විද්‍යාර්ථයෙකුගේ ඉගෙනුම් ක්‍රියාවලියෙහි ක්‍රියාකාරිත්වය කෙරෙහි බලපාන්නා වූ තීරණාත්මක සාධකයක් වශයෙන් අධ්‍යයන පරිසරය හඳුනා ගත හැකිය. විශ්වවිද්‍යාලයක් තුළින් විද්‍යාර්ථීයෙකු ලබන්නේ, නේවාසික අධ්‍යාපනයක් නිසාවෙන් අධ්‍යයන පරිසරය යන්න දේශන ශාලාවට පමණක් සීමා නොවේ. දේශන ශාලාවෙන් පිටත නේවාසිකාගාරය තුළ පුස්තකාලය තුළ පරිසරයද, අධ්‍යයන පරිසරයට අයත් වේ. මෙම අධ්‍යයන පරිසරය තුළ පවතින්නා වූ විවිධ ගැටලුකාරි තත්ත්වයන් විද්‍යාර්ථීයාගේ අධ්‍යාපන ක්‍රියාකාරිත්වය කෙරෙහි බලපෑම් ඇති කළ හැකිය. මෙම අධ්‍යයනය හරහා උත්සහා දරා ඇත්තේ, විශ්වවිද්‍යාලීය අධ්‍යයන පරිසරය තුළ පවත්නා වූ විද්‍යාර්ථීයා මුහුණ දෙන අර්බුදකාරී තත්ත්වයන් හඳුනාගැනීම වේ. මේ සඳහා කැලණිය විශ්වවිද්‍යාලයේ විද්‍යාර්ථීන්ගෙන් සසම්භාවී ව තෝරාගත් විද්‍යාර්ථයින් 300 ගෙන් සමන්විත නියැදියක් ආශ්‍රයෙන් ප්‍රශ්නමාලා ක්‍රමය යටතේ, අධ්‍යයනයට අවශ්‍ය ප්‍රාථමික දත්තයන්ද, අනෙකුත් මූලාශ්‍රයන්ගෙන් ද්විතියික දත්තයන්ද අධ්‍යයනගේ අරමුණු මත පදනම්ව රැස් කරගනු ලැබී ය. ඒ යටතේ, විද්‍යාර්ථීයාගේ අධ්‍යයන පරිසරය තුළ පවත්නා ගැටලුකාරී තත්ත්වයන් මොනවාද යන්නත්, ඒ සඳහා බලපාන සාධක හඳුනාගැනීමත්, එම ගැටලු හරහා විද්‍යාර්ථයාගේ ඉගෙනුම් ක්‍රියාවලියට ඇතිකරන බලපෑම කෙසේද යන්න යනාදී අරමුණු මූලික වූ අතර ඒ මත පදනම්ව රැස් කරගනු ලැබූ දත්තයන් සංඛ්‍යානමය විශ්ලේෂණ ක්‍රම යටතේ විශ්ලේෂණය සිදු කෙරිණි. මෙම අධ්‍යයනය අවසානයෙහි අනාවරණය වූයේ, අධ්‍යයනයට බඳුන් වූ නියැදියෙන් 60% ආසන්න විද්‍යාර්ථීන් ප්‍රමාණයකට තම අධ්‍යයන පරිසරය තුළ ගැටලුකාරි තත්ත්වයන් පවතින බවයි. ඒ අතරින් විශේෂයෙන් හඳුනාගත් කරුණු අතර නවාතැන් පහසුකම් සම්බන්ධ වූ ගැටලු, ආහාර හා පෝෂණය සම්බන්ධ ගැටලු, විශ්වවිද්‍යාල උප සංස්කෘතිය තුලින් එල්ල වන බලපෑම් සහ විශේෂයෙන්ම භාෂා ගැටලු එනම් ඉංග්‍රීසි භාෂා භාවිතය සම්බන්ධයෙන් පවතින ගැටලු යනාදිය ප්‍රමුඛ කාරණා වශයෙන් අධ්‍යයනය තුළින් අනාවරණය විය.

**මුඛ්‍ය පද :** අධ්‍යයන පරිසරය, විද්‍යාර්ථීයා, ගැටලු

[1] ආර්ථික විද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, nirmaliprasanthika1@gmail.com

# විශ්වවිද්‍යාලය සතු භෞතික සහ මානව සම්පත්වලින් විද්‍යාර්ථයින් කොතෙක් දුරට ප්‍රයෝජන ගෙන තිබේද යන්න පිළිබඳ අධ්‍යනයක්. (කැලණිය විශ්වවිද්‍යාලය ඇසුරින්)

එච්. ටී. ඒ. ශාලික[1]

**සංක්ෂේපය**

ශ්‍රී ලංකාවේ පවතින සෑම විශ්වවිද්‍යාලයකම පාහේ විද්‍යාර්ථීන්ට ප්‍රයෝජනයට ගත හැකි පරිදි අතිවිශාල භෞතික සහ මානව සම්පත් ප්‍රමාණයක් පවතී. එහෙත් වර්තමානයේ බහුතරයක් විශ්වවිද්‍යාල විද්‍යාර්ථයින් මෙම සම්පත් නිසි පරිදි ප්‍රයෝජනයට නොගනී. විද්‍යාර්ථයින්ගේ අධ්‍යාපනික සහ බාහිර කටයුතු සඳහා මෙම සම්පත් යොදාගන්නේ නම් පවතින තත්ත්වයට වඩා විශ්වවිද්‍යාලය විද්‍යාර්ථයින්ගේ අධ්‍යාපන සහ බාහිර කටයුතු සාර්ථක සහ පහසු වනු ඇත. විශ්වවිද්‍යාලයක් සතු භෞතික සහ මානව සම්පත් මොනවාද යන්න හඳුනාගැනිම, විද්‍යාර්ථීන් කොතෙක් දුරට විශ්වවිද්‍යාලය සතු සම්පත් පිළිබඳ දැනුවත්ද යන්න සහ විද්‍යාර්ථීන් එකී සම්පත් තම අධ්‍යන අවශ්‍යතා සඳහා කොතෙක් දුරට උපයෝජනය කරගෙන තිබේද යන්න ආදී අරමුණු පදනම් කරගෙන මෙම අධ්‍යනය සිදුකරන ලදි. ඒ සඳහා කැලණිය විශ්වවිද්‍යාලයේ විද්‍යාර්ථීන් 100 නියැදියක් ආශ්‍රයෙන් ප්‍රශ්න මාලා ක්‍රමය යොදාගෙන ප්‍රාථමික දත්ත රැස්කර ගන්නා ලදී. එසේම විශ්වවිද්‍යාලය සම්බන්ධව ඇති පොත් පත් සහ අන්තර්ජාලය හරහා පරීයේෂණය සඳහා අවශ්‍ය ද්වීතියික දත්තයන් රැස්කර ගන්නා ලදී. එම දත්තයන් සංඛ්‍යානමය විශ්ලේෂණය ශිල්ප ක්‍රම භාවිතයෙන් විශ්ලේෂණය සිදු කරන ලදී . මෙම අධ්‍යනයේ අවසානයේ නිගමනය වූයේ විශ්වවිද්‍යාලය සතුව ප්‍රමාණවත් භෞතික මෙන්ම මානව සම්පත් ප්‍රමාණයක් පවතින බවත් නමුත් විද්‍යාර්ථීන්ගෙන් 30% ආසන්න ප්‍රමාණයක් මෙකි සම්පත් පිළිබඳ දැනුවත් භාවයෙන් නොසිටින බවයි. එසේම විද්‍යාර්ථීන්ගේ 50% පමණ සම්පත් පිළිබඳ දැනුවත් භාවයෙන් සිටියද එකී සම්පත්වලින් නිසි පරිදි ප්‍රයෝජන නොගන්නා බව පැහැදිලි වේ. තවද පර්යේෂණයේදි ඉදිරිපත් වූ යෝජනා අතර සම්පත් උපයෝජනය වැඩි කිරිම සඳහා එම සම්පත් වෙත ප්‍රවේශ වීමේ ඉඩකඩ පුළුල් කළයුතු බව සඳහන් විය. මේ අනුව විශ්වවිද්‍යාලය සතු ප්‍රමාණවත් මානව හා භෞතික සම්පත් ප්‍රමාණයක් තිබුණද විශ්වවිද්‍යාල විද්‍යාර්ථීයා එතුළින් නිසි පරිදි ප්‍රයෝජනය නොගන්නා බව පැහැදිලි වේ.

**මුඛ්‍ය පද :** භෞතික, මානව, විශ්වවිද්‍යාලය, සම්පත්

[1] ආර්ථික විද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, ashanshalika008@gmail.com

# ශ්‍රී ලංකාවේ උපාධිධාරියා සහ රැකියා

**පී. එන්. ඩී. ඒ. සෝමසිරි**[1]

**සංක්ෂේපය**

ශ්‍රී ලංකාව තුළ පවතින වඩාත් තීරණාත්මක කඩඉම් විභාගය වන අ.පො.ස(උ.පෙළ) විභාගය සමත්ව විශ්වවිද්‍යාල වරම් ලබා ගන්නා සිසුන් ප්‍රමාණය වර්තමානය වන විට ඉහළ යාමක් හඳුනා ගත හැකිය. එමෙන්ම වර්තමානය වන විට විශ්වවිද්‍යාල ප්‍රවේශය ද යම් ප්‍රමාණයකින් ඉහළ දැමීමට කටයුතු සිදු කර තිබෙන හෙයින් ඒ තුළින් හා බාහිර උපාධි ආශ්‍රයෙන් බිහි වන උපාධිධාරීන් ප්‍රමාණය අතිමහත් ය. නමුත් මෙලෙස බිහි වන උපාධිධාරීන්ට තම රැකියා ක්ෂේත්‍රය තුළ තම අධ්‍යයනයන් භාවිතයට ගැනීමට අවස්ථාව හිමිවේද යන්න ගැටලුකාරී තත්ත්වයක් වශයෙන් හඳුනා ගත හැකි ය. මෙම ගැටලුකාරී තත්ත්වය නව උපාධිධාරීන් තුළ පමණක් නොව මීට වසර ගණනාවට පෙර උපාධිධාරීන් වශයෙන් පත් වීම් ලැබ විවිධ රැකියාවන්හි නිරත වූවන් තුළින් ද හඳුනා ගත හැකිය. මේ පිළිබඳව සමීක්ෂණය සිදු කිරීමේදී එක් ක්ෂේත්‍රයකට පමණක් සීමා වීම මඟ හරවා ගැනීම උදෙසා රඹුක්කන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ රඹුක්කන ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ හා පශු වෛද්‍ය කාර්යාලයේ සේවයේ නියුතු නව උපාධිධාරීන් සහ සේවා කාලය වසර 20 ඉක්මවූ විවිධ පුද්ගලයන් පහසු නියැදීම යටතේ සමාන නියෝජනයක් සිදුවන සේ තෝරා ගෙන සම්මුඛ සාකච්ඡා මාර්ගයෙන් තොරතුරු ලබා ගන්නා ලදී. සම්මුඛ සාකච්ඡා මගින් ලබා ගත් තොරතුරුවලට අනුව පැහැදිලි වූයේ උපාධිධාරීන් වශයෙන් රැකියා ලබා ගත් බොහොමයක් පිරිසකට තමන් උපාධි අපේක්ෂකයෙකු වශයෙන් සිටි කාලය තුළ හැදෑරූ කිසිදු අධ්‍යයන විෂයක් තම රැකියාවට අදාළ නොවීමත් තවත් පිරිසකට තමන් කිසිදු දිනක අධ්‍යයනය නොකළ කිසිදු අවබෝධයක් නොමැති විෂය ක්ෂේත්‍ර හිමි වී තිබීමත් හේතුවෙන් මොවුන් විශාල වශයෙන් රැකියාව තුළ දී ගැටලුකාරී තත්ත්වයකට මුහුණ දීමට සිදුව තිබේ. එමෙන්ම මොවුන් විශාල වශයෙන් මානසික අපහසුතාවයකට ද පත්ව තිබේ. ඇතැම් අවස්ථාවන්හිදී රැකියා ක්ෂේත්‍රය අත්හැරීමට ද මෙය හේතු සාධක වී තිබේ.

**මුඛ්‍ය පද :** උපාධිධාරියා, අධ්‍යයන විෂයන්, රැකියා

[1] ආර්ථිකවිද්‍යා අධ්‍යන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, nimanthisomasiri@gmail.com

# ස්ථුලතාව කෙරෙහි ආහාර පරිභෝජනයේ බලපෑම

**වී. එන්. දොලපිහිල්ල**[1]

**සංක්ෂේපය**

බෝ නොවන රෝග බොහොමයක් සඳහා බලපාන ප්‍රධාන සාධකයකි. ස්ථුලතාව අප ගන්නා ආහාර වල අඩංගු අතිරික්ත මේදය උදරය, කලවා, පියයුරු, තට්ටම් යනාදී ප්‍රදේශ වල තැන්පත් වීමෙන් මෙකී තත්වය ඇති වේ. වර්ෂ 1980-2013 කාලය තුළ ලංකාවේ ස්ථුලතාවය කෙරෙහි ආහාර පරිභෝජනයේ බලපෑම කෙසේද යන්න අධ්‍යයනය කිරීම මෙම පර්යේෂණයේ අරමුණයි. මෙහිදී පරායත්ත විචල්‍ය ලෙස ස්ථුලතාවද ස්වායත්ත විචල්‍ය ලෙස පරිභෝජනයට ගන්නා ප්‍රධාන ආහාර වන සහල් පාන් රොටි (කාබෝහයිඩ්‍රේට්) මල් මාළු (ලිපිඩ) කිරි සහිත ආහාර ධාන්‍යාහාර හා සීනි අඩංගු ආහාර යොදා ගෙන ඇති අතර ලබා ගත් දත්ත SPSS මෘදුකාංගය භාවිතයෙන් බහු රේඛීය ප්‍රතිපායන විශ්ලේෂණයක් සිදු කරනු ලැබීය. ස්ථුලතාවයේ හා ආහාර පරිභෝජනයේ ව්‍යාප්තිය සඳහා 1980 සිට 2013 දක්වා විචල්‍ය ප්‍රස්තාර මගින් හඳුනා ගනු ලැබිණි. මෙහිදි ජන ලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තුමේන්තුව විසින් පවත්වනු ලබන කුටුම්භ ආදායම් හා වියදම් සමීක්ෂණ වාර්තාව හා වාර්ෂික සෞඛ්‍යය සගරා ද්විතීක මූලාශ්‍ර ලෙස යොදා ගන්නා ලදි. ඌන සංවර්ධිත රාජ්‍යක් වන ශ්‍රී ලංකාවේ සෑම පුරවැසියෙකුටම පෝෂදායී ආහාර වේලක් ලබා ගත හැකිය. ලාංකීයන්ගේ ප්‍රධාන ආහාරය බත්ය ඊට අමතරව පාන් වැනි ආහාරද ද පරිභෝජනය කිරීමට ඔවුන් පුරුදුව සිටි පෝෂදායී ආහාර වන එළවළු පළතුරු ධාන්‍යය වර්ග ආදීය පරිභෝජනය අවම මට්ටමක පවතින අතර මෙකී තත්වය මත පදනම්ව ශ්‍රී ලංකාවේ ස්ථුලතාව දිනෙන් දින වර්ධනව වන බව පෙනී යන කරුණකි. මෙහිදි ජානමය සාධක දේහ ක්‍රියාකාරිත්වය, ස්ත්‍රී පුරුෂ භාවය, සමාජ හා සංස්කෘතික රටාවන්, ආර්ථික මට්ටම්, ගර්භනී භාවය, ආර්තතාවය, දේහයේ පරිවෘත්තිය සම්බන්ධ විවිධ රෝග, මානසික ආතතිය වැනි දෑ බලපාන බව පෙනී යන නමුත් අප ගන්නා ආහාර ඇති ශක්තිය ප්‍රමාණාත්මකව වැඩි වීමක් සිදු නොවන විට ඒවා දේහය තුළ අනවශ්‍ය ලෙස තැන්පත් වීම, මේ සඳහා ප්‍රධාන වශයෙන් බලපාන බව හඳුනාගත හැකිය. මෙම පර්යේෂණයේදී ලැබුණු නිගමනයන් ලෙස විශ්වාසනීයතා මට්ටම 95% යටතේ කාබෝහයිඩ්‍රේට් සහිත ආහාර වල P අගය පිළිවෙළින් 0.016 සහ 0.049 විය ඒ අනුව ස්ථුලතාව සඳහා කාබෝහයිඩ්‍රේට් සහිත ආහාර සහ ලිපිඩ සහිත ආහාර පරිභෝජනය බලපාන බව නිගමනය කළ හැකිය.

**මූඛ්‍ය පද :** ස්ථුලතාවය, පරිභෝජනය

[1] ආර්ථික විද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, vndolapihilla@gmail.com

# විශ්වවිද්‍යාල සිසුන් ක්‍රීඩා සඳහා යොමු වීම.
# (කැලණිය විශ්වවිද්‍යාලය ඇසුරින්)

**ඩබ්. එන්. ඩී. එස්. එස්. වෙදමුණි**[1]

**සංක්ෂේපය**

විශ්වවිද්‍යාලය තුළ විද්‍යාර්ථයින් විෂය බාහිර ක්‍රියාකාරකම් ලෙස බොහෝ විට ක්‍රීඩා කටයුතුවල නිරත වීම බහුලව දක්නට ලැබේ. විද්‍යාර්ථීයා සිය පීඨයන් මත පදනම්ව ක්‍රීඩා වලට යොමුවන ආකාරය පිළිබඳ අධ්‍යයනය කිරීම අරමුණු කරගනිමින් මෙම අධ්‍යයනය සිදු කෙරිණි. මෙහිදී කැලණිය විශ්වවිද්‍යාලය තුළ දනට පවතින සමාජීය විද්‍යා පීඨය, මානව ශාස්ත්‍ර පීඨය, කළමනාකරණ හා වාණිජ පීඨය සහ විද්‍යා පීඨය යන පීඨ හතරම නියෝජනය වන පරිදි සසම්භාවී ව තොරාගත් විද්‍යාර්ථයින් 100 දෙනෙකු ඇසුරින් මෙම අධ්‍යනයට අවශ්‍ය ප්‍රාථමික දත්ත රැස් කර ගන්නා ලදී .ඒ සඳහා ප්‍රශ්නාවලි ක්‍රමය සහ සම්මුඛ සාකච්ඡා ක්‍රමය යන දත්ත රැස් කිරීමේ මාර්ග යොදා ගන්නා ලදී. එසේ රැස් කර ගන්නා ලද දත්ත සංඛ්‍යාන විද්‍යාත්මක ක්‍රම අතර වන කේන්ද්‍රීය ප්‍රවණතා මිනුම් ආශ්‍රයෙන් විශ්ලේෂණය සිදු විය. මෙම අධ්‍යනය අවසානයේ අනාවරණය කරගත් කරුණු වූයේ මානව සහ සමාජීය විද්‍යා පීඨ වල සිසුන්ගෙන් 80% කිසිදු ක්‍රීඩාවක නිරත නොවේ. එමෙන්ම ක්‍රීඩාවට යොමුවන ඉතිරි 20% බොහෝ විට පාසල් මට්ටමේ ක්‍රීඩාවලට යොමු වීමෙන් ලද අත්දැකීම් හේතුවෙන් විශ්වවිද්‍යාලය තුළ ද ක්‍රීඩාවක නිරත වීමට හේතු වී ඇති අතර වැඩි දුර කරුණු විමර්ශනයේදී අනාවරණය විය. නමුත් විද්‍යා පීඨ සිසුන්ගෙන් 50% ආසන්න ප්‍රමාණයක් මෙන්ම වාණිජ සහ කළමනාකරණ පීඨයෙන් 35% ආසන්න ප්‍රමාණයක් ක්‍රීඩා සඳහා යොමු විමේ ප්‍රවණතාවක් දක්නට ලැබේ. එහිදී අනාවරණය වූ තවත් වැදගත් කරුණක් වූයේ, විද්‍යා පීඨයේ සිසුන්ගෙන් බහුතරය හුදු විනෝදාස්වාදය සඳහා පමණක් ක්‍රීඩා කටයුතුවල නිරත වන බවයි. මේ අනුව පෙනී යන්නේ, සමස්තයක් වශයෙන් ගත් විට විශ්වවිද්‍යාලය තුළ ක්‍රීඩාව සඳහා විද්‍යාර්ථීයාගේ යොමු වීම පහළ මට්ටමක එනම් 25% වඩා අඩු මට්ටමක පවතින බවයි. විශ්වවිද්‍යාලය තුළින් ක්‍රීඩාව සඳහා සැපයන සම්පත්වලින් මීට වඩා ඵලදායී ලෙස උපයෝජනය කර ගැනීම සඳහා විද්‍යාර්ථීන් ක්‍රීඩාව සඳහා යොමු කරගත හැකි නව ප්‍රවේශ ගැන අවධානය යොමු කළ යුතුය.

**මුඛ්‍ය පද :** ක්‍රීඩා, විශ්වවිද්‍යාලය, විද්‍යාර්ථීයා

[1] ආර්ථික විද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, wedamunisammani@gmail.com

# මව්වරු විදේශ රැකියා සඳහා යොමුවීම මත ඔවුන්ගේ දරුවන්ගේ අධ්‍යාපනික තත්ත්වය

අයි. පී. හෂිනි සමුද්‍රිකා[1]

**සංක්ෂේපය**

අතීතයේ මව විසින් සිය දරුවන්ට සමාජ සිරිත් විරිත් නීති රීති අධ්‍යාපනය ලබා දුන් අතර වර්තමානය වන විට, නොයෙකුත් හේතු කාරණා හමුවේ එවැනි දේ දුරස්ව යමින් පවතියි. බොහෝ මව්වරු විදේශ ගත වීමට වැඩි නැඹුරුතාවයක් දක්නට ලැබේ. අධ්‍යාපනය යනු, පොත්පත් වල ඇති දැනුම පමණක් නොව දරුවන්ට සිරිත් විරිත් හැදියාව පිළිබඳ දැනුම ද අත්‍යාවශ්‍ය වේ. එය පිරිපුන් දරුවෙක් නිර්මාණයට අත්‍යාවශ්‍ය වේ. ඊට මූලිකව ම දරුවා සමජානුයෝජනය වන්නේ පවුල තුළිනි. නමුත් මව විදේශගත වීමේදී දරුවන් නිවැරදි ලෙස සමාජානුයෝජනය නොවන අතර මවක් විසින් ඉටුකළ යුතු කාර්යය අවාසනාවන්ත ලෙස මග හැරී යයි. ඒ අනුව, මව විදේශ ගත වීම දරුවන්ගේ අධ්‍යාපනයට කොතරම් බලපාන්නේද ද යන්න සොයා බැලීම මෙම පර්යේෂණයේ අරමුණයි. අධ්‍යයනය සඳහා වේයන්ගොඩ ප්‍රදේශය අවට එලෙස මව විදේශ ගත ව සිටින පවුල් 20 ක් තෝරා ගත් අතර සම්මුඛ සාකච්ජා හා ප්‍රශ්නාවලි ක්‍රමය මගින් අවශ්‍ය දත්ත ලබා ගන්නා ලදී. සංඛ්‍යාත්මක විධික්‍රම යොදා ගෙන දත්ත විශ්ලේෂණය කරන ලදී. අධ්‍යයන නිගමනයන්ට අනුව බොහෝ දරුවන් උසස් අධ්‍යාපනයක් නොලැබූ අය බව හෙළිවිය. එය 75 % ක් පමණ විය. එහිදී 40% ක් පමණම අ.පො.ස. සා/පෙළ අසමත් වූ දරුවන් බව අනාවරණය වූ අතර 30% ක් අ.පො.ස. උ/පෙළ අසමත් වූ බව අනාවරණය කර ගන්නා ලදී. මෙහිදි අනාවරණය වන කාරණයක් නම්, පවුල් පරිසරය තුළ දුගී බව අසරණ බව පියවරුන්ගෙන් පවුලට ලැබෙන දායකත්වය අඩු බව වැනි කාරණා හමුවේ දරුවන්ගේ පවුලේ අභිවෘද්ධිය දැකීමට කාන්තාවන් විදේශ ගත වන බවයි. අවසන් ප්‍රතිඵලය වන්නේ, දරුවන්ගේ අධ්‍යාපනය අහිමි වී යාමයි.

**මුඛ්‍ය පද :** දරුවා, මව, සමාජානුයෝජනය

[1] ආර්ථික විද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, hasinisamudrika897@gmail.com

# ශ්‍රී ලංකාවේ සියදිවි නසාගන්නන්ගේ වයස් කාණ්ඩය හා ඊට පෙළඹන හේතු හඳුනා ගැනීම.

**එම්. පී. ඩී. සඳමාලි**[1]

**සංක්ෂේපය**

ශ්‍රී ලංකාව තුළ පසුගිය වසර ගණනාවක් තිස්සේ විවිධ ආකාරයෙන් සිදු වූ සියදිවි නසාගැනීම් රාශියක් වාර්තා වී ඇත. ලෝක සෞඛ්‍ය සංවිධානයේ සමීක්ෂණවලට අනුව ශ්‍රී ලංකාව රටවල් 172ක් අතුරින් ඉහළ සියදිවි නසාගැනීම් අතර හතරවන ස්ථානයේ පවතී. මේ ආකාරයෙන් ශ්‍රී ලංකාවේ වසරකට ජනගහනයෙන් 4000ක් පමණ මෙම තත්ත්වයට මුහුණපාන ලබන බව මානසික සෞඛ්‍ය පිළිබඳ ජාතික ආයතනයේ ප්‍රධානියා වන ආචාර්ය නීල් ප්‍රනාන්දු විසින් සිදු කළ සම්මන්ත්‍රණයකින් පළ වු වාර්තාවකට අනුව හෙළි වී ඇත. මේ අනුව සියදිවි හානිකර ගැනීමට කුමන වයස් කාණ්ඩයන් වැඩි වශයෙන් පෙළඹෙන්නේ ද යන ගැටලුව පාදක කරගනිමින් මෙම අධ්‍යයනය සිදු කර ඇත. මෙම අධ්‍යයනයේ අරමුණ වන්නේ, සියදිවි හානිකරගන්නා පුද්ගලයන්ගේ වයස් කාණ්ඩයන් හා ඊට හේතු හඳුනා ගැනීමයි. පර්යේෂණය සඳහා ද්විතියික දත්ත භාවිත කළ අතර ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව, පොලිස් වාර්තා, ජන මාධ්‍ය මගින් දත්ත ලබා ගන්නා ලදි. ප්‍රමාණාත්මක දත්ත විශ්ලේෂණ ක්‍රමය මඟින් අනාවරණය වූයේ, 1990 සිට 2011 කාලය තුළ වයස අවුරුදු 15 ත් 44 ත් අතර පුද්ගලයන් වැඩි වශයෙන් පෙලඹී ඇති බවයි. එමෙන්ම එම කාලය තුළ දී විෂ පානය කිරීමෙන් මියයන පුද්ගලයින්ගෙන් වැඩි ප්‍රමාණයක් අවුරුදු 17 ත් 25 ත් අතර කාන්තාවන් හා අවුරුදු 55 ට වැඩි පුරුෂයන් වේ. එමෙන්ම ගෙල වැළලා ගැනීමෙන් සියදිවි හානිකරගන්නා පුද්ගලයින්ගෙන් වැඩි ප්‍රමාණයක් අවුරුදු 17 ත් 25 ත් අතර කාන්තාවන් හා අවුරුදු 55 ට වැඩි පුරුෂයන් බව අනාවරණය විය. මෙම මරණ සඳහා ලිංගික ප්‍රචණ්ඩත්වය, අධ්‍යාපන කටයුතු මෙන්ම මානසික පීඩාවන් ද වැඩි වශයෙන් බලපා තිබුණි. මේ ආකාරයෙන් සියදිවි හානිකරගන්නා පුද්ගලයින්ගෙන් 80% ක් පමණ වයස අවුරුදු 17 ත් 25 ත් හා වයස අවුරුදු 55 ට වැඩි වයස් කාණ්ඩ වලට අයත් වන බව අනාවරණය විය.

**මුඛ්‍ය පද :** සියදිවි හානිකරගැනීම, වයස් කාණ්ඩය, ස්ත්‍රී පුරුෂ භාවය, විෂ පානය

[1] ආර්ථික විද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, dinushasadamali125@gmail.com

# Usages of voice recognition and personal assistant for undergraduate students

**M. G. R. V. Gunasekara[1]**

## Abstract

A voice recognition system is a system that detects and recognizes human voices. Personal assistant systems are just like a human personal assistant, a person assistant programme can do almost everything that a human personal assistant do, such as keeping your daily schedule, remind you the events that you have to attend etc. Every undergraduate has considerable workload to cover in each semester. If students can use a personal assistant system, they can manage their workload easily. The purpose of this study is to determine the usages of voice recognition and personal assistant programs for students. This research is primarily qualitative in nature, where the survey conducted based on the analysis of primary data and secondary data. Primary data was collected from a randomly selected sample of 200 students from "University of Kelaniya (Faculty of computing and technology)" and "Sri Lanka Institute of Information Technology (Faculty of computing)" by using a questionnaire. The conclusions reached from this study were that out of 200 respondents 45% of students used voice recognition and personal assistant systems. When we consider about those institutes, both of them have closer percentages for this. However, the percentage of using it by the students of Sri Lanka Institute of Information Technology is higher than the students from University of Kelaniya. These systems can improve the student's knowledge: it will help them with studies and will keep students updated with everything. Nevertheless, the problem is even though these kind of features are available, many students have not any idea about them.

**Keywords :** voice recognition, personal assistant system, under graduate students.

[1] Department of Economics, University of Kelaniya, rashgunasekara1994@gmail.com

# ශ්‍රී ලංකාවේ රිය අනතුරු පිළිබඳ අධ්‍යනයක් (2006 සිට 2015 දක්වා සහ 2015.01.01 සිට 2016.09.30 දක්වා )

බී. පී. එස්. පී. කේ. පතිරත්න[1]

## සංක්ෂේපය

රිය අනතුරු සමාජයට අවාසිදායක සංසිද්ධියකි. සෘජුවම සිදුවන ජීවිත හානි, අංගවිකල වීම හා දේපළ හානි හැරුණු විට නිෂ්පාදන ධාරිතාවට සිදුවන හානි, අලුත් වැඩියා කිරීම් සඳහා වන වියදම් සහ රක්ෂණ වැය වැනි නොපෙනෙන හානිද සිදුවේ. මෙම හානි නියත වශයෙන්ම රටෙහි ආර්ථිකයට බලපෑම් ඇති කරන බැවින් රිය අනතුරු හා එමගින් සිදුවන හානි අවම කර ගැනීමට උත්සහ කළ යුතුය. රිය අනතුරු සිදුවීමේ ප්‍රවණතාවය පිළිබඳව විශ්ලේෂණය කිරීම මෙන්ම රිය අනතුරු සිදුවීමට ප්‍රධාන හේතුන් හා එම අනතුරු වළක්වා ගැනීම කළ යුතු ආකාරය පිළිබඳව අධ්‍යයනය මෙහි අරමුණ වේ. මෙහිදි ශ්‍රී ලංකා පොලිස් රථවාහන මූලස්ථානයේ වාර්තාවන් ද්වීතීක දත්ත ලෙස භාවිතා කර ඒවා වගු, වට ප්‍රස්තාර ,තීරු ප්‍රස්තාර හා රේඛීය සටහන් මගින් ඉදිරිපත් කර ඇති අතර මාරක අනතුරු වලට උදාහරණ ලෙස ඡායාරූප කිහිපයක් ද දක්වා ඇත. දත්ත විශ්ලේෂණය කිරීමෙන් අනතුරුව 2006 සිට 2015 දක්වා වසර දහයක කාලයක් තුළ රිය අනතුරුවලින් මියගිය ගණන මුළු අනතුරුවලින් 7% පමණ වන බව ගණනය කළ හැක. එසේම සලකා බැලූ 2015.01.01 සිට 2016.09.30 දක්වා කාලය තුළ සිදු වූ මාරක අනතුරු වලට වැඩි වශයෙන් වගකිව යුතු වන්නේ මෝටර් යතුරුපැදි වන අතර එය මුළු අනතුරුවලින් 40% පමණ වේ. එසේම එම රිය අනතුරුවලින් මියගිය මගීන්ගෙන් 70% පමණ පුරුෂයින් වේ. මාරක රිය අනතුරු සිදුවීමට තුඩු දෙන හේතුන් අතුරින් ප්‍රධාන හේතුව වන්නේ, අපරීක්ෂාකාරි හා නොවිමසිලිමත් ලෙස රිය පැදවීම වන අතර 52% මාරක අනතුරු මේ හේතුවෙනුත් 5% බීමතින් රිය පැදවීම නිසා සිදු වී ඇත. මෙලෙස ශ්‍රී ලංකාව තුළ වසර දහයක කාලයක් තුළ සිදු වී ඇති වාර්තා වූ රිය අනතුරු ගණන දළ වශයෙන් 360,704 පමණ වන බව වාර්තා වන අතර ජීවිත හානි හා දේපළ හානි ද විශාල ප්‍රමාණයක් වේ. රථවාහන නීති රීති වලට අනුව පරීක්ෂාකාරි හා විමසිලිමත් ලෙස බීමතින් තොරව රිය පැදවීමෙන් හා සැලකිලිමත් ලෙස මාර්ගයේ ගමන් කිරීමෙන් රිය අනතුරු වලක්වා ගැනීම කාලීන අවශ්‍යතාවක් මෙන්ම අනිවාර්ය කටයුත්තකි.

**මුඛ්‍ය පද** : රිය අනතුරු, මාරක අනතුරු, ජීවිත හානි

[1] ආර්ථිකවිද්‍යා අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, sajanipathirathna.9494@gmail.com

# ශ්‍රී ලංකාවේ නිදන්ගත වකුගඩු රෝගය ව්‍යාප්ත වීම සඳහා බලපාන සමාජීය, ආර්ථික සාධක

**එම්. පී. ඒ. ඩබ්ලිව්. පතිරාජ**[1]

## සංක්ෂේපය

නිදන්ගත වකුගඩු රෝගය ලෝක ව්‍යාප්ත ප්‍රධාන සෞඛ්‍යය ගැටලුවක් ව පවතියි. මෙම රෝගයට නිශ්චිත හේතුවක් සොයා ගැනීමට නොහැකි වූ හෙයින් නොදන්නා හේතුවක් නිසා හටගත් නිදන්ගත වකුගඩු රෝගය ලෙස හඳුන්වනු ලැබේ. ක්‍රම ක්‍රමයෙන් වකුගඩුවල ක්‍රියාකාරීත්වය පිරිහෙන අතර කාලයත් සමඟ මෙම අත්දැකීම රෝගියාට පමණක් නොව පවුල්වල සාමාජිකයන්ට ද විශාල වශයෙන් බලපෑමක් සිදු කිරීමට සමත් වී ඇත. මෙම රෝගයට ප්‍රතිකාර ලෙස වකුගඩු බද්ධ කිරීම හා රුධිර කාන්දුකරණය කිරීම සිදුකරන අතර මේ සඳහා විශාල පිරිවැයක් දැරීමට සිදු වී ඇත. නිදන්ගත වකුගඩු රෝගය ශ්‍රී ලංකාවේ උතුරු මැද පළාතේ පසුගිය දශක කිහිපය තුළ පවතින ප්‍රධාන සෞඛ්‍යය ගැටලුවක් බවට පත්ව ඇත. ඒ අනුව මෙම අධ්‍යයනයේ පර්යේෂණ ගැටලුව වන්නේ, නිදන්ගත වකුගඩු රෝගය උතුරු මැද පළාතේ ව්‍යාප්ත වීම සඳහා බලපාන සමාජයීය ආර්ථික සාධක මොනවාද යන්න හඳුනා ගැනීමය. අධ්‍යයනයේ අරමුණ වන්නේ, වකුගඩු රෝගයේ ව්‍යාප්තිය සඳහා බලපාන ප්‍රධාන සාධක රාශියක් පවතින බව පෙන්වා දීමය. මෙහිදී පර්යේෂකයා විසින් යෝග්‍යය පර්යේෂණ ක්‍රමවේදයක් අනුගමනය කරන ලදි. සසම්භාවී නියදි ක්‍රමය යටතේ, වැඩිම වකුගඩු රෝගීන් ප්‍රමාණයක් වාර්තා වන අනුරාධපුර ප්‍රධාන රෝහලේ වකුගඩු ඒකකය මඟින් පවත්වන වකුගඩු සායනය සඳහා පැමිණෙන රෝගීන් අධ්‍යයනය සඳහා තෝරා ගන්නා ලදී. සායනය සඳහා පැමිණි රෝගීන් 200 ක් අතරින් රෝගීන් 100 අහඹු ලෙස තෝරාගත් අතර ව්‍යුහගත සම්මුඛ සාකච්ඡා ක්‍රමය අනුගමනය කරමින් දත්ත රැස් කරගන ඇත. දත්ත දායකයින් ලබා දුන් පිළිතුරුවල සමස්තය සංඛ්‍යාත්මකව පෙළගස්වා පිළිතුරු සඳහා වූ හේතු පදනම් කරගනිමින් SPSS මෘදුකාංගය මඟින් විස්තරාත්මක දත්ත විශ්ලේෂණයක් සිදු කර ඇත. දියුණු රටවල නිදන්ගත වකුගඩු රෝගය සඳහා බලපාන ප්‍රධාන සාධක ලෙස ස්ථුලතාවය , අධික රුධිර පීඩනය, දියවැඩියාව වැනි සාධක හඳුනා ගෙන ඇති අතර ලංකාවේ කෘෂිකාර්මික ආර්ථික රටාවක් පවතින බැවින්, කෘෂිකාර්මික ක්‍රියා කලාපයන්ගේ ප්‍රතිඵලයක් ලෙස රෝගයේ ව්‍යාප්තිය සිදු වී ඇති බව පර්යේෂකයන්ගේ අදහසයි. මෙම අධ්‍යයනයේ අවසන් නිගමනය වන්නේ, කෘමිනාශක භාවිතය, ෆ්ලෝරයිඩ් අඩංගු ජලය පානය කිරීම, බැර ලෝහ ශරීරගත වීම, පොහොර භාවිතය, ආසනික්, විජලනය, මධ්‍යසාර භාවිතය, දුම් පානය කිරීම වැනි සාධක රෝගයේ ව්‍යාප්තියට බලපාන ප්‍රබල සාධක වශයෙන් හඳුනා ගෙන ඇත. මෙහි අවසාන ප්‍රතිඵලය ලෙස ස්ත්‍රී පුරුෂ බව, සමාජයීය සාධක, ආර්ථික සාධක, ආහාර රටා, ජීවන රටා, ජල මූලාශ්‍ර යන කරුණු මෙම රෝගයට හේතු සාධක වන බව පෙන්වා දිය හැකිය. මේ අනුව වකුගඩු රොගයේ ව්‍යාප්තිය සඳහා බලපාන සාධක රාශියක් පවතින බව පෙන්වා දිය හැකි ය.

**මුඛ්‍ය පද :** නිදන්ගත වකුගඩු රෝගය, වකුගඩු රොගයේ ව්‍යාප්තිය, බෝ නොවන රෝග, ආහාර රටා

[1] ආර්ථික විද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, ayeshani128@gmail.com

# රූපවාහිනි මාධ්‍යය මගින් ආබාධිත රණවිරු ප්‍රජාව කෙරෙහි සිදු කරන බලපෑම පිළිබඳ අධ්‍යයනයක්

**ඩී. එස්. පී. දිසානායක**[1]

**සංක්ෂේපය**

උපතින් ආබාධිතයන් නොවූ බොහොමයක් ලාංකීය සමාජය තුළ පැවති යුද්ධය හේතුවෙන් ආබාධිත තතත්වයට පත්ව ඇත. මෙම අධ්‍යයනයෙන් ආබාධිත රණවිරු ප්‍රජාව රූපවාහිනී මාධ්‍යය භාවිතය තුළ ඔවුන්ගේ මනෝභාව ගොඩනගා ගන්නේ කෙසේද යන්න විමර්ශනය කෙරිණි. රාගම රණවිරු සෙවනේ සාමාජිකයන් 100 ක් ඇසුරින් ලබාගත් නියැදියක් මඟින් මෙම අධ්‍යයනය කරන ලදි. රූපවාහිනි මාධ්‍ය මගින් ආබාධිත රණවිරු ප්‍රජාව කෙරෙහි සිදු කරන බලපෑම අධ්‍යයනය කිරීම මෙහි මූලික අරමුණ විය. සමීක්ෂණ ක්‍රමය යටතේ, ප්‍රශ්නාවලි ක්‍රමය හා සම්මුඛ සාකච්ඡා ක්‍රමය මගින් ප්‍රාථමික දත්ත රැස් කර ගනිමින් මෙම අධ්‍යයනය සිදු කරන ලදී. නියැදිය අධ්‍යයනය කිරීමෙන් ලබාගත් තොරතුරු බොහෝමයක් ගුණාත්මක දත්ත වන බැවින් ඒ සඳහා SPSS ක්‍රමය භාවිත කරමින් දත්ත විශ්ලේෂණය කරන ලදී. දත්ත විශ්ලේෂණය අනුව 30% ගේ මානසිකත්වය ගොඩැගීම උදෙසා ධර්මදේශනා හා සංගීතමය වැඩසටහන් මූලික වන බවත් ටෙලිනාට්‍යය හා රූපලාවන්‍යය වැඩසටහන් ,වෙළඳ දැන්වීම් 70% මානසික ව්‍යාකූලතා ඇතිකරන බවත් දක්නට ලැබිණි. බෞද්ධයන් වෙනුවෙන් රූපවාහිනි සේවාවක පවත්වාගෙන යන ලාංකීය රූපවාහිනී ක්ෂේත්‍රය ආබාධිතයන් වෙනුවෙන් ද වෙන්වූ රූපවාහිනි සේවාවක් පවත්වාගෙන යාම සහ ආබාධිතයන් වෙනුවෙන්ම වෙන් වූ වැඩසටහන් නිෂ්පාදනය හා ඒ ඔස්සේ ස්වයං රැකියා අවස්ථා උදාකරගැනීමට කටයුතු කිරීම තුළින් සෘණ ආකල්ප සහිත ආබාධිත මානසිකත්වය තුලිත කර ගැනීමට මාර්ග විවෘත කරදිය යුතු බව යෝජනා ලෙස ඉදිරිපත් කළ හැක.

**මුඛ්‍ය පද :** ආබාධිත, රූපවාහිනි මාධ්‍ය, මනෝභාව, ව්‍යාකූලතා

[1] ජනසන්නිවේදන අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, sanikapriyanjali@gmail.com

# විද්‍යාර්ථීන් තම අධ්‍යයන අරමුණු සඳහා අන්තර්ජාලය භාවිතා කරනු ලබන ආකාරය (කැලණිය විශ්වවිද්‍යාලය ඇසුරින්)

ඒ. ඒ. එස්. ඩී. අධිකාරි[1]

**සංක්ෂේපය**

වර්තමානයේ විද්‍යාව හා තාක්ෂණයේ දියුණුවත් සමඟ සමාජයේ බහුල වශයෙන් නව තාක්ෂණය කෙරෙහි වඩාත් නැඹුරුවක් දක්වන බව පෙනී යයි. එනම්, ලෝක ජනගහනයෙන් බිලියන 3.5 ක් පමණ අන්තර්ජාලය භාවිත කරන බවට අනාවරණය වී ඇත. එහිදී විශ්වවිද්‍යාලයේ විද්‍යාර්ථීන් අතර අන්තර්ජාලය භාවිතය ඉතාමත් සුලභ දසුනක් වන අතර ඔවුන් සමාජීය, විනෝදාත්මක හා අධ්‍යයන අරමුණු සඳහා අන්තර්ජාලය භාවිත කරනු ලබයි. ඒ අනුව කැලණිය විශ්වවිද්‍යාලයේ විද්‍යාර්ථීන් වැඩි කාලයක් අන්තර්ජාලය භාවිත කරනුයේ කුමන කාර්යයන් සඳහා ද යන්න පිළිබඳ ව මෙම අධ්‍යයනය තුළින් විමර්ශනය කර ඇත. විශ්ලේෂණය සඳහා ප්‍රධාන වශයෙන් ප්‍රාථමික දත්ත භාවිතා කළ අතර ප්‍රශ්නාවලියක් තුළින් අවශ්‍ය දත්ත රැස් කරන ලදී. මේ සඳහා සියලුම පීඨ නියෝජනය වන පරිදි කැලණිය විශ්වවිද්‍යාලයේ විද්‍යාර්ථීන් 92 කින් යුත් සසම්භාවී නියැදියක් භාවිතා කළ අතර රැස් කරන ලද දත්ත විශ්ලේෂණය සඳහා විස්තරාත්මක සංඛ්‍යාන ක්‍රම ශිල්ප උපයෝගී කොටගෙන ඇත. ඒ අනුව මෙම විමර්ශනය තුළින් විද්‍යාර්ථීන් 75% පමණ ප්‍රතිශතයක් වෙබ් අඩවි ඔස්සේ තොරතුරු සෙවීම සඳහාත්, 40.2% පමණ පිරිසක් තොරතුරු භාගත කිරීම (download) සඳහාත් නිරන්තරයෙන් අන්තර්ජාලය භාවිතා කරනු ලබයි. එමෙන්ම 50%ක පමණ ප්‍රතිශතයක් කිසිදිනෙක විශ්වවිද්‍යාල ආචාර්යවරුන් සමඟ අන්තර්ජාලය ඔස්සේ සම්බන්ධ වෙමින් අධ්‍යයන කටයුතු සිදු නොකරන අතර 94.6% පමණ විද්‍යාර්ථීන් කිසිදිනෙක අන්තර්ජාලයට තොරතුරු උත්පතනය (upload) කර නොමැති බවත් අනාවරණය විණි. ඒ අනුව විද්‍යාර්ථීන් අන්තර්ජාලයට තොරතුරු උත්පතනය කිරීමට වඩා තොරතුරු භාගත කිරීමෙහිලා වඩාත් නැඹුරුවක් දක්වන අතර තොරතුරු සෙවීම, තොරතුරු භාගත කිරීම හා යහළුවන් සමඟ තොරතුරු හුවමාරු කිරීම යන අධ්‍යයන අරමුණු සඳහා බහුලව අන්තර්ජාලය භාවිත කරනු ලබන බවට නිගමනය විය.

**මුඛ්‍ය පද :** විද්‍යාර්ථීන්, අන්තර්ජාලය, අධ්‍යයන අරමුණු

[1] ආර්ථික විද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය,
samikadinashki @gmail.com

# විශ්වවිද්‍යාල ප්‍රවේශය කෙරෙහි ශිෂ්‍යත්ව විභාගයේ බලපෑම පිළිබඳ අධ්‍යයනයකි. (හම්බන්තොට දිස්ත්‍රික්කය ඇසුරිනි)

**ඩබ්. ජී. ආර්. රුවන්ති[1]**

**සංක්ෂේපය**

අනාගත ආයෝජනයක් වශයෙන් හඳුනාගෙන තිබීමත් අත්වන ප්‍රතිලාභයන් ඉහළ වටිනාකමකින් යුක්ත වීමත් නිසා වර්තමාන ලෝකයේ අධ්‍යාපන ක්ෂේත්‍රයට ප්‍රමුඛස්ථානයක් හිමි වී ඇත. එබැවින් අධ්‍යාපනය වඩාත් තරඟකාරී ස්වරූපයක් උසුලයි. ශ්‍රී ලංකාවේ තරඟකාරී විභාග ද්විත්වය වන 5 ශ්‍රේණිය ශිෂ්‍යත්ව විභාගය හා අ.පො.ස. උසස් පෙළ විභාගය යොදා ගනිමින් ශිෂ්‍යත්ව විභාගය විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා බලපෑමක් ඇති කරයි ද යන ගැටලුවට විසඳුම් මෙම පර්යේෂණය මඟින් අපේක්ෂා කරයි. ඒ අනුව "ශිෂ්‍යත්ව විභාගය විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා බලපෑමක් ඇති නොකරයි" යන කල්පිතය මත පදනම් වෙමින් උක්ත වූ විභාග අතර පවතින සබඳතාවයේ ආකාරය කෙබඳු ද යන්න පරීක්ෂා කිරීමේ ප්‍රධාන අරමුණ යටතේ, මෙම පර්යේෂණය සිදු කර ඇත. හම්බන්තොට දිස්ත්‍රික්කයේ තංගල්ල අධ්‍යාපන කලාපය තුළ 2015 වර්ෂයේ අ.පො.ස. උසස්පෙළ විභාගයට පෙනී සිටි අයදුම්කරුවන් 3142 ක් අතරින් 100ක නියැදියක් විශ්වවිද්‍යාල ප්‍රවේශය ලද 239 ක් වූ අයදුම්කරුවන්ගෙන් 50 ක් හා ප්‍රවේශය නොලද 2698 ක් වූ අයදුම්කරුවන්ගෙන් 50ක් ලෙස සරල සසම්භාවී ක්‍රමවේදය යටතේ තෝරා ගනිමින් ද්විතීක දත්ත මූලාශ්‍ර ආශ්‍රයෙන් දත්ත රැස් කිරීම සිදුවිය. අධ්‍යයන සීමා යටතේ අනෙකුත් සාධක ස්ථාවර ව තිබිය දී ශිෂ්‍යත්ව විභාගයේ සමත් හෝ අසමත් බව විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා අයදුම්කරුවන්ට බලපෑමක් ඇති කරන්නේ දැ යි යන්න පරීක්ෂා කිරීම සිදුවන අතර යොදාගත් විචල්‍යයන් එකිනෙකින් ස්වායත්ත වේ යයි උපකල්පනය කරයි. මෙම පර්යේෂණයට අදාළව ලබාගන්නා ලද දත්ත කයි වර්ග පරීක්ෂාව යටතේ විශ්ලේෂණ කළ විට, ගණනය කරන ලද අගය 1.89ක් හා වගු අගය 14.067ක් විය. ඒ අනුව ශිෂ්‍යත්ව විභාගය විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා බලපෑමක් ඇති නොවේ යයි උක්ත වූ කල්පිතය 5% වෙසෙසියා මට්ටම යටතේ 95%ක විශ්වසනීයත්වයකින් යුතු ව තහවුරු වන බව ප්‍රකාශ කළ හැකි ය. ඒ අනුව ශිෂ්‍යත්ව විභාගයේ සමත් හෝ අසමත් බව විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා බලපෑමක් ඇති නොකරන බව නිගමනය කළ හැකි ය.

**මුඛ්‍ය පද :** විශ්වවිද්‍යාල ප්‍රවේශය, 5 ශ්‍රේණිය ශිෂ්‍යත්වය, උසස් පෙළ විභාගය, තරඟකාරීත්වය

[1] ආර්ථික විද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, wgramesharuwanthi@gmail.com

# ශ්‍රී ලංකාවේ රාජ්‍ය සේවා නියුක්තිය,ආර්ථීක වර්ධනය කෙරෙහි ඇතිකරන බලපෑම

**එස්. යූ. මුතුමාල**[1]

**සංක්ෂේපය**

ශ්‍රී ලංකාවේ සමස්ත සේවා නියුක්ති මූලයන් ලෙස රාජ්‍ය අංශයේ සේවකයින්, පෞද්ගලික අංශයේ සේවකයින්, සේව්‍යයන්, ස්වයං රැකියාවන්හි නියුතු වුවන්, ගෙවීමක් නොලද පවුලේ සේවකයින් ලෙස ප්‍රභේදනය වී ඇත. මේ අතරින් මෙහිදී අවධානය යොමු කෙරෙනුයේ රාජ්‍ය සේවා නියුක්තිය ආර්ථීක වර්ධනය කෙරෙහි ඇතිකරන බලපෑමයි . ජාත්‍යන්තර ශ්‍රම ආයතනය දක්වන ප්‍රකාර ජාත්‍යන්තර මුල්‍ය අරමුදලේ 1933 ජාතික ගිණුම් ක්‍රමවේදය අනුව රාජ්‍ය අංශය යනු මධ්‍යම රජයත්, සියලුම ප්‍රාදේශිය හා පළාත් පාලන ආයතනත් එම ආයතන වලට අයත් සමාජ ආරක්ෂණ අරමුදල් හා රජයේ ඒකකයන් මගින් පාලනය වන වෙළඳපොළ හා ලාභ අරමුණු කර නොගත් ආයතනයනුත්‍ය. ඒ අනුව, අප රටේ රාජ්‍ය අංශයේ සේවා නියුක්තිය යන්නට මධ්‍යම රජය, පළාත් සභා, පළාත් පාලන ආයතන හා රජයට අයත් ව්‍යාපාර ආයතන වල සේවය කරන සියලුම සේවා නියුක්තිකයන් අයත් වේ. මෙම සේවා නියුක්තිකයන්ට ආරක්ෂක සේවය ද ඇතුලත්ව කර්මාන්ත හා සේවා යන අංශ ද්විත්වයේම ආර්ථීක කාර්යයන්හි නියැලී සිටින අතර එමගින් රටේ දළ දේශිය නිෂ්පාදිතය (ද.දේ.නි) සඳහා තම දායකත්වය සපයයි. ඒ අනුව මෙම රාජ්‍ය සේවා නියුක්තිය කෙතරම් දුරට ආර්ථීකයට බලපෑම් කර ඇත්ද යන්න විමසා බැලීම මෙම අධ්‍යයනයේ අරමුණයි. ඒ අනුව 2013 සිට 2015 දක්වා ශ්‍රී ලංකාවේ මහ බැංකුවේ වාර්තාවන් ද්විතීයික දත්ත ලෙස භාවිත කර ඒවා වගු, වට ප්‍රස්තාර, තීරු ප්‍රස්තාර හා රේඛීය සටහන් මගින් ඉදිරිපත් කර ඇත. දත්ත විශ්ලේෂණය කිරීමෙන් අනතුරුව රාජ්‍ය අංශයේ සේවා නියුක්තිය ගත් විට සමස්ත රාජ්‍ය අංශයෙහි 2014/2013 ප්‍රතිශත වෙනස 4.3% ක් වූ අතර 2015/2014 එය 1.5% ක් පෙන්නුම් කරයි. එසේම 2014 වර්ෂයට සාපේක්ෂව 2015 දී රාජ්‍ය අංශයේ රැකියා අවස්ථා පහළ ගොස් ඇති බව පෙනේ. එසේම ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සිදු කළ සමීක්ෂණයට අනුව 2015 වසරේ රාජ්‍ය අංශයේ සේවා නියුක්තිය, රාජ්‍ය හා අර්ධ රාජ්‍ය යන අංශ දෙකෙහිම සේවක සංඛ්‍යාව ඉහළ ගොස් ඇත. මෙලෙස මෙම අධ්‍යයනය රාජ්‍ය සේවා නියුක්තිය, ආර්ථීක වර්ධනය කෙරෙහි ඇතිකරන බලපෑම පිළිබඳ අධ්‍යනය කරනු ලැබේ.

**මුඛ්‍ය පද :** ආර්ථීක වර්ධනය, සේවා නියුක්තිය, රාජ්‍ය සේවා නියුක්තිය

[1] ආර්ථිකවිද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, shashikaushani@gmail.com

# The eligibility of pre – schools on early childhood development in Sri Lanka

**P. A. G. Madhushani**[1]

## Abstract

The early childhood is considered as the period of most rapid and critical development stage of a human life with greatest sensitivity to environmental influences. Presently, pre-schools play immensely significant role in the development of early childhood. According to the literature review, most of early childhood educational agencies and individuals that are engaged in providing early childhood education in Sri Lanka seem to have in general limited skills, inadequate training, remuneration and prestige. Hence, here by assumes, the overall development of children is not done properly through the pre-school in Sri Lanka. Objective of this study is to recognize the eligibility of pre-schools on early childhood development in Sri Lanka by considering the physical, intellectual and psycho-social development of pre-school children. The sample for this study is taken by randomly selected 4 pre-schools in divisional secretarial division of Minuwangoda and it is consisting of 20 children, 4 pre-school teachers and 20 parents of those children. The data were collected by the interview and observations on performance of the children. Through the results, the hypothesis is accepted and finally, it can be concluded, as the overall childhood development is not reasonably carried out through the pre-school education system in Sri Lanka. Withal, this study reveals that the importance of confirmation appropriate age for child to enter the pre-school, identification and registration of early childhood educational centres properly, standard qualifications and training for pre-school teachers and minimum criterion on the space of premises and structure of buildings of the pre-schools.

**Keywords:** Early childhood development, Pre-schools, Intellectual, Psycho-social

[1] Department of Economics, University of Kelaniya, gayeshi.m@gmail.com

# විශ්වවිද්‍යාල සිසුන් ක්‍රීඩා කටයුතු කෙරෙහි යොමු වීමේ ප්‍රවණතාව

ඩබ්. එච්. එස් .එල්. ප්‍රියදර්ශන[1]

**සංක්ෂේපය**

තරඟකාරි අධ්‍යාපන ක්‍රමය යටතේ සිසුන් බොහොමයක් ක්‍රීඩා කෙරෙහි යොමුවීම අදවන විට තරමක් මන්දගාමි ස්වරූපයක් ගෙන තිබේ. එහෙයින් විශ්වවිද්‍යාල සිසුන් ක්‍රීඩා කෙරෙහි යොමු නොවීම සඳහා බලපෑම් කරන හේතුන් හඳුනා ගැනීම මෙහි පර්යේෂණ අරමුණ විය.අධ්‍යයනය සඳහා කැලණිය විශ්වවිද්‍යාලයෙහි දෙවන වසර කලා පීඨයේ 100ක ගෙන් යුත් නියැදියක් තෝරාගන්නා ලදි. ප්‍රශ්නාවලි ක්‍රමය භාවිතයෙන් ප්‍රාථමික දත්ත රැස් කරගන්නා ලදී. අධ්‍යයන තුලින් අනාවරණය වූ කරුණු අනුව නියැදියෙන් 56% ක් ක්‍රීඩා කටයුතු සඳහා යොමුවේ.44% ක් ක්‍රීඩා කටයුතු කෙරෙහි යොමු නොවන අතර ඉන් 32% ක් ගැහැණු ළමුන් වන අතර 12% ක් පිරිමි ළමුන් වේ. මෙමගින් අනාවරණය වූ කරුණක් වන්නේ, මෙම ක්‍රීඩා සඳහා යොමු නොවන පිරිස් බොහොමයක් තම පාසල් අධ්‍යාපනය ලබන කාලය තුල පවා ක්‍රීඩාවලට වැඩි රුචිකත්වයක් නොදක්වා ඇති බවයි. කෙසේ වෙතත් ක්‍රීඩා සඳහා යොමු වී ඇති කීපදෙනකු පාසල් අවධිය තුල ක්‍රීඩා නොකල පිරිස් විය . විශ්වවිද්‍යාලය තුළ ක්‍රීඩා කටයුතු කෙරෙහි යොමු නොවීමට හේතු  ලෙස ඉදිරිපත් වූයේ පාසල් අවදියේදීවත් ක්‍රීඩා නොකළ හෙයින් ක්‍රීඩා වල යෙදීමට ඔවුන්ට නොහැකි වේ යන අවිශ්වාසයයි. එසේම දේශන වාරගණන අසීමිතව පැවතීම තවත් ප්‍රධාන හේතුවක් විය. ක්‍රීඩා කණ්ඩායම්වල ජ්‍යෙෂ්ඨයන්ගෙන් ඔවුන්ට සිදුවන තාඩන පීඩන නිසා ද ක්‍රීඩා කටයුතුවලට යොමු වූවන් එයින් ඉවත් වී ඇත. තව සමහරක් කාලය මනාව කළමනාකරණය කරගැනීමේ නොහැකියාව මත ක්‍රීඩාව කෙරෙහි යොමු වී නැත. කෙසේ වෙතත් ක්‍රීඩාවේ ඇති වැදගත්කම අවබෝධ කරගනිමින් ඉදිරි අනාගතයේ යම් හෝ පැතිකඩක් සාර්ථක කරගැනීමට ක්‍රීඩාව මහඟු පිටිවහලක් වේ යන අරමුණ ඇතිව බොහොමයක් දෙනා ක්‍රීඩා කටයුතුවලට යෙදෙන බව හඳුනාගත හැකිය. අධ්‍යාපනයට පමණක් සීමා නොවී ක්‍රීඩා කටයුතු කෙරෙහිද යොමු වීම තුළින් තමන් ලඟා වීමට බලාපොරොත්තු වන ඉලක්ක කෙරෙහි පහසුවෙන් ලඟා වීමට අවශ්‍ය පසුබිම මේ හරහා නිර්මාණය කරගත හැකි බව මෙමගින් නිගමනය කල හැකිය.

**මුඛ්‍ය පද** : විශ්වවිද්‍යාලයීය ශිෂ්‍යයන්, ක්‍රීඩා, දේශන

[1] ආර්ථික විද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, whsudeera@gmail.com

# ශ්‍රී ලංකාවේ දේශපාලන සංස්කෘතිය , මැතිවරණ අපේක්ෂක සුදුසුකම් සහ ප්‍රජාතන්ත්‍රවාදය (කෑගල්ල දිස්ත්‍රික්කයේ මාවනැල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය ඇසුරින්)

**එම්. ආර්. එස්. මධුෂානි[1]**

**සංක්ෂේපය**

දේශපාලන සංස්කෘතිය යනුවෙන් හඳුනාගත හැක්කේ, යම් දේශපාලන සමාජයක් තුළ ජීවත්වන ජනතාව තුළ එම දේශපාලන ක්‍රමය හා එහි ක්‍රියාකාරිත්වය පිළිබඳ ඇති අවබෝධය තුළින් නිරූපණය වන දේශපාලන තත්ත්වයන්ගේ ස්වභාවය වේ. උපතින්ම දේශපාලන සත්ත්වයෙකු වන මිනිසාට හිමිවන දේශපාලන අයිතිවාසිකම් අතර ඡන්දය දීමේ අයිතිය මෙන් ම මැතිවරණ අපේක්ෂකත්වය දැරීමේ අයිතියද ප්‍රමුඛ ලෙසම හිමිවන අයුරු දැකිය හැකිවේ. රටක දේශපාලනමය අයිතීන් උපරිම ලෙස භුක්ති විඳීමෙහිලා ඉඩහසර පවතී නම්, එරට ප්‍රජාතන්ත්‍රවාදය ඉහළ මට්ටක පවතී. මැතිවරණ අපේක්ෂකත්වය දැරීමෙහිලා නිදහස් අවකාශ සලසා තිබීම තුළ එනම්, වයස අවුරුදු 21 ට වැඩි ඕනෑම ශ්‍රී ලාංකික පුරවැසියන්ට මැතිවරණ අපේක්ෂකත්වය දැරීමේ අයිතිය ලබාදීම තුළින් මොවුන් ඇතැම් විට දේශපාලන ක්‍රියාකාරිත්වය තුළ දූෂණ , වංචා , මිනීමැරුම් ආදී විවිධ අක්‍රමිකතා සිදුකිරීමට ඉඩකඩ ඇත. ඒ අනුව මැතිවරණ අපේක්ෂකත්වය සඳහා යම් උගත් බුද්ධිමත් බවක්, චරිතවත් බවක්, නීතිගරුක බවක් සලකා බැලීම යෝග්‍යවේය යන්න පිළිබඳව වර්තමානයේ කතිකාවක් බිහි වී ඇත. මෙම පර්යේෂණය ප්‍රධාන ලෙස ශ්‍රී ලංකාවේ දේශපාලන සංස්කෘතිය, මැතිවරණ අපේක්ෂකත්වය සඳහා පිළිගත් සුදුසුකම් ප්‍රමාණයක් නීතිගත කිරීම ප්‍රජාතන්ත්‍රවාදයට කවරාකාරයෙන් බලපෑම් කරන්නේද යන්න සොයා බැලීම සඳහා සිදු කර ඇත. ඒ සඳහා කෑගල්ල දිස්ත්‍රික්කයේ මාවනැල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය අධ්‍යයන ප්‍රදේශය ලෙස යොදාගත් අතර එම කොට්ඨාශයට අයත් ග්‍රාම නිලධාරි වසම් 71 ක් අතුරෙන් ස්තෘත සසම්භාවි නියැදුම් ක්‍රමය භාවිත කරමින් වයස අවුරුදු 18 ට වැඩි ඡන්දදායකයින් 100 දෙනෙකු හට ප්‍රශ්නාවලියක් ලබාදෙමින් තොරතුරු ලබා ගන්නා ලදි. සිදුකරන ලද පර්යේෂණය තුළින් ලබාගන්නා ලද ප්‍රමාණාත්මක දත්ත සරල සංඛ්‍යානමය විධික්‍රම භාවිත කරමින් ද ගුණාත්මක දත්ත විස්තරාත්මක ක්‍රමවේදය ඔස්සේ ද විශ්ලේෂණය කෙරේ. අධ්‍යයනයෙන් හෙළිවන අන්දමට නිගමනය කළ හැක්කේ වර්තමානය වනවිට ශ්‍රී ලංකාවේ පවතින්නේ සදාචාරාත්මක නොවන දූෂිත දේශපාලන සංස්කෘතියක් වන බවය. එහෙයින් යහපත් ආණ්ඩුකරණයක් බිහිකර ගැනීම උදෙසා මැතිවරණ අපේක්ෂකත්වය සඳහා ප්‍රජාතන්ත්‍ර විරෝධී නොවන පරිදි පිළිගත් සුදුසුකම් ප්‍රමාණයක් නීතිගත කිරීම තුළින් කටයුතු කළයුතු බව මෙම අධ්‍යයනයෙන් හෙළිවිය.

**මුඛ්‍ය පද :** ප්‍රජාතන්ත්‍ර විරෝධී, නීතිගත, සදාචාරාත්මක නොවන, දේශපාලන සංස්කෘතියක්

[1] ආර්ථික විද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, sasankamadushani91@gmail.com

# Significance of Tourism on Sri Lankan Economy: A Review

**H. D. P. Madushani**[1]

## Abstract

Tourism is one of the fastest growing industries globally, including in the developing world. The tourism industry is recognized by the Sri Lankan government as having a high economic potential. The aims of this study were to discuss Significance of Tourism on Sri Lankan Economy, and also to find evidence for any positive and negative effects of Tourism on Global and Sri Lankan Economy discussed in the literature. This review used 20 various research efforts from 1995 to 2015, using key words tourism, global tourism, tourism in Sri Lanka, economic impact of tourism, economic development, tourism planning. 60% of them mostly concerned of positive economic impacts of tourism. First, significant issues regarding of Tourism on Economy were identified. Due to the rise of the arrivals, tourism was able to upgrade its rank to the third level as the largest source of Foreign Exchange Earner of the national economy in 2015. Employment generated in the tourism sector (both direct and indirect) 319, 436 in 2015. Tourism exert beneficial effects upon balance of payments accounts and contribution to regional development, promote and finance infrastructural improvements and diversify economy and create new pattern of economic linkage in Sri Lanka. Then, as a result of a literature review and case studies, it was also found that tourism does not always have positive effects on economy and conversely, some negative effects, especially the import and export leakage could be obtained.The research findings indicated that with short-term and long-term strategic planning and using the specific abilities can solve the negative effects of tourism on Sri Lankan economy.

**Keywords:** Tourism, Economic impacts, Economic development, Sri Lanka

[1] Department of Economics, University of Kelaniya, Pavithra.hdm@gmail.com

# ප්‍රාදේශීය වශයෙන් ආර්ථික සංවර්ධනය සිදුවීමෙහිලා සුළු හා මධ්‍යම පරිමාණ කර්මාන්ත මගින් සිදුවන බලපෑම.

ඩබ්. ඩී. එල්. වෙලගෙදර[1]

**සංක්ෂේපය**

ඕනෑම ආර්ථිකයක වර්ධනය මෙන්ම සංවර්ධනය පිළිබඳ සාකච්ඡා කිරීමේ දී ඒ සමඟ බැඳී පවතින ආර්ථිකමය වැදගත්කමක් පවතින සංකල්පයක් ලෙසට සුළු හා මධ්‍යම පරිමාණ ව්‍යාපාර සංකල්පය හඳුන්වාදිය හැකිය. ගෝලීයකරණය හා ප්‍රාදේශීයකරණය තුළ මුහුණ දීමට සිදුව ඇති සමාජ හා ආර්ථික අභියෝගයන් ජයගැනීම සඳහා ඇති සාධ්‍යතාවයකින් යුතු උපායශීලි ක්‍රියා මාර්ගයක් වශයෙන් කුඩා හා මධ්‍යම පරිමාණ ව්‍යවසායන් ස්ථාපනය සිදුකිරීම අවශ්‍ය වේ. මේ අනුව මහනුවර දිස්ත්‍රික්කයට අයත් වන වැදගත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයක් ලෙසට හාරිස්පත්තුව ප්‍රාදේශීය කොට්ඨාසයට අයත් වන ග්‍රාම නිලධාරි වසම් 5 ක් තෝරා ගනිමින් සුළු හා මධ්‍යම පරිමාණ කර්මාන්ත නියැදිය තෝරා ගැනින. සසම්භාවිව තෝරා ගන්නා සියලුම ඒකක නියැදියට ඇතුළත් කර ගනිමින් පොකුරු නියැදීම යටතේ එක්පිය පොකුරු නියැඳුම් ක්‍රමය යොදා ගනු ලැබීය. දත්ත රැස්කිරීම සඳහා ප්‍රාථමික දත්ත මෙන්ම ද්විතික දත්ත යොදා ගන්නා අතර ප්‍රාථමික දත්ත යටතේ ප්‍රශ්නාවලි ක්‍රමය, සම්මුඛ සාකච්ඡා ක්‍රමය යොදා ගැනීම හා ද්විතික දත්ත යටතේ කාර්මික සංවර්ධන මණ්ඩලය මගින් ප්‍රකාශිත වාර්තා, ජන හා සංඛ්‍යා ලේඛන වාර්තා යනාදි පූර්වයෙන් ප්‍රකාශිත දත්ත යොදාගනු ලැබීය. ප්‍රධාන වශයෙන් ප්‍රශ්නාවලි ක්‍රමය මගින් දත්ත ලබා ගැනීමට අපේක්ෂා කරන අතර ව්‍යුහගත ප්‍රශ්නාවලි ක්‍රමයක් යොදා ගන්නා ලදී. දත්ත විශ්ලේෂණයේදි ලබා ගන්නා ප්‍රමාණාත්මක දත්තයන් විස්තරාත්මක සංඛ්‍යානය යටතේ මෙන්ම බහුගුණ ප්‍රතිපායන ආකෘතියක් මත පදනම් වෙමින් විශ්ලේෂණය සිදු කරන ලදී. ප්‍රස්ථාර, වගු සටහන් හා SPSS මෘදුකාංගය යොදාගනිමින් දත්ත විශ්ලේෂණය සිදු කෙරිණ. බහුගුණ ප්‍රතිපායන ආකෘතියක් මත පදනම් වීමේ දී තෝරාගත් එම ප්‍රදේශවල සැබෑ වශයෙන්ම ආර්ථික සංවර්ධනයක් සිදු වී ඇත්දැයි යන්න කල්පිත ගොඩනගා ගනු ලැබීය. මේ අනුව සුළු හා මධ්‍යම පරිමාණ කර්මාන්න සඳහා ඇති බාධක හා ගැටලු හදුනා ගැනීමත් සංවර්ධනය සඳහා රජය ගෙන ඇති විසඳුම් ප්‍රමාණවත්ද යන බව හා ප්‍රාදේශීය සංවර්ධනය උදෙසා සුළු හා පරිමාණ කර්මාන්ත අංශය තුළ නව යෝජනා හා නිගමන ඉදිරිපත් කිරීම සිදු කෙරිණ.

**මුඛ්‍ය පද :** කර්මාන්ත, සුළු හා පරිමාණ කර්මාන්ත, ව්‍යවසායකත්ව

[1] ආර්ථික විද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, danushalakmali1027@gmail.com

# බස්නාහිර පළාතේ ඩෙංගු රෝගය ව්‍යාප්ත වීම කෙරෙහි බලපාන සාධක හඳුනාගැනීම පිළිබඳ අධ්‍යයනයක්

**ඒ. ඒ. පී. එම්. මධුභාෂිණී**[1]

**සංක්ෂේපය**

ශ්‍රී ලංකාවේ අග නගරය මෙන්ම වාණිජ නගරය වීමත් පරිපාලන ආයතන රැසක් පිහිටා තිබීමත් නිසා කොළඹ දිස්ත්‍රික්කය කේන්ද්‍ර කරගත් බස්නාහිර පළාත ලංකාවේ වැඩිම ජනගහනයක් සිටින පළාත වේ. මේ නිසාම බස්නාහිර පළාත තුළ ආර්ථික, සමාජීය, දේශපාලනික, පාරිසරික ගැටලු රැසක් උද්ගතවී තිබේ. 'ඩෙංගු' අද නිරන්තරයෙන් කතාබහට ලක්වන ගැටලුවකි. ඩෙංගු රෝගයේ සීඝ්‍ර ව්‍යාප්තිය නිසා මිනිසාගේ කායික මානසික නිදහසට බාධා පැමිණීම, සෞඛ්‍ය වියදම වැඩිවීම, විහව නිමවුම අඩුවීම නිසා ආර්ථික සංවර්ධනයට බාධාවන තත්වයක් උද්ගත වී තිබේ. මේ නිසා බස්නාහිර පළාත තුළ ඩෙංගු රෝගය බහුල වශයෙන් ව්‍යාප්ත වීම කෙරෙහි බලපාන සාධක හඳුනා ගැනීමත් එම සාධක ඉවත් කිරීම සඳහා කටයුතු කළයුතු ආකාරය හඳුනා ගැනීම මෙම පර්යේෂණයේ අරමුණ වේ. ද්විතීයික දත්ත ඇසුරින් රැස්කරගත් දත්ත, විස්තරාත්මක සංඛ්‍යාන ශිල්ප ක්‍රම ඇසුරින් විශ්ලෙෂණය කරන ලදී. මේ අනුව ජනගහනයේ ව්‍යාප්තිය හා ඩෙංගු රෝගයේ ව්‍යාප්තිය අතර අනුලෝම සම්බන්ධයක් පවතින බව අනාවරණය විය. අධික ජනගහනය හේතුවෙන් අපද්‍රව්‍ය හා ජලය බැහැර කිරීම විධිමත් ආකාරයෙන් සිදු නොවීම නිසා මෙම ප්‍රදේශය තුළ ඩෙංගු රෝගයේ ව්‍යාප්තිය වැඩි වී තිබේ. ඩෙංගු රෝගයේ ව්‍යාප්තියට 47% ක දායකත්වයක් දක්වන්නේ භාජන වල ජලය එකතු වීමයි. මේ නිසා අනෙක් පළාත් වලට සාපේක්ෂව කසල කළමනාකරණ වැඩසටහන් විධිමත් ලෙස පැවැත්වීම, පරිසරය පිරිසිදුව තබා ගැනීම හා මදුරු මර්දන වැඩසටහන් වසරකට වැඩි වාර ගණනක් පැවැත්වීම සිදු කළ යුතු වේ.

**මුඛ්‍ය පද :** ඩෙංගු රෝගය, බස්නාහිර පළාත, ජනගහනය

[1] ආර්ථිකවිද්‍යා අධ්‍යන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, aapmm.piyumi@gmail.com

# ශ්‍රී ලංකාවේ සමානුපාතික නියෝජන ක්‍රමය යටතේ ජාතික ලැයිස්තු ක්‍රමයේ භාවිතාව පිළිබඳ අධ්‍යයනයක්

ජී. එන්. දිල්හානි හංසිකා[1]

## සංක්ෂේපය

ප්‍රජාතන්ත්‍රවාදී සංකල්පය තුළ දක්නට ලැබෙන ප්‍රධාන සංකල්පයක් වන නියෝජනය යනුවෙන් අදහස් කරනුයේ ජනතාවගේ අරමුණු මුදුන්පත් කර ගැනීම උදෙසා නියෝජිතයින් පත් කර ගැනීමට උපයෝගි කරගන්නා ක්‍රමයයි. ලෝකයේ බහුල වශයෙන් භාවිතයට ගනු ලබන ප්‍රධාන නියෝජන ක්‍රම දෙක වන්නේ බහුතර නියෝජන ක්‍රමය සහ සමානුපාතික නියෝජන ක්‍රමය වන අතර සමානුපාතික නියෝජන ක්‍රමය වඩාත් බහුලව ම භාවිතා කරන බව පූර්ව අධ්‍යයන වලින් අනාවරණය වී ඇත. ලංකාවේ සමානුපාතික නියෝජනය තුළ ජාතික ලැයිස්තු ක්‍රමය ප්‍රධාන අංගයකි. මැතිවරණයට ඉදිරිපත් නොවන එහෙත් ජනතාවට සේවයක් කළ හැකි උගත් බුද්ධිමත් පිරිසකගේ සේවය ලබා  ගැනීම උදෙසා මෙම ක්‍රමය ඇති කර තිබේ. ජාතික ලැයිස්තු ක්‍රමය මගින් අපේක්ෂිත අභිමතාර්ථ, එහි ක්‍රියාත්මකභාවයේදී ගැටලුවකට හසුව තිබේ ද යන්න අධ්‍යයනය කිරීම මෙම පර්යේෂණයේ අරමුණ වේ. මෙම අධ්‍යයනයට පාදක වූ මූලික ගැටලුව වන්නේ, ලංකාවේ නියෝජන ක්‍රමයෙහි අංග ලක්ෂණයක් වූ ජාතික ලැයිස්තු ක්‍රමය ක්‍රියාත්මකභාවයේ දී ගැටලු උද්ගත වන්නේ ද එසේ නම් ඒ මොනවාද යන්න හඳුනා ගැනීමයි. මෙහි සීමා ලෙස සමානුපාතික නියෝජන ක්‍රමයේ ලක්ෂණ අතුරින් ජාතික ලැයිස්තු ක්‍රමයට ප්‍රමුඛතාවය දක්වනු ලදි. අධ්‍යයන ක්‍රමවේදය ලෙස ප්‍රශ්නාවලි ක්‍රමය මඟින් ප්‍රාථමික දත්ත රැස් කර ගන්නා ලදී.එම දත්ත සංඛ්‍යාන විශ්ලේෂණයට භාජනය කිරිමෙන් අනතුරුව ජාතික ලැයිස්තු මගින් යම් ආකාරයකට ජනතා නියෝජනයක් සිදු වුව ද ඉන් අපේක්ෂිත අරමුණු ප්‍රායෝගිකව ඒ ආකාරයෙන් ම ඉටු වී නොමැති බව නිගමනය කළ හැකිය.

**මුඛ්‍ය පද :** මැතිවරණය, සමානුපාතික නියෝජනය, ජාතික ලැයිස්තු ක්‍රමය, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව

[1] ආර්ථික විද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, dilhanihansika9@gmail.com

# ශ්‍රී ලංකාවේ සරසවි සිසුන් සඳහා රජයේ සුබසාධන වියදම් වල කාර්යක්ෂමතාවය

**ඩී. එන්. ප්‍රනාන්දු**[1]

**සංක්ෂේපය**

විශ්වවිද්‍යාල වල ශිෂ්‍ය සුබසාධනය උදෙසා රජය විසින් විශාල මුදල් ප්‍රමාණයක් වාර්ෂිකව වැය කළ ද එම සේවාවන් කළමනාකරණය කිරීමේ ක්‍රමවේදයන් තුළ මෙන්ම සැපයෙන සේවාවන් තුළ ද දැඩි අකාර්යක්ෂමතාවයක් පවතින බව පෙනේ. එම නිසා රජය විසින් ලබාදෙන සුබසාධන වියදම් වල කාර්යක්ෂමතාව පිළිබඳව අධ්‍යයනය කිරීම මෙම සමීක්ෂණයේ අරමුණයි. එබැවින් මේ පිළිබඳව අධ්‍යයනයක් සිදු කිරීම සඳහා කැලණිය විශ්වවිද්‍යාලය ආශ්‍රයෙන් එහි විවිධ පීඨ වල ඉගෙනුම ලබන සිසුන්ගෙන් එක් එක් අධ්‍යයන වර්ෂ වල ඉගෙනුම ලබන සිසුන්ගෙන් ස්තරායන අහඹු නියැදි ක්‍රමය යටතේ 300 ක නියැදියක් තෝරා ගන්නා ලදී. එමෙන්ම එක් එක් පීඨවල ඉගැන්වීම් කටයුතු කරන ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරුන් මෙන්ම එකී පීඨවල සිසුන් සම්බන්ධයෙන් විවිධ මට්ටම් වල කටයුතු කරන ආචාර්යවරුන් ද ඇතුළත් වන පරිදි අහඹු නියැදි ක්‍රමය යටතේ 25 ක නියැදියක් තෝරා ගන්නා ලදී. එමෙන්ම පරිපාලන නිලධාරීන්ගේ ලැයිස්තුවක් සකස් කර එම ලැයිස්තුව තුළින් ද 10 දෙනෙකුගෙන් යුත් අහඹු නියැදියක් තෝරා ගන්නා ලදී. විශ්වවිද්‍යාල සිසුන්ගේ දත්ත රැස් කර ගැනීමේදී ප්‍රශ්න මාලා ක්‍රමය ද ආචාර්යවරුන්ගේ හා පරිපාලන නිලධාරීන්ගේ තොරතුරු ලබා ගැනීමේදී සම්මුඛ සාකච්ඡා ක්‍රමය ද භාවිතා කරන ලදී. ප්‍රතිපායනය, සහ සම්බන්ධතාවය, ප්‍රතිශත යන සංඛ්‍යාන විද්‍යාත්මක ශිල්ප ක්‍රම භාවිතයෙන් දත්ත විශ්ලේෂණයට කටයුතු කරන ලදී. සමස්ත සුබසාධන සේවාවන්ගේ කාර්යක්ෂමතාවය කාර්යක්ෂම තත්වයක පවතින බව සිසුන්ගෙන් 6% ක ගේ අදහස වූ අතර කාර්යක්ෂතාවය දුර්වලය යන්න 36% ක ගේ ද අකාර්යක්ෂම තත්වයක පවතී යන්න 45% කගේ ද කිසිදු කාර්යක්ෂමතාවයක් නැත යන්න 13% ක ගේ ද අදහස විය. මේ අනුව නිගමනය කළ හැක්කේ කැලණිය විශ්වවිද්‍යාලයේ සුබසාධන කටයුතු වල සෑම අංශයක් සඳහාමත්, සෑම කාර්යයක් සඳහාමත් යෙදවිය හැකි සම්පත් ඉතා සීමාසහිත බවයි. මේ අනුව කැලණිය විශ්වවිද්‍යාලයේ සිසුන් සඳහා රජය දරන සුබසාධන පහසුකම් පිරිවැයෙහි ආර්ථික කර්යක්ෂමතාවය ඉතා පහළ මට්ටමක පවතී.

**මුඛ්‍ය පද :** විශ්වවිද්‍යාල, සිසුන්, රජය, කාර්යක්ෂමතාවය

[1] ආර්ථික විද්‍යා අධ්‍යන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, fernandonavodani@gmail.com

# විශ්වවිද්‍යාල සිසුන් පරිගණක පාඨමාලා සඳහා යොමු වීමේ ප්‍රවණතාවය (කැලණිය විශ්වවිද්‍යාලයේ සමාජවිද්‍යා පීඨය ඇසුරින්)

ඩී. පී. ඩී. දුලාරි[1]

## සංක්ෂේපය

ලොවම විශ්ව ගම්මානයක් බවට පත්ව ඇති යුගයක විශ්වවිද්‍යාල සිසුන්ගේ පරිගණක සාක්ෂරතාවය වැඩි දියුණු කිරීම සඳහාත්, ඔවුන් රැකියා වෙළඳපලට සුදුසු වන ලෙස ගොඩනැංවීමටත් විශ්වවිද්‍යාලය තුළ සිසුන් සඳහා පරිගණක පාඨමාලා පවත්වන ලබයි. පරිගණක පාඨමාලා සඳහා සිසුන් යොමු වීමේ ප්‍රවණතාවය පිළිබඳ සොයා බැලීම සඳහා කැලණිය විශ්වවිද්‍යාලය ආශයෙන් පර්යේෂණයක් සිදු කරන ලදි. මෙම අධ්‍යයනය සඳහා මූලික වශයෙන් ප්‍රාථමික දත්ත යොදාගත් අතර, ඒ සඳහා කැලණිය විශ්වවිද්‍යාලයේ සමාජ විද්‍යා පීඨයේ වර්ෂ 4 න් සිසුන් 25 දෙනා බැගින් මුලු සිසුන් ගණන 100 කින් යුත් සසම්භාවී නියැදියක් යොදා ගන්නා ලදී. අධ්‍යයනය සඳහා ප්‍රශ්නාවලියක් මාර්ගයෙන් හා ව්‍යුහගත නොවන සම්මුඛ සාකච්ඡා ක්‍රමය භාවිතයෙන් ප්‍රාථමික දත්ත රැස් කර ගෙන ඇත. මීට අමතරව ද්විතියික මූලාශ්‍ර වන සඟරා, පුවත්පත්, අන්තර්ජාලය ඇසුරෙන් ද්විතියික දත්ත ලබාගන්නා ලදී. දත්ත විශ්ලේෂණය සඳහා විස්තරාත්මක සංඛ්‍යාන විශ්ලේෂණ ක්‍රම භාවිත කරන ලදී. පළමු වසරෙන් 88% ක්, දෙවන වසරෙන් 64% ක්, තෙවන වසරෙන් 28% ක් සිව්වන වසරෙන් 12% ක් වශයෙන් පරිගණක පාඨමාලාවන් සඳහා යොමු වන බවත්, සියලු වසර වලින් 52% සිසුන් ප්‍රමාණයක් පාඨමාලා සඳහා යොමු නොවන බවත් අනාවරණය විය. තවද පළමු වසරේ දී පාඨමාලා සඳහා යොමු වීම ඉහළ අගයක් ගත්තද, ඉහළ වසරයන්හි දී එම අගය ක්‍රමයෙන් අඩු වී ඇත. මේ සඳහා ප්‍රධාන වශයෙන් බලපා ඇත්තේ සිසුන්ට පරිගණක පාඨමාලා සඳහා කාලය වෙන් කර ගත නොහැකි වීම, විශ්වවිද්‍යාල අධ්‍යාපනයට පෙර පරිගණක පාඨමාලා හදාරා තිබීම හා පරිගණක පාඨමාලා හැදෑරීමට උනන්දුවක් නොතිබීම ආදියයි. ඒ අනුව මෙම අධ්‍යයනයෙන් කැලණිය විශ්වවිද්‍යාලයේ සමාජ විද්‍යා පීඨයේ සිසුන්ගේ පරිගණක පාඨමාලාවන් සඳහා යොමු විම අඩු මට්ටමක පවතින බව නිගමනය කළ හැකි විය. සිසුන් සඳහා පරිගණක පාඨමාලා අනිවාර්ය කිරීම හා යොමු වීමෙන් ලැබෙන ප්‍රතිලාභ පිළිබඳ දැනුවත් කිරීමෙන්, වැඩි වශයෙන් සිසුන් පරිගණක පාඨමාලාවන් හැදෑරීමට යොමු කර ගැනීමට හැකි වේ යැයි අපේක්ෂා කළ හැකිය.

**මුඛ්‍ය පද :** විශ්වවිද්‍යාල සිසුන්, පරිගණක පාඨමාලා, රැකියා වෙළඳපළ

[1] ආර්ථිකවිද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, dulari130203@gmail.com

# Identify the Factors affecting job satisfaction of ABC Company (construction filed)

M. B. M. R. C. S. Marapana[1]

## Abstract

There are two main HR compounds that are job satisfaction and turnover. Employee satisfaction or job satisfaction is a measurement how employees are satisfied with their jobs. Employee satisfaction is typically measured using an employee satisfaction survey. Depending on the research question, ABC Company was selected as it is the largest construction company in Sri Lanka. It was established in 1984. Objectives of the research are to identify the factors affecting job satisfaction and to find out the relationship between each variables. Hypotheses have defined by describing relationship between each variable and has used stratified sampling method to get more accuracy sample size. To collect data both primary and secondary methods were used. The questionnaire method has chosen as it made the quantification of the information possible. According to these points poor salary, training, working environment and working conditions may create big impact on job satisfaction. There is a strong positive relationship (0.8) between salary and job satisfaction. There is a weak positive relationship (0.325) between training and job satisfaction. There is a weak positive relationship (0.115) between working environment and job satisfaction. There is a strong positive relationship between (0.683) working condition and job satisfaction. There were recommendations to avoid employee job dissatisfaction or reduce its impact on the organization.; provide better reward and compensation package including incentives, develop the skill and potential of your workforce, evaluate and measure job satisfaction for job improvement and providing better working conditions related to working hours, health and safety policy and leaves, holidays are help to reduce to employee dissatisfaction.

**Keywords** : Performance management, Turnover intention, salary, training, working condition

[1] Department of Economics, University of Kelaniya, chathu.marapana@yahoo.com

# දෙමව්පියන්ගේ විදේශගත වීම පවුල් වල නව යොවුන් වියේ පසුවන දරුවන්ගේ අධ්‍යාපන සාධනය කෙරෙහි බලපාන ආකාරය පිළිබඳ අධ්‍යයනයක්

**ජේ. එච්. එම්. සී. පී. ජයපත්ම**[1]

## සංක්ෂේපය

ආසියාවේ පුරුෂයන් ප්‍රමාණයට වඩා කාන්තාවන් විශාල ප්‍රමාණයක් විදේශගත වීම දැක ගත හැකිය. මොවුන්ගෙන් වැඩි ප්‍රතිශතයක් ගෘහසේවය සඳහා විදේශගත වුවන් ය. ආර්ථික වෘද්ධිය අතින් බැලීමේ දී මෙලෙස ශ්‍රී ලාංකික ප්‍රජාවගේ විදෙස්ගත වීම බෙහෙවින් ඵලදායක ක්‍රියාදාමයකි. නමුත් මෙලෙස විශේෂයෙන්ම මව විදෙස්ගත වීම බොහෝ ගැටලු රාශියකට මග පාදන්නකි. මෙලෙස පවුල්වල දෙමව්පියන්ගේ විදේශ ගතවීම හේතුවෙන් දරුවන්ගේ මූලික මානසික අවශ්‍යතා ඉටු නොවීම නිසා එය ඔවුන්ගේ අධ්‍යාපනයට අහිතකර ලෙස බලපෑම් එල්ලකර ඇත. රැකියා සඳහා මෙලෙස දෙමව්පියන්ගේ විදෙස්ගත වීම පවුල්වල නව යොවුන් වියේ පසුවන දරුවන්ගේ අධ්‍යාපන සාධනය කෙරෙහි බලපාන ආකාරය පිළිබඳ අධ්‍යනයක් සිදු කිරීම මෙම පර්යේෂණයෙහි මූලික අරමුණ වේ. මේ සඳහා නියැදිය වශයෙන් තෝරා ගන්නා ලද්දේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ කොටවෙහෙර ග්‍රාමය යි. දෙමව්පියන් විදේශගත වූ පවුල්වල දරුවන් 20 ක් සහ දෙමව්පියන් විදේශගත නොවූ පවුල් වල දරුවන් 20 ක් සසම්භාවී නියැදිය වශයෙන් තෝරාගෙන දෙමව්පියන් විදේශගත වීමට පෙර සහ පසු ඔවුන්ගේ අධ්‍යාපන සාධන මට්ටම්වල ඇති වූ වෙනස් වීම් මෙහිදී විමසා බලන ලදී. ප්‍රශ්නාවලි සහ ලේඛන පරීක්ෂා කිරීමෙන් අධ්‍යනයට අවශ්‍ය දත්ත එක් රැස් කර ගැනීමට හැකියාව ලැබුණි. ලබාගත් සියලුම දත්ත මධ්‍යනාය , සම්මත අපගමනය හා ප්‍රතිශතක වැනි සංඛ්‍යා විද්‍යාත්මක ක්‍රම භාවිතයෙන් ප්‍රමාණාත්මකව සහ ගුණාත්මකව විශ්ලේෂණය සිදු කරන ලදී. පර්යේෂණය අවසානයේදී අනාවරණය කර ගත් තොරතුරු වලට අනුව නිගමනය කල හැකි වූයේ, දෙමව්පියන් විදේශගත වීම අඩු ආදායම්ලාභී පවුල් වල ජීවන තත්වය ඉහළ නැංවීමට හේතු වූ නමුත් දරුවන්ගේ අධ්‍යාපන තත්වය කෙරෙහි අහිතකර ලෙස බලපා ඇති බවයි. දෙමාපියන් විදේශගත වීම නිසා දරුවන්ගේ සාධනය වැඩි දියුණු වී ඇත්තේ දරුවන්ගෙන් 15% ගේ පමණි. 10% ගේ සාධනයෙහි කිසිදු වෙනසක් සිදු වී නොමැත. දරුවන්ගෙන් 75% ගේ සාධනය දුර්වල වී ඇත. දෙමාපියන් විදේශගත වීමේ එක් අරමුණක් වූයේ, තම දරුවන්ට අධ්‍යාපනය ලබා දීමයි. එහෙත් මෙම අධ්‍යනයට අනුව දෙමව්පියන් විදේශගත වීම දරුවන්ගේ අධ්‍යාපන සාධනය කෙරෙහි අහිතකර අයුරින් බලපා ඇති බව අනාවරණය විය.

**මුඛ්‍ය පද :** විදේශගත වීම, දරුවන්, අධ්‍යාපනය

[1] ආර්ථික විද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, jayapathma95@gmail.com

# දේශීය පොල් නිෂ්පාදනය සඳහා ප්‍රාදේශීය වශයෙන් සිදුවන බලපෑම

ටී. ඩබ්. කේ. එම්. ආරියකරුණා[1]

**සංක්ෂේපය**

ශ්‍රී ලංකාවේ ප්‍රධාන අපනයන භෝග වන්නේ තේ, රබර් සහ පොල් ය. ඒ අතුරින් පොල් වගාවට විශේෂ ස්ථානයක් හිමිවේ. මන්ද, පොල් වගාව තුළින් නිපදවිය හැකි අතිරේක නිෂ්පාදන බොහොමයක් ද පවතින බැවිනි. ඒ හේතුවෙන් ශ්‍රී ලංකාවේ පොල් වගාව බහු මාර්ගික ආදායම් උපදවන භෝගයක් ලෙස හැඳින්විය හැකිය. සමස්ත දේශීය පොල් හා අතිරේක පොල් නිෂ්පාදන සඳහා ප්‍රාදේශීය වශයෙන් ලැබෙන දායකත්වයෙහි සහ දේශීය වෙළඳපොළ තුළ පමණක් නොව විදේශීය වෙළඳපොළ තුළ ද පොල් නිෂ්පාදනයන් ප්‍රචලිත කිරීමට ප්‍රාදේශීය පොල් නිෂ්පාදකයින්ගෙන් ලැබෙන දායකත්වයෙහි ප්‍රමාණවත්භාවය හා ඵලදායිතාවය පිළිබඳ ව විමසීමක් සිදු කිරීම මෙහි අරමුණවේ. ඒ සඳහා පොල් වගා කරන 100 දෙනෙකුගෙන් යුත් නියැදියක් තෝරාගනු ලැබූ අතර ප්‍රශ්නාවලි ක්‍රමය සහ සම්මුඛ සාකච්ඡා හරහා අදාළ දත්ත ඒකරාශී කරගන්නා ලදී. දත්ත විශ්ලේෂණය සඳහා ප්‍රස්තාර, වගු සහ සංඛ්‍යානමය විශ්ලේෂණ ක්‍රම භාවිත කරන ලදී. එලෙස ලබා ගන්නා ලද දත්තවලට අනුව 84.5% ක්ම සමස්ත දේශීය පොල් හා අතිරේක පොල් නිෂ්පාදන සඳහා දායක වේ. එමෙන්ම 88% ක් දේශීය වෙළඳපොළ තුළ පමණක් නිෂ්පාදන ප්‍රචලිත කරන අතර පොල් අපනයනය කිරීම සඳහා දායක වන්නේ 12%ක් වැනි සුළු ප්‍රමාණයක් පමණි. ඒ අනුව දේශීය පොල් නිෂ්පාදනය සඳහා ප්‍රාදේශීය මට්ටමින් සක්‍රීය දායකත්වයක් ලැබෙන බවත්, පොල් නිෂ්පාදන අපනයනය සඳහා ඉතා අඩු දායකත්වයක් ලැබෙන බවත් නිගමනය කළ හැක. එම නිසා බහුතරයක් ප්‍රාදේශීය පොල් වගාකරුවන්ගේ ප්‍රධාන ආදායම් මාර්ගය දේශීය වෙළඳපොළ වටා කේන්ද්‍රගත වී ඇති බව පැහැදිලි වේ. එම නිසා ප්‍රාදේශීය පොල් නිෂ්පාදකයින් හට විදේශීය වෙළඳපොළ තුළද සක්‍රීය වීමට අවශ්‍ය ඉඩකඩ සැලසීම හා ඒ සඳහා ඔවුන් දිරිමත් කිරීමට කටයුතු කළයුතු බව අවසාන වශයෙන් නිගමනය කළ හැක.

**මුඛ්‍ය පද** : ප්‍රාදේශීය පොල් නිෂ්පාදනය, අතිරේක පොල් නිෂ්පාදන, පොල් අපනයනය

[1] ආර්ථික විද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, kasunimadhavi94@gmail.com

# පාසල් ක්‍රීඩක ක්‍රීඩිකාවන්ට සිදුවන අස්ථි හා පේශි අනතුරු (හිඟුරක්ගොඩ ප්‍රදේශය ඇසුරින්)

**බී. කේ. ජී. වත්සලා**[1]

**සංක්ෂේපය**

කායික, මානසික, සමාජීය හා අධ්‍යාත්මික වශයෙන් යහපත් පුද්ගලයන් සෞඛ්‍ය සම්පන්න පුද්ගලයෙකු ලෙස හඳුන්වයි. නමුත්, වර්තමානයේ දී පාසල් අවධියේ ක්‍රීඩාවේ නිරතවන්නන්ගෙන් වැඩි පිරිසක් කායික ආබාධ වලට ලක්ව ඇත. මේ අනුව, පාසල් ක්‍රීඩක ක්‍රීඩිකාවන්ට සිදුවන අස්ථි හා පේශි අනතුරුවල ප්‍රවණතාවන් අධ්‍යයනය කිරීම මෙම පරීක්ෂණයේ අරමුණ වේ. හිඟුරක්ගොඩ ප්‍රදේශයේ තෝරා ගනු ලැබූ පාසල් 3ක් ආශ්‍රයෙන් එක් පාසලකින් ක්‍රීඩක ක්‍රීඩිකාවන් 100ක් නියෝජනය වන ලෙස ජවන තරඟ, පිටිය තරඟ සහ කණ්ඩායම් තරඟ වලින් ලෙස සමස්ත ක්‍රීඩක ක්‍රීඩිකාවන් 300ක් නියෝජනය වන පරිදි ස්තෘත සසම්භාවී නියැදුම් ක්‍රමය මගින් තෝරා ගනු ලබයි. මෙහි දී ප්‍රාථමික දත්ත රැස් කිරීම ප්‍රශ්නාවලි මගින් සිදු කරන ලදී. දත්ත විශ්ලේෂණය විස්තරාත්මක සංඛ්‍යාන ශිල්පීය ක්‍රම මගින් සිදු කරනු ලබයි. මෙම පරීක්ෂණය මගින් නිගමනය කළ හැකි වූයේ, ක්‍රීඩාවේ නිරත වන්නන්ගෙන් 80%ක් අස්ථි හා පේශි අනතුරු වලට ලක් වන බවත්, කණ්ඩායම් තරඟ වලින් පේශි ආබාධ වැඩි වශයෙන් ක්‍රීඩකයන්ට සිදු වන බවත් ජවන හා පිටිය තරඟ වල දී වැඩි වශයෙන් අස්ථි ආබාධ වලට ක්‍රීඩක ක්‍රීඩිකාවන් ලක් වන බවත් ය.

**මුඛ්‍ය පද :** අනතුරු, අස්ථි හා පේශි, ක්‍රීඩක ක්‍රීඩිකාවන්

[1] ආර්ථික විද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, gayaniwathsala105@gmail.com

# ප්‍රාදේශීය පරිපාලන කාර්යයන් ඉටුකර ගැනීමේ දී නව කළමනාකරණ ප්‍රවේශ සම්බන්ධයෙන් ජනතාව දක්වන උනන්දුව (ඇඹිලිපිටිය ප්‍රාදේශිය ලේකම් කාර්යාලය ඇසුරින්)

එන්. ඩබ්. බණ්ඩාරනායක[1]

**සංක්ෂේපය**

ශ්‍රී ලංකාවේ මධ්‍යම රජයේ පහළම පරිපාලන ස්ථරය වන්නේ, ප්‍රාදේශීය පරිපාලනයයි. ශ්‍රී ලංකාවේ ප්‍රාදේශීය පරිපාලන අවශ්‍යතා සක්‍රීයව ඉටු කිරීමට 1992 අංක 58 දරණ පනත මගින් ප්‍රාදේශීය ලේකම් කාර්යාල ක්‍රමය හඳුන්වා දෙන ලදි. එය සැමවිටම ජනතා අවශ්‍යතා සමඟ අන්‍යෝන්‍ය වීම හේතුවෙන් ඉහළ අවධානයකට ලක් විය. පරිපාලන කාර්යයන් අධික වීමත් සමඟ එම කටයුතු කාර්යක්ෂම හා ඵලදායී අයුරින් ඉටු කිරීමට 90 දශකයේ දී නව කළමනාකරණ ප්‍රවේශ භාවිතයට පැමිණේ. වර්තමානය වන විට ප්‍රාදේශීය පරිපාලන කටයුතු සඳහා මෙය යොදා ගැනීමෙන් තෘප්තිමත් පරිපාලන සේවයක් මහජනතාව වෙත ළඟා කිරීමට අපේක්ෂා කෙරුණි. පූර්වෝක්ත පර්යේෂණ මාතෘකාව හරහා ප්‍රාදේශීය පරිපාලනයේ දී භාවිතා කරන නව කළමනාකරණ ප්‍රවේශ පිළිබඳ ජනතාව තුළ පවතින දැනුවත්භාවය අධ්‍යයනයට ලක් කිරීම අරමුණු කෙරේ. එහි දී ප්‍රාදේශීය පරිපාලන අවශ්‍යතා ඉටු කර ගැනීම සඳහා ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙත පැමිණෙන ජනතාවට නව කළමනාකරණ ප්‍රවේශ පිළිබඳ නිසි දැනුමක් හා අවබෝධයක් පවතිනවාද, යන්න මෙම අධ්‍යයනයේ ගැටලුව බවට පත් වේ. අධ්‍යයන නියැදිය ලෙස රත්නපුර දිස්ත්‍රික්කයේ ඇඹිලිපිටිය ප්‍රාදේශිය ලේකම් කාර්යාලය තෝරා ගත් අතර ප්‍රශ්නාවලියක් භාවිතයෙන් අවශ්‍ය ප්‍රාථමික දත්ත රැස් කර ගන්නා ලදී. මෙහිදී ප්‍රාදේශිය පරිපාලනය තුළ භාවිතා වන නව කළමනාකරණ ප්‍රවේශ කිහිපයක් අධ්‍යයනයට ලක් කර ඇත. මෙම අධ්‍යයනයේ දී ප්‍රාදේශිය පරිපාලන අවශ්‍යතා ඉටු කර ගැනීමට පැමිණෙන ජනතාව නව කළමනාකරණ ප්‍රවේශ සම්බන්ධයෙන් දක්වන උනන්දුව හා අවබෝධය ඉතා පහළ මට්ටමක පවතින බව අනාවරණය කර ගත හැකි විය. මේ අනුව පරිපාලන කාර්යක්ෂමතාවය අරඹයා හඳුන්වා දුන් නව කළමනාකරණ ප්‍රවේශ භාවිතය සම්බන්ධව ජනතාවගේ ආකල්ප තවමත් හැඩගැසීමකට ලක් නොවී ඇති බව නිගමනය කළ හැකිය.

**මුඛ්‍ය පදඃ** ප්‍රාදේශිය පරිපාලනය, කාර්යක්ෂමතාව, ඵලදායීතාව, නව කළමනාකරණ ප්‍රවේශ

[1]ආර්ථික විද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය,
bandaranyakewathsala@gmail.com

# Workplace stress in nursing: a literature review

W. V. P. M. Nayomi [1]

## Abstract

A world-wide shortage of nurses, a significant challenge facing the healthcare sector in many developed and developing countries. Health development (growth) is an important fact for Sri Lanka as a developing country. It gives free health system to its people around the clock. Nurses play an important role in this field to uplift the health development. Accordingly to Key social indicators Nurses per 10,000 persons 15.4 in Sri Lanka. Similarly statistics at present qualified nurses 32,272 employed in Sri Lanka and a nurse for every 650 persons. The government allocates a large amount of money for health within a one year. The aspiration of these expenditures is well progress of health sector. When nurses are doing their dignity correctly, it is a massive strength to improvement of health sector. The purpose of this study is to review the knowledge on workplace stress in nursing. Stress in nurses has been linked to reduce physical and psychological health, reduce job satisfaction, increase sickness absence, increase staff turnover, and poorer job commitment. A literature search from January 2000 to 2014 was conducted using 20 articles. Poor working relationship between nurses and doctors and other health care professionals, demanding communication and relationships with patients and relatives, emergency cases, high workload, under staffing and lack of support or positive feedback from senior nursing staff have been main source of stress for nurses.

**Keywords**: nursing, stress, workplace stress, stress management, psychological health

[1] Department of Economics, University of Kelaniya,
wikramasinghe.mahesha@yahoo.com

# Online Banking and Cyber Risks in Sri Lanka

**M. A. D. N. Sandamali**[1]

## Abstract

In the era of globalization Internet banking or online banking has revolutionized an integral activity of our modern twenty first century. In modern days people always prioritize their convenience. Therefore online banking and activities related to the internet make their daily schedules more easy and convenient. The misuse of information technology in the cyber space is clutching up which gave birth to cybercrimes at the national and international level. The percentage of risks and the challenges associated with it is increased. Objectives of this study are to identify the technology adoption in banking activities, identify the types of cyber threats and identify the Cyber Risk Management practices in banks of Sri Lanka. Secondary data were gathered based on Central bank Annual Reports in Sri Lanka and the Survey Report-2015 of National Center for Cyber Security in Sri Lanka. Many banks adopt computer based systems, ATMs, Centralized Core Banking system and Virtual Banking System. Popular cyber risks types in banks are Hacking/Intrusion attacks, Distributed Denial of Service (DDoS) attacks, Malware, Social engineering, credit card fraud, and Phishing. Analyzed data indicate that among internet users, 30% of users use internet for banking activities. Accordingly they are attacked by various types of cybercrimes as in Sri Lnaka 2015, Spam Emails- 60%, computer viruses- 90%, phishing attacks-15%, cyber bulling- 5.6%, cyber stalking- 4%. Individual banks as well as the Government and the Central Bank of Sri Lanka (CBSL) have been continuously implementing two main cyber risk management procedures as Baseline security standards and Computer security incident response team. However, even though internet offers variety of benefits to people, recently there are many instances of cybercrimes. To prevent the cybercrimes it is necessary to take certain precautions while operating the computer or internet, educating people on cyber risks and implement necessary rules and regulations are compulsory to avoid these risks.

**Keywords :** Online Banking, Cyber Crime, Sri Lanka, Cyber Risk Management, internet.

[1] Department of Economics, University of Kelaniya, sandamalimuthugoda1@gmail.com

# රූපවාහිනි වෙළඳ දැන්වීම් ග්‍රාමීය ජනතාවගේ ආකල්ප කෙරෙහි කරනු ලබන බලපෑම

**ඒ. පී. ටී. එම්. සිරිවර්ධන**[1]

## සංක්ෂේපය

වර්තමානය තරඟකාරී ආර්ථික රටාව හමුවේ භාණ්ඩ හා සේවා සැපයීමේ ආයතන ඉතා තරඟකාරී ප්‍රචාරණයක යෙදී සිටියි. ඒ සඳහා රූපවාහිනි වෙළඳ දැන්වීම් ඉතා ජනප්‍රිය මාධ්‍යයකි. ග්‍රාමීය ජනතාවගේ ආකල්ප වෙනස් කිරීම කෙරෙහි රූපවාහිනී වෙළඳ දැන්වීම් කරනු ලබන බලපෑම් පිළිබඳ අධ්‍යයන කිරීම මෙම අධ්‍යයනයේ අරමුණ විය. වෙළඳ දැන්වීම් ග්‍රාමීය ජනතාවගේ ආකල්ප කෙරෙහි කරනු ලබන බලපෑම පිළිබඳ අධ්‍යයනයේ දී විශේෂයෙන් ග්‍රාමීය ජනතාවගේ දැනුම් මට්ටම ඉතා වැදගත් වේ. වැඩි වශයෙන් ග්‍රාමීය ප්‍රදේශවල වාසය කරන ජනතාව තුළ නූතන තාක්ෂණය පිළිබඳ අවබෝධය අඩුය. ඒ නිසාවෙන් රූපවාහිනි තුළ විකාශය වන සියලු දේ සත්‍ය ලෙස ඔවුන් දකියි. එමෙන්ම වර්තමාන වෙළඳ දැන්වීම් තුළ පවතින ආකර්ෂණය නිසාම ප්‍රේක්ෂකයා මුලා කිරීමේ හැකියාව වැඩිය. ඒ නිසාවෙන් මෙම පර්යේෂණයේ සාර්ථකත්වය සඳහා දත්ත ලබා ගැනීමට පහසු නියැදි ක්‍රමය යටතේ කටුවන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ හිඟුරකන්ද ග්‍රාම නිලධාරී වසමේ රූපවාහිනිය භාවිතා කරන තෝරා ගත් පවුල් 50ක් යොදා ගැණිනි. මෙම අධ්‍යයනයේ දත්ත රැස් කර ගැනීම සඳහා ප්‍රශ්නාවලි ක්‍රමය හා සමීක්ෂණ ක්‍රමය භාවිත කෙරිණි. spss මෘදුකාංගය හා අන්තර්ගත විශ්ලේෂණ ක්‍රමය භාවිතයෙන් දත්ත විශ්ලේෂණය කරනු ලැබීය. විශේෂයෙන් මෙම අධ්‍යයනයේ දී වෙළඳ දැන්වීම්හි අන්තර්ගතය අධ්‍යයනයෙන් පැහැදිලි වුයේ ගැමි ජනතාව ඉලක්ක කර ගත් අන්තර්ගතයන් වෙළඳ දැන්වීම් තුළ ඇතුළත්ව ඇති බවයි. ඒ අනුව ගැමි ජනතාවගේ සිතුම් හා ආකල්ප වෙනස් කිරීමට මාධ්‍යයට විශාල බලපෑමක් සිදු කළ හැකි බවත් රූපවාහිනියට ඉන් ප්‍රධාන තැනක් හිමි වන බවත් පැහැදිලි විය. රූපවාහිනි වෙළඳ දැන්වීම් 70%ක් ගැමි ජනතාවගේ ආකල්ප වෙනස් කිරීම කෙරෙහි බලපෑම් කර ඇති බව පැහැදිලි විය. තරුණියන් 80%ක් රූපලාවන්‍ය වෙළඳ දැන්වීම් කෙරෙහි වැඩි ආකර්ෂණයක් හා ඔහුන්ගේ ආකල්ප කෙරෙහි ද ඒවා බලපෑම් කරන බව මෙම අධ්‍යයනයෙන් පෙනී යයි.

**මුඛ්‍ය පද :** වෙළඳ දැන්වීම්, රූපවාහිනිය, බලපෑම, ආකල්ප, ආචාර ධර්ම

[1]ජනසන්නිවේදන අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, thilinimsiriwardana@gmail.com

# කාර්යක්‍ෂම හා ඵලදායී සේවාවක් උදෙසා රාජ්‍ය අංශය තුළ නව කළමනාකරණ ප්‍රවේශයන්හී භාවිතය(පල්ලේපොල ප්‍රාදේශිය ලේකම් කාර්යාල ඇසුරින්)

පී. ජී. එන්. එල්. ගමගේ[1]

## සංක්ෂේපය

ශ්‍රී ලංකාවේ රාජ්‍ය සේවයට නව කළමනාකරණ විධි ක්‍රම හඳුන්වාදීම 1980 දශකය ආරම්භයේ සිදුවිය. ඒ තුළින් කාර්යක්‍ෂම සහ ඵලදායි සේවාවක් සැපයීම අරමුණ විය. මෙම අධ්‍යයනයේ මුලික අරමුණ වුයේ ශ්‍රී ලංකාව තුළ නව කළමනාකරණ ප්‍රවේශයන්හී භාවිතයේ සාර්ථක හා අසාර්ථකභාවය හඳුනා ගැනීමයි. මෙම අධ්‍යයනයේදී අධ්‍යයන ගැටලුව බවට පත්වන්නේ ශ්‍රී ලංකාවේ රාජ්‍ය අංශය වෙතට හඳුන්වා දුන් නව කළමනාකරණ ප්‍රවේශ සාර්ථකද යන්න සොයාබැලීමයි. මෙම අධ්‍යයනයේදී ප්‍රාථමික සහ ද්විතීක මුලාශ්‍ර යන දෙවර්ගයම දත්ත රැස්කිරීමට යොදාගනු ලැබීය. මෙහිදී ද්විතීය මුලාශ්‍ර වශයෙන් නව කළමනාකරණ ක්‍රමවේද සම්බන්ධයෙන් සිදුකර ඇති පර්යේෂණ වර්තා, ලිපි, පොත්පත් හා ලේඛන භාවිත කරන ලදී. මේ අනුව ගුණාත්මක දත්ත ලබාගැනීම සිදු කෙරිණි. ද්විතීක දත්ත පමණක් නොව ප්‍රාථමික දත්ත ලබාගැනිමද සිදු කළ අතර ඒ සඳහා ප්‍රාදේශිය ලේකම් කාර්යාලයක් වන මධ්‍යම පළාතේ මාතලේ දිස්ත්‍රිකයේ පල්ලේපොල ප්‍රාදේශිය ලේකම් කාර්යාලය අහඹු ලෙස තෝරා ගැනුනි. එහිදී අහඹු ලෙස තොරාගත් නිලධාරීන් සම්මුඛ සාකච්ඡාවට ලක්කරමින්ද නිරීක්‍ෂණ ක්‍රමවේදය භාවිතයට ගනිමින්ද මෙම ආයතනය වෙතට පැමිණෙන සේවාදායකයින් සියදෙනෙකු වෙත ප්‍රශ්නාවලින් ලබාදෙමින්ද තොරතුරු රැස්කිරීම සිදුකෙරුණි. මේ ආකාරයට ලබා ගන්නා ලද ප්‍රමාණාත්මක දත්ත සරල සංඛ්‍යානමය විධික්‍රම භාවිතා කරමින් විශ්ලේෂණය කිරීමත් ගුණාත්මක දත්ත විස්තරාත්මක ක්‍රමවේදය ඔස්සේ ඉදිරිපත් කිරිමත් සිදු කරනු ලබයි. මෙම අධ්‍යනයේදී අවසාන වශයෙන් නිගමනය කළ හැකි වූයේ, නව කළමනාකරණ ප්‍රවේශ රාජ්‍ය අංශය භාවිත කරනු ලැබුවත් සාර්ථකම ලෙස සිදු නොකර ඇති බවත් ප්‍රායෝගිකව ක්‍රියාත්මක කිරීමට නොහැකි අකාරයේ ගැටලු පවතින බව මෙන්ම ජනතාව නව කළමනාකරණ ප්‍රවේශ මොනවාද යන්න පිළිබඳ දැනුවත් භාවයක් නොමැති බවත් නිගමනය කළ හැකිය.

**මුඛ්‍ය පද :** නව කළමනාකරණ ප්‍රවේශ, කාර්යක්‍ෂමතාව, ඵලදායිතාව, රාජ්‍ය අංශය

[1] ආර්ථික විද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය,
nishanilakmali21@gmail.com

# දහම්පාසල් අධ්‍යාපනයේ නිරතවීම්

**වයි. එම්. ආර්. කුමාරිහාමි.**[1]

**සංක්ෂේපය**

ගුණනුවණින් පිරි මිනිසකු වීමට නම් විෂය සමගාමී දැනුම මෙන්ම ආගම දහම පිළිබඳ දැනුම ද ඉතා වැදගත් වේ. දිනෙන් දින සමාජ පිරිහීමත් දක්නට ලැබුණ ද දහම් අධ්‍යාපනය කෙරෙහි දෙමාපියන්ගේ හා දරුවන්ගේ අවධානය යොමු වී නොමැති බව පෙනේ. පෙර වර්ෂයන්ට සාපේක්ෂව ක්‍රමයෙන් දහම් පාසල් අධ්‍යාපනයේ නිරත වීම අඩු වීම ගැටලුවක් බවට පත්ව තිබේ. සිසුන්ගේ දහම් පාසල් අධ්‍යාපනයේ ප්‍රවණතාවයන් හා ඊට බලපාන සාධක අරමුණු කර ගනිමින් වයඹ,පොල්පිතිගම කොට්ඨාසයේ දහම් පාසල් තුනක් වන ශ්‍රී චන්ද්‍රානන්ද දහම් පාසල, ශ්‍රී ගුණානන්ද රිවි දින දහම් පාසල, මාදුගල ශ්‍රී සුවින්ද්‍රාරාම දහම් පාසල ආශ්‍රයෙන් වර්ෂ පහක් තුළ පළමු ශ්‍රේණියේ සිට 11 ශ්‍රේණිය දක්වා කොපමණ ප්‍රමාණයක් ලියාපදිංචි වී තිබේ ද සතිපතා පැමිණීමේ නැඹුරුතාවය කොපමණද යන්න ද්වීතියික හා ප්‍රාථමික දත්ත මූලාශ්‍ර තුළින් ලබාගත් අතර දහම් පාසල් ප්‍රධානාචාර්යවරුන්, දහම් පාසල් ආචාර්යවරුන් හා සිසුන් සමඟ සම්මුඛ සාකච්ඡා පවත්වා ප්‍රාථමික දත්ත රැස්කර ගන්නා ලදි. එහි දී අනාවරණය වූයේ මුල් වර්ෂවලට සාපේක්ෂව ක්‍රමයෙන් දහම් පාසල් සිසුන්ගේ ප්‍රමාණය 40% ක් පමණ අඩු වී ඇති බවයි. ඒ අතරින් 10 සහ 11 ශ්‍රේණිවල සිසුන්ගේත්, 5 ශ්‍රේණිය සිසුන්ගේත් ප්‍රමාණයන් ඉතා ඉහළ අඩු වීමක් දක්නට ලැබුණි. එමෙන්ම දහම් පාසල් පැමිණෙන සිසුන්ගෙත් 45% දහම් පාසල් අවසාන පරික්ෂණය සඳහාත් ධර්මාචාර්ය විභාගය සඳහා 20% ක් වැනි ප්‍රකාශිතයක් පෙනී සිටිනු ලබන බවයි. මෙලෙස දහම් පාසල් අධ්‍යාපනයෙන් ක්‍රමයෙන් ඈත්වීම සඳහා බලපාන සාධක ලෙස අ.පො.ස සා.පෙළ හා ශිෂ්‍යත්වය සඳහාත්, ගණිත, ඉංග්‍රීසි වැනි විෂයන් සඳහාත් අමතර පන්තිවලට සහභාගී වීම, දහම් පාසල් සඳහා පවතින භෞතික හා මානව සම්පත් හිඟකම, සිසුන් හා දෙමාපියන් දක්වන ආකල්ප හා උනන්දුව අඩුවීමත් දැක්විය හැකිය. දහම් අධ්‍යාපනය ලබාගන්නා ප්‍රතිශතය ඉහළ නැංවීම සඳහා ඉරුදින දහම් පාසල් කාලය තුළ පන්ති නොපැවත්වීම, දහම් පාසල්වල මානව සහ භෞතික සම්පත් සංවර්ධනය, පාසල් මට්ටමින් ගම් මට්ටමින් දැනුවත් කිරීම, දහම් අධ්‍යාපනයට ඇති ඉඩ ප්‍රස්තා පුළුල් කිරීම මෙන්ම පර්ෂද මූලස්ථාන ශක්තිමත් කිරීම සිදු කළ යුතුයි.

**මුඛ්‍ය පද :** දහම් පාසල් අධ්‍යාපනය, දහම් පාසල, දහම් පාසල් සිසුන්

[1] ආර්ථික විද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, yaparasika7@gmail.com

# අ.පො.ස.(උසස් පෙළ) විභාගය සඳහා සිසුන් උපකාරක පංති වලට යොමු වීමේ ප්‍රවණතාවය විමසීම.

**ආර්. එම්. ටී. පී. ජයසේකර[1]**

**සංක්ෂේපය**

වර්තමාන ශ්‍රී ලංකාවේ සිසුන්ගේ ඉගෙනුම් ක්‍රම අතර පෞද්ගලික උපකාරක පංති වලට වැදගත් තැනක් හිමි වේ. පෞද්ගලික උපකාරක පංතියකින් අමතර ඉගැන්වීමක් නොලබා විභාගය සමත් විය නොහැකි යන මතය සමාජය පුරා පැතිර පවති. මේ නිසා දිවයින පුරා විවිධ මාදිලියේ පෞද්ගලික උපකාරක පංති බිහි වි ඇත. ඒ අනුව අ.පො.ස ( උසස් පෙළ) විභාග ප්‍රතිඵල සඳහා උපකාරක පංති මඟින් බලපෑමක් සිදු වන්නේද, යන්න අරමුණු කර ගෙන මෙම පර්යේෂණය සිදු කර ඇත. මෙම අධ්‍යයනය සඳහා නිකවැරටිය අධ්‍යාපන කොට්ඨාසයේ එක් පාසලක අ.පො.ස. උසස් පෙළ හැදෑරූ සිසුන්ගෙන් සියලුම විෂය ධාරා නියෝජනය වන පරිදි සිසුන් 100 නියදියක් ස්තෘත සසම්භාවි නියදුම් ක්‍රමය යොදා ගනිමින් සමීක්ෂණයට භාජනය කරන ලදි. ප්‍රශ්නාවලියක් මෙන්ම සම්මුඛ සාකච්ඡා ක්‍රමය මඟින් ප්‍රාථමික දත්ත රැස් කරන ලදී. එම දත්ත විස්තරාත්මක සංඛ්‍යාන ක්‍රම මඟින් විශ්ලේෂණය කරන ලදි. මෙම අධ්‍යයනයට අනුව පාසල තුලින් ලබන දැනුම ප්‍රමාණවත් නොවන බව අනාවරණය කර ගත හැකි විය. ලබා ගන්නා ලද දත්ත වලට අනුව තරඟකාරිත්වය හේතුවෙන් විධිමත් දැනුම ගවේෂණයට දක්වන උදාසීන ගතිය මෙන්ම උපකාරක පංති පවත්තවන ගුරුවරුන්ගේ පංති වලට යොමු කර ගැනිමට සිදුකරන විවිධ ආකර්ෂණ වැඩ පිළිවෙළවල් නිසා ද පාසලෙන් ලබන දැනුමට අමතරව දැනුමක් ලබා ගැනිමට උපකාරක පංතිවලට සිසුන් යොමු විම හේතු කොට ගෙන උපකාරක පංති මඟින් සිසුන්ගේ උසස් පෙල ප්‍රතිඵල ඉහළ යන බව අනාවරණය විය. එබැවින් සිසුන් ඉතා සීඝ්‍රයෙන් උපකාරක පංති වලට යොමු වන බව තහවුරු විය.

**මුඛ්‍ය පද :** අ.පො.ස. උසස් පෙළ, පාසල් අධ්‍යාපනය, උපකාරක පංති

[1] ආර්ථික විද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, thilinipj3057@gmail.com

# The Impact of Mother's Working Life on Child Education Level

**K. N. Samarsinghe**[1]

## Abstract

The female labour market participation rates have increased in many countries over the last decades. Today woman get an opportunity to engage in economical benefitted jobs and the family earns dual income. Hence, mother's employment affects her child both emotionally and academically. The objective of this study is to analyse the impact of mother's working behaviour on child education.100 children were randomly selected from grade four at Siridhamma College in Galle district, representing both working and nonworking mothers. The primary data collected by using questionnaires and structured interview method from mothers, fathers, and children, and the term test scores provided by school. Students, who were not living with their mothers, were dropped from analysis. The dependent variable is the term test marks and the independent variables are the mother's spending hours at home, type of occupation. The correlation and regression methods were used to analyse the data. The mother's working life effects the academic performance for 68% of children.74% of mothers do not spend at least 2 hours with their child per day. The research finds that mother's working behaviour negatively affects on their children not only academically but also emotionally.

**Keywords**: mother's working behaviour, child, and education

[1] Department of Economics, University of Kelaniya, samarasinghekn@gmail.com

# ග්‍රාමීය පාසල් දරුවන්ගේ පුස්තකාල භාවිතය (අනුරාධපුරය මහගස්වැව මහ විද්‍යාලය ආශ්‍රයෙන් කරන ලද පර්යේෂණයකි)

ජී. එම්. එන්. විජේරත්න[1]


## සංක්ෂේපය

වර්තමානයේ පවතින පාසල පදනම් කරගත් අධ්‍යාපන ක්‍රමය තුල දරුවන්ගේ බුද්ධි වර්ධනයට හා නව දැනුම සොයා යාමේදී පුස්තකාලය මගින් ඉටුවන්නේ අමිල මෙහෙවරකි. පාසලෙන් ලබාදෙන්නා වු දැනුමට අමතරව දරුවන්ගේ ගවේෂණාත්මක අධ්‍යාපන ක්‍රමයට අඩිතාලම සපයන්නේ පුස්තකාලයයි. වර්තමානය වන විට පාසල් සිසුන් පුස්තකාල භාවිතයට හුරු වි ඇත්තේ ඉතාමක් සුළු වශයෙනි. තවද දරුවන් විෂය රාමුවකට පමණක් සීමා වී ඇති අතර පාසල් දරුවන් නව ඇනුම සොයා යාමේදී භාවිතා කරන ක්‍රමවේද මොනවාද හා පුස්තකාල භාවිතය අඩපණ වීමට බලපා ඇති සාධක විමර්ශනය මත මෙම අධ්‍යාපනයේ ගැටලුව හා අරමුණ පදනම් වී ඇත. අනුරාධපුර දිස්ත්‍රික්කයේ ගලෙන්බිඳුණුවැව කලාප කාර්යාලයේ මහගස්වැව මහා විද්‍යාලයේ 6-13 ශ්‍රේණිවල සියලුම සිසුන්ගෙන් පුස්තකාල පරිහරණය පිළිබද සංගහන ක්‍රමවේදය මගින් පාසල් පුස්තකාලයාධිපතිතුමියගෙන් ලබාගත් තොරතුරු මත පදනම් විය. ඒ අනුව පාසලේ ඉගෙනුම ලබන පිරිමි දරුවන්ගෙන් 25% ක් පමණ පුස්තකාලය පරිහරණය කරන අතර ගැහැණු දරුවන්ගෙන් 45% ක් පමණ පුස්තකාල භාවිතයට යොමු වී තිබේ. මේ පිළිබඳ අදහස් විමසන විට පුස්තකාලයාධිපතිනියගෙන් අනාවරණය වුයේ දරුවන් ප්‍රධාන වශයෙන් කතා පොත් කියවීම කෙරෙහි ප්‍රධාන වශයෙන් උනන්දු වී ඇති අතර අධ්‍යයන කටයුතු සම්බන්ධව පොත්පත් පරිහරණය කරනුයේ ඉතා අල්ප වශයෙන් බවයි. තව දුරටත් 6 - 13 සිසුන්ගෙන් අදහස් විමසන විට ඔවුන්ගේ අදහස වුයේ පාසලෙන් ලබාදෙන දැනුමට අමතර දැනුම වෙනත් පංති මගින් ලබාගත හැකිබවත්, වෙනත් දැනුම අන්තර්ජාලය මගින් ලබාගත හැකි බවත් ය. එහිදී පුස්තකාල භාවිතය එතරම් සුවිශේෂී නොවන බවත්ය. පුස්තකාල භාවිත කරන දරුවන් අතරද විශාල වශයෙන් මේ සඳහා යොමු වී ඇත්තේ 6, 7, 8 ශ්‍රේණිවල සිසුන් වීමද වැදගත් වේ. මේ අනුව පාසල් සිසුන් බොහෝමයක් පුස්තකාලය භාවිතා කළේ අඩුවෙන් බවත් ,ඒ තුළින් කතා පොත් කියවීමට ප්‍රමුඛ ලෙස භාවිතා කරන බවද, දරුවන් විශාල වශයෙන් බාහිර පංති සඳහා යොමු වීමත්, තරඟකාරී අධ්‍යාපන ක්‍රමවේදය තුළ දරුවන් ඉතා අවිවේකී පුද්ගලයන් පිරිසක් බවට පත් වී ඇති බවද මෙමඟින් අනාවරණය විය. තවද පාසල් පුස්තකාල පද්ධතිය දරුවන්ට ප්‍රිය වු ස්ථානයක් බවට පත් කිරීමත්, පාසල් තුළින් දරුවන් පුස්තකාලය වෙත යොමු කළ යුතු බවත් මෙයින් ගම්‍ය විය.


**මුඛ්‍ය පද :** පුස්තකාල භාවිතය, පාසල් දරුවන්, අධ්‍යාපන ක්‍රමවේදය

[1] ආර්ථික විද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, jeevagb@gmail.com

# ශ්‍රී ලංකාවේ රෙදිපිළි හා ඇඟළුම් කර්මාන්තය මුහුණපාන ගැටලු පිළිබඳ අධ්‍යයනයක්

**පී. එම්. පී. සී. ගජනායක,**[1]

## සංක්ෂේපය

වර්තමාන ශ්‍රී ලංකාවේ රෙදිපිළි හා ඇඟළුම් කර්මාන්තය දල දේශීය නිෂ්පාදිතයට අපනයන ඉපැයුම් වලට සහ සේවා නියුක්තිය සම්බන්ධයෙන් වැදගත් දායකත්වයක් සපයමින් ආර්ථිකයේ වැදගත් අංශයක් බවට පත් වී ඇත. මේ නිසා 1986 වර්ෂයෙන් පසුව කෘෂි අපනයන වලට ලැබී තිබූ වැදගත්කම කාර්මික අපනයන වලට විතැන් විය. මේ සඳහා දායකත්වය සැපයූ ප්‍රධාන කාර්මික අපනයන අංශය වූයේ ශ්‍රී ලංකාවේ රෙදිපිළි හා ඇඟළුම් කර්මාන්තයයි. ශ්‍රී ලංකාවේ රෙදිපිළි කර්මාන්තය පිළිබඳ මෙවැනි තත්වයක් පැවතුනත් මතුවන ගැටලුව වනුයේ මෙම කර්මාන්ත අංශය සැබෑ වශයෙන්ම මෙවැනි වැදගත් තත්ත්වයක පවතීද යන්නයි. මෙම අධ්‍යයනය ඒ සම්බන්ධවයි. මේ අනුව අධ්‍යයනයේ අරමුණ වනුයේ ශ්‍රී ලංකාවේ රෙදිපිළි හා ඇඟළුම් කර්මාන්තයේ උපනතීන්, ගැටලු හා අනාගතයේ මුහුණ දීමට ඇති තත්ත්වයන් විමසා බැලීමයි. මෙවැනි අධ්‍යයනයක් මෙම අංශයේ ප්‍රතිපත්ති සම්පාදනයේදී වැදගත් වේ. මේ සඳහා භාවිතයට ගත් දත්ත ද්විතීක දත්ත වන අතර සේවක වැටුප්, ඇඟළුම් නිෂ්පාදන ආදී දත්ත ලබා ගැනීමට සම්මුඛ සාකච්ඡා ක්‍රමය භාවිතා කරන ලදී. මෙම දත්ත සංඛ්‍යානමය, විශ්ලේෂණ ක්‍රම ඔස්සේ විශ්ලේෂණය කර ඇත. මේ අනුව අධ්‍යයනය මගින් හඳුනා ගත හැකි වූයේ ශ්‍රී ලංකාවේ රෙදිපිළි හා ඇඟළුම් කර්මාන්තය ප්‍රධාන වශයෙන් අපනයනයට යොමු වූ ආනයන අමුද්‍රව්‍ය මත දැඩි රැඳියාවක් දක්වන තත්ත්වයට පත් වී ඇති බවයි. එමෙන්ම මෙම අංශයේ එකතු කල අගය සාපේක්ෂව අඩු මට්ටමක පවතින අතර කෝටා ක්‍රමය, වෙළඳ ගිවිසුම්, බහුජාතික සමාගම් ආදිය ද මෙම කර්මාන්තයට අහිතකර ලෙස බලපා ඇත. ඒ අනුව මෙම කර්මාන්තය අතර පවතින අතරමැදිකරණය අවම කර විදේශීය පුද්ගලික ආයෝජන විශාල වශයෙන් මෙරටට ගෙන්වා ගත යුතුය. විදේශීය ආයෝජකයින් ගෙන්වා ගැනීමේ නව තාක්ෂණය භාවිතයත්, එමෙන්ම රට තුළ දේශපාලන ස්ථාවරභාවයත් සාමකාමී පරිසරයත් පවත්වා ගත යුතුය. එමගින් ශ්‍රී ලංකාවේ රෙදිපිළි කර්මාන්තය තුළ සැබෑ සංවර්ධනයක් හඳුනා ගත හැකි බව නිගමනය කළ හැක.

**මුඛ්‍ය පද :** ශ්‍රී ලංකාවේ ඇඟළුම් කර්මාන්තය, දල දේශීය නිෂ්පාදනය, අපනයන ඉපැයුම්, අතරමැදිකරණය

[1] ආර්ථික විද්‍යා අධ්‍යන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, gayanigajanayaka@gmail.com

# මහජන මතය නිර්මාණය වීම කෙරෙහි නව මාධ්‍යයේ බලපෑම අන්තර්ජාලය හා ෆේස්බුක් ඇසුරින්

**එල්. යූ. එස්. ප්‍රනාන්දු**[1]

**සංක්ෂේපය**

ජන මාධ්‍යයේ හැසිරීම රාජ්‍යයේ සමාජයීය, දේශපාලනික, ආර්ථික, සංස්කෘතික සහ ආගමික යන සෑම ක්ෂේත්‍රයක් තුළම බලපෑම් ඇති කිරීමට සමත් වූවකි. දේශපාලනය හා මාධ්‍යය අතර ඉතා සමීප සම්බන්ධතාවක් දැකිය හැකිය. වර්තමානය වන විට, දේශපාලන ක්‍රියාවලිය තුළ සාම්ප්‍රදායික මාධ්‍යය ඉක්මවමින් නව මාධ්‍යයේ හැසිරීම ප්‍රබලව බලපෑම් කරයි.. මෙය මැතිවරණ ක්‍රියාවලිය තුළ වැඩි වශයෙන් පෙන්නුම් කරයි. මැතිවරණ ප්‍රචාරණය තුළ දැවැන්තව මෙම නව මාධ්‍යයේ භූමිකාව නිරූපණය වේ. නව මාධ්‍යය යනු, විසිවන සියවස අවසානයේදී මතු වූ පුළුල් අර්ථයක් සහිත යෙදුමකි. මෙම නව මාධ්‍යයන් අතර වඩාත් කැපී පෙනෙන්නේ, සමාජ ජාල වෙබ් අඩවි හා අන්තර්ජාලයයි. මැතිවරණ ආශ්‍රිතව මහජන මතය නිර්මාණය ඉතාම වැදගත් වේ. ජනතා නියෝජිතයින් ජනමතය දිනා ගැනීම සඳහා වර්තමානය වන විට, අන්තර්ජාලය සහ සමාජ ජාල ඔස්සේ විවිධ ක්‍රමෝපායන් භාවිත කරනු ලබයි. මෙම අධ්‍යයනය තුළින් බලාපොරොත්තු වන්නේ, මැතිවරණ ක්‍රියාවලිය තුළ මහජන මතයේ වැදගත්කම පිළිබඳවත්, මහජන මතය නිර්මාණය සම්බන්ධයෙන් නව මාධ්‍යයන් ලෙස සමාජ ජාල සහ අන්තර්ජාලයේ ක්‍රියාකාරීත්වය බලපාන්නේ කෙසේද සහ එහි හැසිරීම මහජනතාවගේ මතයන් වෙනස් කිරීමට බලපාන්නේද යන්න පිළිබඳව විමසා බැලීමයි. ඒ අනුව මෙම අධ්‍යයනයේ ප්‍රධාන ගැටලුව වන්නේ, මැතිවරණ කාල සීමාවන්හිදී මහජන මතය නිර්මාණය කිරීම සම්බන්ධයෙන් සමාජ ජාල සහ අන්තර්ජාල ප්‍රචාරණයන් ප්‍රබල බලපෑමක් සිදු කරන්නේද යන්නයි. මෙම අධ්‍යයනයේ ක්ෂේත්‍ර අධ්‍යයනය සඳහා කැලණිය විශ්වවිද්‍යාලයේ විද්‍යාර්ථයින් අතරින් අහඹු ලෙස තෝරාගත් 50 දෙනෙකුගෙන් හා අහඹු ලෙස තොරගත් ෆේස්බුක් ගිණුම් හිමියන් 50 දෙනෙකුගෙන් නියැදිය තෝරාගනු ලබයි. මෙහි දත්ත රැස් කිරීමේදී, ප්‍රාථමික දත්ත රැස් කිරීමේ ක්‍රම වන ප්‍රශ්නාවලි ක්‍රමය සහ සම්මුඛ සාකච්ඡා ක්‍රමය යොදා ගන්නා අතර ද්විතියීක දත්ත රැස් කිරීම සඳහා අධ්‍යයන මාතෘකාවට අදාළ ග්‍රන්ථ, ලිපි ලේඛන, පුවත්පත්, සඟරා සහ අන්තර්ජාල තොරතුරු ආදිය යොදා ගනී. පර්යේෂණයේ ප්‍රමාණාත්මක දත්ත සරල සංඛ්‍යානමය විධික්‍රම ඔස්සේද, ගුණාත්මක දත්ත විස්තරාත්මක ක්‍රමවේදය ඔස්සේ ද විශ්ලේෂණය කරයි. මෙම ක්‍රම ඔස්සේ මහජන මතය නිර්මාණය සම්බන්ධයෙන් නව මාධ්‍යය කටයුතු කරන ආකාරය හා එහි බලපෑම නිවැරදි ජනමතයන් බිහිකිරීමට සමත් වනවාද යන්න පිළිබඳවද සලකා බලනු ලබයි. ඒ අනුව මෙම අධ්‍යයනයේදී ගම්‍ය වූ නිගමන වුයේ, මහජන මතය නිර්මාණය කිරීම සඳහා මාධ්‍යය විශාල බලපෑමක් සිදුකරන බවත්, වර්තමානයේ මහජන මතය ගොඩනැගීම තුළ ෆේස්බුක් වැනි නව මාධ්‍යයන් ප්‍රබල භූමිකාවක් නිරූපණය කරන බවත් ය.

**මුඛ්‍ය පද** : දේශපාලන සන්නිවේදනය, මහජන මතය, අන්තර්ජාලය, ෆේස්බුක්

[1] ආර්ථික විද්‍යා අධ්‍යන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, lumeshikasayuri@gmail.com

# Evaluating the impact to travel time by Expressways in Sri Lanka Colombo – Katunayake Expressway

**S. A. D. M.D. A. Wijesinghe**[1]

## Abstract

Transportation is one of a vital factor when we consider the infrastructure of a country. At present, there are 3 major expressways, which are already built, and one is still under construction. A hypothesis would be, travel time is a major factor that a traveller would consider when they choose the mode of travel or the route. Even though an expressway allows a user to travel at faster speeds than in a regular highway, the save of time is questionable depending the length of travel. So the objective of this research was to carry out a travel time analysis on Colombo – Katunayake Expressway to identify any travel time saving. In this research, I have used direct observation to collect data. As per the calculations done, it is evident that the expressway is the most convenient road for the passengers to travel either direction without facing any unwanted delay. With the limited data collected for this research, the calculations were done using the percentagewise. When the percentagewise calculation is done, we could see that travelling on the expressway is saving almost 40%-50% of the time than using the A3 road. Travelling on the expressway; On a weekday from K-C will reduce time by 47.3% , On a weekday from C-K will reduce time by 41.1% , On a weekend from K-C will reduce time by 42.2% , On a weekend from C-K will reduce time by 32.2% and also, On a weekday from Colombo to Ja-ela it will reduce time by 56.15% . Therefore, it can be clearly seen that E3 road is an effective successful infrastructure development took place in Sri Lanka because it significantly deduct the time of the people that is wasted to the road. Finally, it can be recommended that for a passenger who needs to travel quickly can use the expressway. So obviously, journey is fast. However, passengers have to pay when using this road. In addition, at the same time, if the passenger is not in a hurry and not willing to pay can use the A3 road.

**Keywords :** Travelling, Colombo – Katunayaka Expressway, Infrastructure

[1] Department of Economics, University of Kelaniya, dilumiasinsana@yahoo.com

# තේ වැවිලිකරු මුහුණපාන ගැටලු පිළිබඳ අධ්‍යයනයක් (මාතර දිස්ත්‍රික්කයේ දෙනියාය ප්‍රදේශය ඇසුරින්)

ආර්. ඩී. චතුරංග[1]

**සංක්ෂේපය**

තේ දල්ල ගසෙන් වෙන්කර ගන්නා අවස්ථාවේ සිට එය කර්මාන්ත ශාලාවට ගෙන ගොස් භාර දෙන අවස්ථාව දක්වා තේ හිමියන්ට විවිධ ගැටලු වලට මුහුණ පෑමට සිදුවේ. එමෙන්ම වත්මන් දේශගුණික තත්වයද මේ සඳහා විශාල බලපෑමක් කරනු ලබයි. මෙසේ විවිධ කරුණු හේතුවෙන් බොහෝ තේ හිමියන් තේ වගාවෙන් ඉවත් වී වෙනත් වැවිලි වගාවන් කෙරේ යොමුවනු දැකිය හැකිය. මේ හේතුවෙන් තේ වගාව තුළින් ඉවත් වී ඔවුන් වෙනත් වැවිලි කෙරේ අවධානය යොමු කරන්නේ කුමන සාධක මතද යන්න සොයා බැලීම මූලික අරමුණු විය. ඒ අනුව 2016 සැප්තැම්බර් මාසයේ මාතර දිස්ත්‍රීක්කයේ දෙනියාය ප්‍රදේශයේ කොටපොල ග්‍රාමයේ තේ ඉඩම් හිමි වැවිලි කරුවන් 50 දෙනෙකු සසම්භාවී ලෙස තෝරා ගනිමින් ප්‍රශ්නාවලි ක්‍රමය හා ඇලැන්වැලිය, සමූපාකාර හා යෝල්ටා යන තේ කර්මාන්තශාලා හරහා ලබාදෙනු ලැබූ ද්විතීක දත්ත මුලාශ්‍ර ඇසුරින් දත්ත ලබා ගැණිනි. මෙම දත්ත ප්‍රමාණාත්මක විශ්ලේෂණ ක්‍රම ඔස්සේ විශ්ලේෂණ කර ඇති අතර ලබාගත් ප්‍රතිඵල වලට අනුව නියැදියෙන් බහුතරයක් ඉඩම් අක්කර 0-2 ත් අතර හිමිකරුවන් බවත් 80% ක් පමණක් සින්නක්කර ඉඩම් හිමියන් බවත් ඉතිරි 20% බදු ඉඩම් බවත් 85%ක්ම රජය විසින් ගෙනෙන ලද පොහොර සහනාධාරය අත් විඳින බවත් නියැදියෙන් 70% ක්ම තේ වගාව පමණක් කරන අතර ඉතිරි 30% තේ වගාවට අමතරව කුරුඳු, ගම්මිරිස්, කරාබුනැටි ආදිය ද වගාකරන බවත් පැහැදිලිය. තවද ඉහත 30%න්, 50%ක්ම පෙරදී කරන ලද්දේ තේ වගාව පමණක් බවත් විවිධ ගැටලුකාරී තත්ත්ව හේතු කොටගෙන වෙනත් වැවිලි වගාවන් සඳහා යොමු වී ඇත. තවද ඉතිරි වැවිලි කරුවන් 70% න් 75% ක්ම තේ වගාවෙන් ලැබෙන ආදායමෙන් තෘප්තිමත් නොවන බවත් අනාගතයේ වෙනත් බෝග වගාවන් කෙරේ යොමු වීමට අදහස් කරයි. තවද තේ කර්මාන්කශාලා මගින් ලබාගත් තොරතුරුවලට අනුව වසරකදී ලැබෙන තේ දළු ප්‍රමාණය 2014 වසරට වඩා 2015 වසරේ 13% කින් පහළ බැස ඇති බවත් නමුත් තේ මිලෙහි ඉහළ දැමීමක් සිදු වී නැති බවත් ය. මේ අනුව තේ වගාවෙන් වෙනත් වගා කෙරේ වැවිලි කරුවන් යොමු වීමට තේ දළු සඳහා ප්‍රමාණවත් මිලක් නොලැබීම, ප්‍රමාණවත් අකාරයට රජයේ මැදිහත්වීමක් නැතිවීම, වසරේ වැඩි කාලයක් පවතින නියඟ තත්ත්වය හා කම්කරුවන්ගේ හිඟයද බලපා ඇති බව මෙයින් අනාවරණය විය. ඒ අනුව තේ වගාවේ උන්නතිය කෙරේ රජයේ මැදිහත් වීම වැඩි කර ගුණාත්මක පොහොර හා ණය ලබාදෙමින් ජල සැපයුම් ක්‍රියාවලියක් ලබා දෙමින් තේ මිලෙහි ඉහළ දැමීම හා කම්කරු වැටුප ඉහළ නැගීම මගින් තේ වගාවේ පසුබෑම වලක්වාගත හැක.

**මුඛ්‍ය පද :** තේ වගාව, පවතින ගැටලු, වගාවේ උන්නතිය

[1] ආර්ථික විද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය,
dinuchathuranga1992@gmail.com

# ඉංග්‍රීසි අධ්‍යාපන සාධනය කෙරෙහි බලපාන සමාජ ආර්ථික සාධක හඳුනා ගැනීම.
## (කුරුණෑගල දිස්ත්‍රික්කයේ නිකවැරටිය අධ්‍යාපන කලාපයේ පාසලක් ඇසුරින්)

ආර්. පී. ඩී. එන්. වයි. ප්‍රේමරත්න[1]

**සංක්ෂේපය**

වර්තමානය දක්වා කාලය තුළ ඉංග්‍රීසි අධ්‍යාපනයේ වර්ධනය උදෙසා අධ්‍යාපන ප්‍රතිසංස්කරණ කිහිපයක්ම සිදු වුවද ඉන් ඇති වූ බලපෑම එතරම් තෘප්තිමත් මට්ටමක නැත. ශිෂ්‍යයින්ගේ සමාජ ආර්ථික පසුබිම අධ්‍යයනය කිරීමේදී ඔවුන්ගේ දෙමාපියන්ගේ අධ්‍යාපන මට්ටම, ආදායම් මට්ටම සහ වෘත්තීමය කීර්තිමත්භාවය පදනම් කර ගන්නා ලදී. භාෂාවක් ඉගෙනීමේදී ඒ සඳහා බලපාන සාධක පිළිබඳ පෙර සාහිත්‍යයන් විමර්ශනය කරමින් අධ්‍යයනය සිදු කරන ලදී. ශ්‍රී ලංකාවේ ඉංග්‍රීසි භාෂා සාක්ෂරතාවය අවම මට්ටමක පැවතීමට සමාජ පසුබිම සහ ආර්ථික මට්ටම සිදු කරනු ලබන බලපෑම අධ්‍යයනය කිරීම මෙම අධ්‍යයනයේ මූලික අරමුණ වෙයි. මෙම අධ්‍යයනය සඳහා කුරුණෑගල දිස්ත්‍රික්කයේ නිකවැරටිය අධ්‍යාපන කලාපයේ නික/වාරි පාදෙනිය ශ්‍රී සුනන්ද මහා විද්‍යාලයේ සිසුන් 100 දෙනෙකුගෙන් යුත් නියැදියක් සසම්භාවී ලෙස තෝරා ගන්නා ලදී. මෙම අධ්‍යයනය සඳහා ප්‍රශ්නාවලි මගින් දත්ත රැස්කර ගන්නා ලදී. ප්‍රශ්නාවලි මගින් රැස්කර ගන්නා ලද ප්‍රමාණාත්මක දත්ත වගු, ප්‍රස්තාර මගින් ඉදිරිපත් කොට ඇති අතර කයි වර්ග පරීක්ෂා මගින් දත්ත විශ්ලේෂණය සිදු කර ඒ මගින් ශිෂ්‍යන්ගේ සමාජ ආර්ථික පසුබිම ඉංග්‍රීසි විෂය සාධනය කෙරෙහි බලපෑම කරන්නේ දැයි පරීක්ෂා කරන ලදී. මෙම පර්යේෂණයෙන් අනාවරණය වූයේ, ඉහළ අධ්‍යාපන මට්ටමක් සහ ආදායම් මට්ටමක් සහිත දෙමාපියන් තම දරුවන් ඉංග්‍රීසි විෂයට උපකාරක පන්ති වලට යොමු කිරීමෙන්ද නිවසේදී වැඩි කාලයක් ඉංග්‍රීසි අධ්‍යාපන කටයුතු වලට යොමු කිරීමෙන්ද අමතර පොත්පත්, පුවත්පත් ලබාදීමෙන්ද පුස්තකාල පහසුකම් අන්තර්ජාල පහසුකම් සැපයීමෙන්ද ඉංග්‍රීසි විෂය සාධනය කෙරෙහි බලපෑම් සිදු කරන බවයි. ඉංග්‍රීසි විෂය සාධනය අඩු මට්ටමක් සහිත සිසුන්ගේ දෙමාපියන් අඩු අදායම් සහ අඩු අධ්‍යාපන මට්ටමක් සහිත බවත් ඔවුන් ඉහළ වෘත්තීමය තත්වයක පසු නොවන්නන් බවත් අනවරණය විය. ඒ අනුව එම සිසුන්ගේ ඉංග්‍රීසි විෂය සාධනය වැඩි කර ගැනීමට කටයුතු කළ යුතු බව අධ්‍යනයෙන් හෙළි විය. ඒ සඳහා පාසල් ඉංග්‍රීසි ගුරුවරුන් පුහුණු වැඩසටහන් සඳහා නිතර යොමු කරවීම, ඉංග්‍රීසි ගුරුවරුන්ගේ ඉගැන්වීම් කටයුතු ඇගයීමකට ලක්කිරීම විශේෂයෙන්ම ඉංග්‍රීසි කියවීම, ලිවීම, කථනය සහ ශ්‍රවනය සම්බන්ධීකරණය කරමින් ඉගැන්වීමට අදාළ සුදුසු ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම සිදු කළ යුතුය.

**මුඛ්‍ය පද** : සමාජ ආර්ථික පසුබිම, ඉංග්‍රීසි අධ්‍යාපන මට්ටම, අධ්‍යාපන සාධනය

[1] ආර්ථික විද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, yashodhani199@gmail.com

# ග්‍රාමීය සමාජයීය ආර්ථිකයට ඇඟළුම් ක්ෂේත්‍රයෙන් ලැබෙන දායකත්වය පිළිබඳ විමසීමක්.

**ඩී. එස්. ආර්. හේමචන්ද්‍ර**[1]

**සංක්ෂේපය**

මෙම පර්යේෂණයේ මූලික අරමුණ වූයේ, ග්‍රාමීය ආර්ථික සංවර්ධන ක්‍රියාවලිය සඳහා රෙදිපිළි ඇඟළුම් කර්මාන්තය මගින් ලැබුණු දායකත්වය හා එම කර්මාන්තය මුහුණපාන අනාගත අභියෝගය අධ්‍යයනය කිරීමයි. අධ්‍යයන ප්‍රදේශය ලෙස මෙහි දී තෝරා ගනු ලැබුවේ රත්නපුර දිස්ත්‍රික්කයේ බලංගොඩ මැතිවරණ කොට්ඨාසයයි. ප්‍රාදේශීය කාර්මීකරණ වැඩපිළිවෙළ යටතේ මැලිබන්, රෙඩ්හාට් වශයෙන් ඇඟළුම් කර්මාන්ත දෙකක් මෙම අධ්‍යයන ප්‍රදේශය තුළ පිහිටුවා ඇති අතර මෙම කර්මාන්ත ශාලා දෙකම නියෝජනය වන පරිදි සේවක සේවිකාවන් 60 කින් යුතු නියැදියක් තෝරා ගැනුණි. තොරතුරු ලබා ගැනීම සඳහා ප්‍රශ්නාවලියක් යොදා ගත් අතර ප්‍රශ්නාවලියේ නොමැති එහෙත් අත්‍යවශ්‍ය කරුණු සේවකයින්ගෙන් මෙන් කර්මාන්ත වල කළමනාකරුවන්ගෙන් සම්මුඛ සාකච්ඡා මගින් ලබා ගැනුණි. ඇඟළුම් කර්මාන්ත හා ඒ ආශ්‍රිත ද්විතික දත්ත ලබා ගැනීමේ දී ශ්‍රී ලංකා මහ බැංකු වාර්තා, පොත්පත්, සඟරා, ලිපි ලේඛන ආදිය භාවිතා කෙරුණි. දත්ත විශ්ලේෂණය සඳහා විස්තරාත්මක ක්‍රමය සහ සංඛ්‍යානමය ක්‍රමවේදයන් භාවිත කළ අතර මෙහිදී සංඛ්‍යා වගු සටහන් මඟින් ඉදිරිපත් කරන ලද දත්ත තවදුරටත් පැහැදිලි කිරීම සඳහා ප්‍රස්තාර සටහන් යොදා ගැනුණි. විචල්‍යයන් දෙකක ස්වායත්තතාවය පරීක්ෂා කිරිම සඳහා කයි වර්ග පරීක්ෂාව යොදා ගත් අතර ඇඟළුම් සේවකයින් සේවයෙන් ඉවත් වීමට හේතු පැහැදිලි කිරීමට හරිත මධ්‍යන්‍ය සංකල්පය භාවිතා කෙරුණි. මෙහි දී විචල්‍යයන් ලෙස ඇඟළුම් සේවක සංඛ්‍යාව, ආදායම, වියදම් කළ අයිතමයන්,රැකියා අහිමි වීමට බලපෑ හේතු ලෙස ඇඟළුම් සේවක සේවිකාවන් දක්වන කරුණු යොදා ගැනේ. පවතින සීමාවන් හැකිතරම් අවම වන පරිදි ලබා ගත් තොරතුරු භාවිතයෙන් පර්යේෂණය සිදු කරන ලදි. ප්‍රදේශීය මට්ටමින් බිහි වූ ඇඟළුම් කර්මාන්තවල සේවය සඳහා ග්‍රාමීය තරුණ තරුණියන්ට අවස්ථාව සැලසුන අතර විරැකියාවෙන් පෙළුණු තරුණ තරුණියන්ට රැකියා අවස්ථා ලැබුණි.ග්‍රාමීය පිහිටවනු ලැබූ ඇඟළුම් කර්මාන්ත හේතුවෙන් දුෂ්කර ප්‍රදේශවලින් වෙළෙඳ කලාප වලට ඇදුණු ග්‍රාමීය තරුණ තරුණියන්ගේ ප්‍රමාණය සංඛ්‍යාත්මකව අඩු වූ අතර එයින් යහපත් සමාජීය හා ආර්ථික බලපෑම් ඇති විය. එනම් ඔවුන්ගේ නිවෙස්වලින් ඈත්වීමෙන් සිදු වන අයහපත් බලපෑම් අඩු වීම මෙන්ම තම ප්‍රදේශවලම සේවය කිරීමට අවස්ථාව සැලසීම නිසා ඔවුන්ට වැඩිපුර මුදල් ඉතිරි කිරීමට ද හැකියාව ලැබී ඇත. වර්තමාන ආර්ථික අවපාතය හමුවේ ඇඟළුම් කර්මාන්ත වැසී ගියහොත් ග්‍රාමීය ජනතාවට මුහුණ දීමට සිදුවන ගැටලු හා රජය ඒ සඳහා යොදා ගන්නා විකල්ප සංවර්ධන ක්‍රියාවලිය කුමක් ද යන්න තක්සේරු කිරීමට ද මෙම අධ්‍යයනය වැදගත් වේ.

**මුඛ්‍ය පද :** ඇඟළුම් කර්මාන්තය, සංවර්ධන ක්‍රියාවලිය, ග්‍රාමීය ජනතාව

[1] ආර්ථික විද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, rajinishakila@gmail.com

# රූපවාහිනී වෙළඳ දැන්වීම් ළමා මනස කෙරෙහි ඇති කරවනු ලබන බලපෑම

**ඊ. එල්. ඊ. ඩී. පී. කුමාරි**[1]

**සංක්ෂේපය**

ළමා ප්‍රේක්ෂකයින් රූපවාහිනී දැන්වීම් කෙරෙහි ආකර්ෂණය වීම දෙස් විදෙස් ව්‍යාපාරික ප්‍රජාවට සිය භාණ්ඩ හා සේවා අලෙවියෙහි කදිම ආධාරයකි. මෙලෙස විකාශනය කරන ලද රූපවාහිනී දැන්වීම් ළමා මනස කෙරෙහි ඇති කරනු ලබන බලපෑම කෙබඳු ද යන්න විමසීම මෙම පර්යේෂණයේ ප්‍රධාන අරමුණ විය. ශ්‍රී ලංකාව තුළ පවතින රූපවාහිනී නාලිකා අතරින් ජනප්‍රිය නාලිකා 5ක් තෝරාගනිමින් එම නාලිකා තුළ 2016 වසරේ විකාශය වූ වඩාත් ජනප්‍රිය දැන්වීම් පාදක කරගනිමින් මෙම පර්යේෂණය දියත් කරන ලදී. මේ සඳහා කුරුණෑගල දිස්ත්‍රික්කයේ නිකවැරටිය ජයන්ති නවෝදයා පාසලේ 6 වන ශ්‍රේණියේ ළමුන් 100 න් යුතු නියදියක් අහඹු ලෙස තෝරා ගන්නා ලදී. එමෙන්ම ඔවුන්ගේ දෙමාපියන්ගෙන්ද තොරතුරු ලබා ගන්නා ලදී. දත්ත රැස් කිරීමේදී ප්‍රශ්නාවලි ක්‍රම, සම්මුඛ සාකච්ඡා ආදිය මගින් තොරතුරු ලබාගන්නා ලදී. දත්ත විශ්ලේෂණයට අනුව ක්ෂේත්‍ර සමීක්ෂණයට භාජනය වූ සියලුම ළමා ග්‍රාහකයෝ රූපවාහිනිය නැරඹීමට කැමැත්තක් දක්වන අතර වෙළඳ දැන්වීම් නැරඹීමටද කැමැත්තක් දක්වයි. එසේම ආර්ථික මට්ටම කෙබඳු වුවත් 95% නිවෙස්වල රූපවාහිනී යන්ත්‍ර තිබෙන බව දක්නට ලැබිණ. වෙළඳ දැන්වීම් සඳහා ඇති ආකර්ෂණය පිළිබඳ විමසීමේදී පිරිමි ළමුන් 45% ක් ද, ගැහැණු ළමුන් 55% ක් ද විය. මේ අනුව ගැහැණු හා පිරිමි ළමුන් එකසේ මෙම රූපවාහිනී දැන්වීම් නැරඹීමට ප්‍රිය බව දක්නට ලැබුණි. ළමයින් යොදාගෙන කරන වෙළඳ දැන්වීම් කෙරෙහි ළමයින් වැඩි ආකර්ෂණයක් දක්වන බවත් විවිධ නිෂ්පාදන සඳහා තෑගි භාණ්ඩ ලබාදීම ළමයින් අතර ඉතා ජනප්‍රිය පුවත් දක්නට ලැබුණු අතර එම තෑගි භාණ්ඩ ලබාගැනීමට දෙමාපියන්ව ළමයින් විසින් පොළඹවන බවත් නිගමනය විය. මෙම නිගමන හා පර්යේෂණය පදනම් කරගත් කරුණු මත එළඹිය හැකි අවසන් නිගමනය වූයේ, වෙළඳ දැන්වීම් ළමා මනස කෙරෙහි දැඩි බලපෑමක් ඇතිකරන බවයි. මේ හේතුවෙන් ළමා නිෂ්පාදන අලෙවිය සඳහා නිර්මාණය කරන ලද වෙළඳ දැන්වීම් ප්‍රචාරයට පෙර ළමා මනෝ වෛද්‍ය විශේෂඥයන්ගේ අධීක්ෂණය යොමු කර අවසර ලබාගත යුතු වීම යෝජනා කළ හැකිය.

**මුඛ්‍ය පද :** රූපවාහිනී වෙළඳ දැන්වීම්, ළමා මනස, රූපවාහිනී මාධ්‍ය, ළමා ග්‍රාහකයින්

[1] ආර්ථික විද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, kumaridinusha199@gmail.com

# තරුණ ප්‍රජාව මත්පැන් භාවිතයට පෙලඹීම කෙරෙහි පවුල සහ සම වයස් කණ්ඩායම්වල බලපෑම

කේ. ඒ. ඩී. එස්. කාරියප්පෙරුම[1]

## සංක්ෂේපය

මත්පැන් භාවිතය හා අවභාවිතය ලොව පුරා සියලු මරණයන්ගෙන් 6% ප්‍රතිශතයකි. තරුණ ප්‍රජාව මත්පැන් කෙරෙහි යොමු වීමේ වැඩි ප්‍රවණතාවක් වර්තමානයේ දී දක්නට ලැබේ. මෙම අධ්‍යයනයේ අරමුණ වී ඇත්තේ, පවුල සහ සම වයස් කණ්ඩායම් යන සමාජ සාධක තරුණ ප්‍රජාවගේ මත්පැන් භාවිතය කෙරෙහි බලපාන ආකාරය අධ්‍යයනය කිරීමයි. මෙම අධ්‍යයනය සඳහා ප්‍රාථමික දත්ත රැස් කිරීමට කැලණිය විශ්වවිද්‍යාලයේ විද්‍යාර්ථීන් (පිරිමි) 100 දෙනෙකු තෝරා ගැනුණු අතර ප්‍රශ්නාවලි ක්‍රමය යටතේ දත්ත රැස්කර ගන්නා ලදි. මෙම අධ්‍යයනයට අනුව 78% දෙනෙකුගේ පවුලේ කිසියම් සාමාජිකයෙක් මත්පැන් භාවිතයට යොමු වී ඇති අතර නියැදියෙන් 85% දෙනෙකුගේ මිතුරන් මත්පැන් භාවිතයට යොමු වී තිබේ. ඒ අනුව විද්‍යාර්ථීන්ගෙන් 86% ක් මත්පැන් භාවිතයට යොමු වී ඇති අතර ඉන් 93% දෙනෙකුගේ පවුලේ සාමාජිකයෙකු හෝ මිතුරන් මත්පැන් පානය කරයි. අධ්‍යයනයට අනුව තරුණ ප්‍රජාවගේ මත්පැන් භාවිතයට යොමු වීම හා ඊට පවුලේ හා සම වයස් කණ්ඩායම් වල බලපෑම අතර සහසම්බන්ධතාවය 0.88 කි. ඒ අනුව තරුණ ප්‍රජාව මත්පැන් භාවිතයට යොමු වීම කෙරෙහි වෙළඳ ප්‍රචාරණය, මාධ්‍ය වල බලපෑම, සමාජ පංතිය, මානසික පීඩනය ආදී කරුණු ද හේතු වී ඇතත් පවුලේ හා සම කණ්ඩායම් වල බලපෑම මීට ප්‍රබලව හේතු වී ඇති බව නිගමනය කළ හැක. දෙමව්පියන්ගේ මග පෙන්වීම, පෞරුෂ වර්ධනය, දෙමව්පියන් තරුණ දරුවන් පිළිබඳ විමසිලිමත් වීම, සමාජ මාධ්‍යජාල වල සහ සමාජයේ සහයෝගය ආදී කරුණු තරුණ ප්‍රජාවගේ මත්පැන් භාවිතය අවම කිරීම සඳහා යෝජනා ලෙස ඉදිරිපත් කළ හැක.

**මුඛ්‍ය පද :** තරුණ ප්‍රජාව, මත්පැන් භාවිතය, පවුල, සම කණ්ඩායම්, සමාජ මාධ්‍ය ජාල

[1] ආර්ථික විද්‍යා අධ්‍යයනය අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, kadsupeshala@gmail.com

# ශ්‍රී ලංකාවේ තේ කර්මාන්තයේ මෑත කාලීන නිෂ්පාදන පිරිවැයේ හැසිරීම.

ඩබ්. ඒ. ඩී. ටී. එස්. මානපුරාව[1]

**සංක්ෂේපය**

ශ්‍රී ලංකාවේ අපනයන සංයුතියේ තේ කර්මාන්තය ආශ්‍රිත ව කරනු ලබන නිෂ්පාදනයන් දෙවන වනුයේ, ඇඟළුම් කර්මාන්තය ආශ්‍රිත නිෂ්පාදනයන්ට පමණක් වන බැවින්, තේ කර්මාන්තය මෙරට ආර්ථිකයට විශාල දායකත්වයක් සපයනු ලබන සුවිශේෂී කර්මාන්තයක් වේ. නමුත්, මෑත කාලය තුළ මෙම කර්මාන්තය ඉතා සෙමින් වර්ධනය වන අතර, වගා බිම් ප්‍රමාණය හෙක්ටයාර 222,000 පමණ ස්ථාවරව පවතින බවත්, මෑත වසර 10 ක කාලය තුළ සාමාන්‍යයෙන් වර්ෂයකට 3.53% පමණ දළ දේශීය නිෂ්පාදනයෙන් අඩු වී ඇති අතර දේශීය වෙළඳපළ මිල ගණන් ද 13.07% කින් අපනයන වෙළඳපල මිල 9.39% ද වැඩි වී ඇති බවයි. ඒ අනුව මෙම කර්මාන්තය කෙරෙහි අවධානය යොමු කිරීමේදී හඳුනාගත හැකි වූයේ, මෙම කර්මාන්තය වර්ෂයකට 8.5% පමණ පිරිවැයේ වැඩිවීමේ ගැටලුවකට මුහුණ දෙමින් පවතින බවයි. ඒ අනුව 2000-2015 කාල සීමාව තුළ තේ කර්මාන්තයේ පිරිවැය ඉහළ යාමට බලපාන ලද හේතු අධ්‍යයනය කිරීම මෙහි අරමුණ වේ. ඒ සඳහා 2000-2015 දක්වා මහ බැංකු වාර්තා උපයෝගී කොට ගනිමින් ද්විතීයික දත්ත එක්රැස් කර ගත් අතර කාල ශ්‍රේණි විශ්ලේෂණය හා කේන්ද්‍රික ප්‍රවණතා මිනුම් යොදා ගෙන විශ්ලේෂණය කරනු ලැබීය. ඒ අනුව පිරිවැය වැඩි වීමට වැඩි වශයෙන්ම බලපා ඇත්තේ, වර්ෂයක් පාසා ශ්‍රමික වැටුප් අඛණ්ඩව ඉතා වේගයෙන් වැඩි වීමත්, පොහොර භාවිතය සීඝ්‍රයෙන් වැඩි වීම මේ සඳහා බලපා ඇති බවත් ය. ඒ අනුව විවිධ රජයන් විවිධ පියවර ගෙන ඇති අතර, ඒ අනුව කුඩා වතු හිමියන්ට ලබාදෙන පොහොර සහනාධාරය එයින් ප්‍රධාන තැනක් ගනී. නමුත් එය මෙම කර්මාන්තයේ ප්‍රගමනයට විශාල දායකත්වයක් ලබා නොදී ඇති අතර, ඒ සඳහා වඩාත් කාර්යක්ෂම යන්ත්‍ර සූත්‍ර හා උපකරණ ලබාදීම විවිධ පර්යේෂණ සිදු කොට හඳුන්වා දීම වැනි ක්‍රියාමාර්ග තුළින් මෙම කර්මාන්තයේ වර්ධනයට විශාල දායකත්වයක් ලබාගෙන ඇති බවත් ය.

**මුඛ්‍ය පද** : පිරිවැය, තේ කර්මාන්තය, ආර්ථික

[1] ආර්ථික විද්‍යා අධ්‍යයනය අංශය, කැලණිය විශ්වවිද්‍යාලය,
thilinishankani1993@gmail.com

# Socio-Economic Factors Affecting To Prevalence Diabetes

**M. W. A. S. M. Weerasinghe[1]**

## Abstract

Diabetes is a common life-long healthcare problem in worldwide. Diabetes can have a significant impact on quality of life and can reduce life expectancy. There are different types of diabetes. Type 1, type 2 and gestational diabetes are the main types of diabetes. Diabetes can be managed well but the potential complications are the same for diabetes type 1 and type 2 diabetes including heart attack, kidney disease, limb amputation, depr1ession, anxiety and blindness. Diabetic prevalence has risen faster in low and middle-income countries than in high-income country. The prevalence of diabetes increases worldwide owing to changes in lifestyle and ageing population. The main objective of this study is to determine the socio-economic factors affecting for diabetes among aged 20 year and above. For this study, primary data and secondary data were used. Outpatient's Medical report in hospital, WHO annual report and the diabetes association report were used to obtain secondary data. Primary data were collected using a structured questionnaire from 150 randomly selected diabetic patients from diabetic clinic in Sri Jayawardhanapura General Hospital. A Factor analysis was used to analyse data. Independent variables used in the analysis are age, gender, ethnicity, region, occupation, education level, family size, income, smoking, economic cost, family history and duration of diabetes. According to the results, the socio economic factors showed significant association between diabetes and the male gender, decreased literacy, long duration of diabetes, depression, family history of diabetes, economic cost, occupation, region and ethnicity mainly affecting for diabetes. Age is not an important risk factor affecting for diabetes.

**Keywords :** diabetes, risk factors, prevalence, type 2 diabetes.

[1] Department of Economis, University of Kelaniya,
mwasmgamindaweerasinghe@gmail.com

# දේශගුණ වෙනස්වීම්, ග්‍රාමීය අවකාශයට සිදු කරන බලපෑම් මොණරාගල දඹගල්ල ප්‍රදේශය ඇසුරින් සිදුකරන ලද අධ්‍යයනයක්.

**කේ . එම්. සී. ප්‍රියංගනී[1]**

**සංක්ෂේපය**

ගෝලීය දේශගුණය වෙනස්වීම හා ඒ ආශ්‍රිත ප්‍රතිවිපාකවලට මුහුණ දීම වර්තමානයේ ලෝක මට්ට්ටමේ ඇති ප්‍රධාන අභියෝගයකි. ගෝලීය උෂ්ණත්වය අසාමාන්‍ය ලෙස වර්ධනය වීම හා බැඳුණ විවිධ පාරිසරික හා මානව ගැටලුවලට පිළියම් යෙදිම සඳහා වර්තමානයේ ජාත්‍යන්තර හා ජාතික මට්ටමේ විවිධ ක්‍රියා මාර්ග අනුගමනය ඉහළ මට්ටමේ පවතී. භූගෝලීය වශයෙන් සලකන කළ ඉහළ අක්ෂාංශීය රටවල අයිස් දියවීම, ගංගා පිටාර ගැලීම, අධික වර්ෂාපතනය, මුහුදු මට්ටම ඉහළ යෑම, ප්‍රමුඛ ගැටලු වන අතර, ආසියානු හා අප්‍රිකානු රටවල වර්ෂාපතනය අඩු වීම, නියඟය, ජෛව විවිධත්වයට හානි සිදුවීම හා කෘෂිකර්මයට අහිතකර ලෙස බලපෑම ප්‍රධාන ගැටලු වේ. නිවර්තන කලාපීය රටක් වන ශ්‍රී ලංකාව ද ගෝලීය දේශගුණ වෙනස්වීම් පිළිබඳ අයහපත් බලපෑම්වලට මුහුණ දී ඇති රටකි. තවමත් කෘෂිකර්මය ප්‍රධාන ආර්ථික කටයුත්ත වන ශ්‍රී ලංකාවේ දේශගුණයේ ඉතා ප්‍රකට බලපෑම සිදුව ඇත්තේ, ජල සම්පත් කෙරෙහිය. විශේෂයෙන් 82% පමණ වන ගොවි ජනතාව ජීවත්වන ග්‍රාමීය ප්‍රදේශයන්හි ජල සම්පත් කෙරෙහි ඇති කරනු ලබන බලපෑම මෙරට ආර්ථික දේහයට පමණක් නොව සමාජ හා සංස්කෘතික විපරිණාමයට ද බලපා තිබෙන බව පෙනේ. මෙම තත්ත්වය යටතේ දේශගුණ වෙනස්කම් හේතු කොට ගෙන ග්‍රාමීය ජල මූලාශ්‍රයන්ට හානි සිදු වීමත් සමඟ ග්‍රාමීය ජන සමාජයේ සිදු වී ඇති වෙනස්කම් අධ්‍යයන කිරීම මෙම පර්යේෂණයේ අරමුණයි. මේ සඳහා මොණරාගල දිස්ත්‍රික්කයේ දඹගල්ල ප්‍රදේශය නියැදියක් වශයෙන් තෝරාගත් අතර වාර්ෂික වර්ෂාපතනය 750mm අඩුවීමත්, මධ්‍ය උෂ්ණත්වය 29$^{o}$C තරම් ඉහළ වීමත්, කුඩා වැව් සහ වැසි ජලය හැරුණු කොට මහා වාරිමාර්ග හෝ වෙනත් සම්පාදන ක්‍රම ක්‍රියාත්මක නොවීමත්, ජනතාවගෙන් 70% පමණ සාම්ප්‍රදායික ගොවීන් වීමත් යන සාධක මෙම ප්‍රදේශය තෝරා ගැනීමට හේතු විය.මෙම අධ්‍යයනයේදී, වර්ෂාපතනය, උෂ්ණත්වය, වාෂ්පීකරණය, වැනි කාලගුණ විද්‍යාත්මක පරාමිතීන් මොණරාගල මඳුරුකැටිය මධ්‍යස්ථානයෙන් ලබා ගත් අතර වැව්, ඇළ මාර්ග, භූගත ජලය, වැසිදිය ටැංකි වැනි ජලසම්පත් ක්ෂේත්‍ර සමීක්ෂණවලින් සහ ජනතාවගේ ආර්ථික, සමාජීය තොරතුරු ප්‍රශ්නාවලි මඟින් සහ ඔවුන් සමඟ කරන ලද සම්මුඛ සාකච්ඡා හා සිද්ධි අධ්‍යයන මඟින් ද රැස් කර ගන්නා ලදි. මෙම පර්යේෂණයට අනුව, සොයා ගනු ලැබූ වැදගත් තොරතුරු අතර ඉතා අවධානයට ලක් විය යුතු කරුණු වන්නේ, ජල හිඟය හේතුවෙන් සාම්ප්‍රදායික කෘෂිකර්මයේ නිරත වූ ජනතාවගෙන් 48% පමණ කෘෂිකාර්මික කටයුතුවලින් ඉවත්ව වෙළඳාම, ඉදිකිරීම් හා කුලී වැඩ කිරිම වැනි රැකියාවන්හි යෙදීමේ ප්‍රවණතාවක් දැක්වීමත් කෘෂිකාර්මික ඉඩම් පරිභෝජනයේ විශාල වෙනසක්, එනම් ඉඩම් වලින් 40% පමණ අත්හැර දැමීම හෝ වෙනත් කටයුතු සඳහා භාවිත කිරීමත් ය. මේ අනුව, ශ්‍රී ලංකාවේ පහළ ඌව කලාපයේ සාම්ප්‍රදායික ගොවි සමාජ පද්ධතිය බරපතල ලෙස විපරිණාමයට පත්වන බව පෙනී යයි.

**මුඛ්‍ය පද :** දේශගුණය, වෙනස්වීම, ග්‍රාමීය

[1] ආර්ථික විද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, priyangani190@gmail.com

# දේශීය කෘෂිකර්මාන්තය තුළ ගොවීන්ගේ ආදායම් මට්ටම

**එම්. ආර්. එස්. සෝමරත්න**[1]

## සංක්ෂේපය

දේශීය කෘෂිකර්මාන්තය තුළ ක්‍රියාකාරී සාමාජිකයන් වන්නේ, ගොවීන් ය. දේශීය කර්මාන්තය නඟා සිටුවීමෙහිලා මූලික දායකත්වය ලැබෙන්නේ, ගොවීන්ගෙනි. නමුත්, වර්තමාන දේශීය කෘෂිකර්මාන්තය තුළ ගොවීන්ට මෙම වගාවන් තුළින් ප්‍රමාණවත් ආදායමක් ලැබෙනවා ද යන්න ගැටලුවකි. මෙම පර්යේෂණයේ අරමුණ වන්නේ, දේශීය කෘෂිකර්මාන්තය නඟා සිටුවීමට කැප කිරීම් කරන ගොවියාට ප්‍රමාණවත් ආදායමක් ලැබෙනවා ද යන්න විමසා බැලීමයි. මේ සඳහා නුවරඑළිය දිස්ත්‍රික්කයේ ගොවීන් 50 දෙනෙකුගෙන් යුතු නියැදියක් තෝරා ගැනුණි. ප්‍රශ්නමාලා ක්‍රමය හා සම්මුඛ සාකච්ඡා ක්‍රමය මගින් අවශ්‍ය දත්ත ලබාගත් අතර සඟරා, මහ බැංකු වාර්තා ආදිය මගින් ද්විතික දත්ත ලබා ගැනීම සිදු විය. දත්ත විශ්ලේෂණය විස්තරාත්මක සංඛ්‍යානය මඟින් සිදු විය. එහිදී අනාවරණය වූයේ, අයහපත් කාලගුණික තත්ත්වය හේතුවෙන් භෝග මිල ගණන් වසර පුරා දැඩි ලෙස උච්ඡාවචනය වූ බවයි. වසර අවසාන කාලයේ වූ කාලගුණික විපර්යාස හේතුවෙන් භෝග විනාශ වූ අතර එමඟින් වෙළඳපොළ සැපයුම අඩු වී බොහොමයක් භෝග ගණන්වල මිල ගණන් ඉහළ මට්ටමක පැවති බවත් නමුත් එමඟින් ගොවීන්ගේ ආදායමෙහි විශාල ප්‍රගතියක් සිදු නොවූ බව ද අනාවරණය විය. යල කන්නයේ භෝග සැපයුම විශාල වශයෙන් වැඩි වීම නිසා අතිරික්ත භෝග තොග ගණනින් වෙළඳපොළට මුදා හැරීම හේතු කොටගෙන මිල ගණන් විශාල වශයෙන් පහළ වැටුණ බව ද අනාවරණය විය. මේ නිසා වසර පුරාවටම ගොවියා බලාපොරොත්තු වන ආදායම නොලැබෙන බව නිගමනය වේ. මේ නිසා රජය අදාළ වගකිවයුත්තන්ගේ මූලිකත්වයෙන් වැවිලිකරුවන් දිරිගැන්වීම සඳහා ඔවුන්ට අවශ්‍ය තොරතුරු හා උපදෙස් ලබාදීම, සහනදායි මිල ගණන් යටතේ පොහොර හා බීජ ලබා දීම හා ඔවුන්ගේ ගැටලු විසඳීම සඳහා සුභවාදී ව මැදිහත් වීම කළයුතු වේ.

**මුඛ්‍ය පද** ඃ දේශීය කෘෂිකර්මාන්තය, ගොවීන්, ආදායම

[1] ආර්ථික විද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, ruvinisomarathna@gmail.com

# The impact of Information and Communication Technologies in Enhancing Customer Relationships in Licensed Commercial banks in Sri Lanka

**K. M. Sudasinghe**[1]

## Abstract

Substantial changes in the business environment globally have forced banking sector to modify their service strategies. One of the major goals of banks is now to leverage advances in Information and Communication Technologies (ICT) to construct and maintain long-lasting relationships with customers through the adoption of new channels that facilitate electronic banking. Information and Communication Technologies (ICT) are ideal medium for carrying out banking activities with customers due to the cost savings offered and speed of information transmission. While the global banking sector is one of the most up to date industries with regard to the use of the Internet and mobile Technologies, developing countries (such as Sri Lanka) have not broadly adopted these technologies. The main objective of this study is to investigate (from the customer's perspective) the factors that determine whether the Sri Lankan Banking sector (Licenced Commercial Banks) can effectively utilise self-service technologies to create relationships. Specially, it investigates the importance of online relationships with customers. This thesis also investigates the relationship(s) in online banking between the constructs of perceived ease of use, perceived usefulness, service quality, customer loyalty, customer satisfaction, customer trust and technology attitude. The Technology Acceptance Model is extended to describe the impact of ICT in creating customer relationships in banking. As the Methodology, the sample will be selected as for the case study method while identifying each bank include to Licensed Commercial Banks as a case. Data will be collected through both surveys and interviews as the instrument of primary data collection and will use statistical graphical representations, Descriptive statistics, Correlations, regressions and Chi-square tests to analyse data. There are numerous factors that need to be overcome for the Sri Lankan banking sector to achieve global competitiveness in the use of self-service ICTs.

**Keywords :** Information and Communication Technologies (ICT), Customer Relationships, Online Banking, Licensed Commercial Banks

[1] Department of Economics, University of Kelaniya, kushani.madushani@gmail.com

# ශ්‍රී ලංකාවේ පාසල් වල අ.පො.ස. (සා.පෙළ) ගණිතය විෂය සාධනයට බලපාන සාධක පිළිබඳව විමර්ශනාත්මක අධ්‍යනයක්.
## ( පුත්තලම දිස්ත්‍රික්කයේ ආණමඩුව අධ්‍යාපන කොට්ඨාසය ඇසුරින් )

**ආර්. එච්. එම්. අයි. එම්. රාජකරුණා[1]**

**සංක්ෂේපය**

ශ්‍රී ලංකාවේ අධ්‍යාපන ක්‍රමයට අනුව, අ.පො.ස. (සා.පෙළ) ගණිතය විෂය සමත් වීම අනිවාර්යය සාධකයකි. මෙම අධ්‍යයනයට අදාළ අරමුණු වන්නේ, අ.පො.ස. (සා.පෙළ) මට්ටමේ සිසුන්ගේ ගණිතය විෂය සාධනය සඳහා බලපාන සාධක හඳුනා ගැනීමයි. මෙහිදී ආණමඩුව අධ්‍යාපන කොට්ඨාසයේ ගණිතය විෂය උගන්වන ගුරුවරුන්ගෙන් අහඹු ලෙස තෝරාගත් ගුරුවරුන් 25ක් සහ සිසුන් 100කගෙන් යුත් නියැදියක් ආශ්‍රයෙන් දත්ත ලබා ගන්නා ලදි. දත්ත රැස් කිරීමේ දී ප්‍රශ්නාවලි ක්‍රමය සහ සම්මුඛ සාකච්ඡා ක්‍රමය භාවිතා කරන ලදි. එමගින් ලබාගත් දත්ත අරමුණු විශ්ලේෂණයේදී, භාවිත කරන ලදී. සංඛ්‍යාත්මක දත්ත විශ්ලේෂණය සඳහා විස්තරාත්මක විශ්ලේෂණ ශිල්පීය ක්‍රම භාවිත කරන ලදි. විශ්ලේෂණය කරන ලද තොරතුරු වලට අනුව, ආණමඩුව අධ්‍යාපන කොට්ඨාසයේ ගණිතය විෂය සාධනය දුර්වල මට්ටමක පවතින බවත් සිසුන්ගේ මූලික ගණිත දැනුම මධ්‍යස්ථ මට්ටමක පවතින බවත් අනාවරණය විය. ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය තුළ ගුරු සිසු සංජානන හඳුනා ගැනීමේදී විවිධ ඉගැන්වීම් ක්‍රම පිළිබඳ ගුරුවරුන්ගේ කැමැත්ත, අධ්‍යාපන අමාත්‍යංශය මඟින් ලබා දී ඇති ඉගැන්වීම් ක්‍රියාවලිය පිළිබඳව ගුරුවරුන් තුළ යහපත් ආකල්පයක් නොමැති වීම, ගණිත විෂයට සිසුන් දක්වන අකමැත්ත, දුර්වල සිසුන් වෙත ගුරුවරුන් සමහර අවස්ථාවල වැඩි අවධානයක් නොදැක්වීම, මූලික ගණිත සංකල්ප ඉගැන්වීම පිළිබඳ ඇති අඩුපාඩු නිසා ගණිත සාධන මට්ටම පහළ ප්‍රතිශතයක පවතින බව අනාවරණය විය. මෙය මඟ හරවා ගැනීමට ප්‍රාථමික ශ්‍රේණිවල සිටම ගණිතයේ මූලික සංකල්ප නිවැරදිව ඉගැන්වීම, සිසුන් තුළ ගණිතය කෙරෙහි යහපත් ආකල්පයක් ඇතිකරවීම වැනි යෝජනා ඉදිරිපත් කළ හැකිය.

**මුඛ්‍ය පද :** අ.පො.ස. (සා.පෙළ), ගණිතය, සාධනය, සිසුන්

[1] ආර්ථික විද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය,
isharamadhushani500@gmail.com

# ශ්‍රී ලංකාවේ අධ්‍යාපනය හා පුස්තකාල ඉතිහාසය

**කේ. ඒ. එස්. ආර්. කුලසිංහ**[1]

**සංක්ෂේපය**

ඕනෑම රටක ඉදිරි අනාගත සංවර්ධනයේ පිළිබිඹුව ලෙස අධ්‍යාපනය දැක්විය හැක. රටක ආර්ථික, දේශපාලනික, සමාජීය, සංස්කෘතික යන කුමන අංශයක් යටතේ වුව ද ඉදිරි යහපැවැත්ම උදෙසා අධ්‍යාපනයෙහි දායකත්වය ප්‍රමුඛ ලෙස සැලකිය හැකිය. මෙලෙස රටක සෑම අංශයකටම දායකත්වය සපයන අධ්‍යාපන ක්ෂේත්‍රයේ ආරම්භය පිළිබඳවත්, ඊට දායකත්වය සපයන පුස්තකාල ක්ෂේත්‍රයේ ඉතිහාසය පිළිබඳවත් අධ්‍යයනය කිරීම වැදගත් වේ. මෙම අධ්‍යයනයේ අරමුණු ලෙස ශ්‍රී ලංකාවේ අධ්‍යාපන ඉතිහාසය පිළිබඳවත් ලෝකයේ සහ ශ්‍රී ලංකාවේ පුස්තකාල ආරම්භය පිළිබඳවත් අධ්‍යයනය කිරීම යොදා ගෙන ඇත. මෙම අධ්‍යයනය ද්වීතික දත්ත ආශ්‍රයෙන් සිදු කොට ඇති අතර ද්වීතික දත්ත මූලාශ්‍ර ලෙස පොත් පත් හා සඟරා යොදා ගන්නා ලදී. එහිදී අධ්‍යාපනය හා එහි පදනම, අපේ අධ්‍යාපනය එදා අද සහ හෙට, පුස්තකාල කළමනාකරණය, පුස්තකාල ඉතිහාසය යන ග්‍රන්ථ ආශ්‍රය කර ගන්නා ලදී. එමෙන්ම දත්ත විශ්ලේෂණ කිරීම සඳහා විස්තරාත්මක ක්‍රමවේදය යොදා ගෙන ඇත. ඒ අනුව අධ්‍යාපන ක්ෂේත්‍රය හා සම්බන්ධ පුස්තකාල සේවය අතීතයේදී නොදියුණු තත්වයක සිට ආරම්භ වී ඇති බවත් ඒ සඳහා විවිධ කාලවකවානුවල පැවති සමාජීය තත්වය මෙන්ම විවිධ අනුග්‍රහයන්ගේ බලපෑම හේතු වී ඇති බවත් සොයා ගන්නා ලදී. එමෙන්ම වර්තමානය වන විට ඉතා ක්‍රමවත් සහ සංවිධානාත්මකව ක්‍රියාත්මක වන පද්ධතියක් ලෙස පුස්තකාල සේවාව දැක්විය හැකිය. මේ අනුව නිගමනය කළ හැක්කේ අධ්‍යාපන පද්ධතිය තුළ ලේඛන කලාවේ දී වැදගත් අංශයක් ලෙස සැලකෙන පුස්තකාල සේවාව දීර්ඝ ඉතිහාසයකට හිමිකම් කියන බවයි. ශ්‍රී ලංකාවේ අධ්‍යාපන පද්ධතිය තුළ පුස්තකාල භාවිතය ඈත අතීතයේ සිටම විවිධාකාරයෙන් ක්‍රියාත්මකව පැවති අතර අධ්‍යාපන ක්‍රමය ආරම්භයේ දී නොදියුණු ක්‍රමශිල්ප අනුගමය කළ ද වර්තමානය වන විට තාක්ෂණික ක්‍රමෝපායන් පුස්තකාල භාවිතයේ දී යොදා ගෙන ඇති බවයි.

**මුඛ්‍ය පද** : අධ්‍යාපනය, පුස්තකාල, ඉතිහාසය, තාක්ෂණික ක්‍රමෝපායන්

[1] ආර්ථිකවිද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, sithara.kulasinghe@yahoo.com

# Trends of Risk Management in Banking Sector in Sri Lanka

**K. D. A. K. Fernando[1]**

## Abstract

Risk management can be identified as complex multidimensional problematic situation, which arises in banking sector. Among various types of risks faced by banking sector credit risk, market risk and liquidity risk rank higher. The effective management of credit risk, market risk and liquidity risk are critical components of a comprehensive approach to risk management and essential to the long-term success of any banking industry. Based on the significance of studying risk management, major objective is to identify the recent trends in risk management practices in banking sector of Sri Lanka. Secondary data were gathered based on Annual Reports and News Survey Reports of Central Bank, Sri Lanka. Findings disclosed that, under the credit risk, even though the gross Non-performing Loans (NPLs) ratio declined to 3.2 per cent at the end of 2015 from 4.2 per cent in 2014, total loan loss provisions were increased by Rs.11.3 billion. Under the market risk, equity risk of the banking sector remained at low levels during the year 2015 while the foreign currency borrowings were 61.3 per cent of total borrowings at end 2015 and the banking sector reported a positive foreign currency exposure of Rs. 9 billion. Under the liquidity risk, the Statutory Liquid Assets Ratios (SLARs) of the Domestic Banking Units (DBUs) and Offshore Banking Units (OBUs) were maintained well above the minimum statutory level at 33.8 per cent and 41.1 per cent respectively in 2015. When comparing the profit and the capital adequacy in 2015, although profit margins increased Capital Adequacy Ratio (CAR) is higher than the minimal regulatory requirement. Since, risks are the main determinants of banking failures, banks should have a keen awareness of the need to identify the measures recommended by Basel II, and III and they should maintain adequate capital in order to mitigate these risks.

**Keywords :** Risk Management, Credit Risk, Market Risk, Liquidity Risk, Banking Sector, Sri Lanka

[1] Department of Economics, University of Kelaniya, akithmini41@gmail.com

# ශ්‍රී ලංකාවේ දරිද්‍රතාවය සහ ළමා පෝෂණ ඌනතාවය

**එන්. කේ. අයි. ටී. නමුණුකුල**[1]

**සංක්ෂේපය**

ශ්‍රී ලංකාව සංවර්ධනය වෙමින් පවතින රටකි. මෙහි මූලික ආර්ථික රටාව අනාදිමත් කාලයක සිට කෘෂිකර්මය බව ජාතික ආදායම් ප්‍රතිශතාත්මක අගය පිරික්සීමේදී තවමත් සාක්ෂි දරයි. පවුලක ආදායම, එම පවුල ඒකකය තුළ පෝෂණය කෙරෙහි බලපෑමක් තිබෙනවා ද යන්න සහ ළමා පෝෂණය ඊට බලපෑමක් කරන්නේ ද යන්න විමසුම කාලෝචිත මාතෘකාවකි. ළමා පරපුර මන්දපෝෂණය හේතුකොටගෙන විවිධ වූ ලෙඩ රෝගවලට ගොදුරු වෙමින් පවතී. මෙහි තීව්‍රතාව ශ්‍රී ලංකාවේ දිස්ත්‍රික්ක අනුව ද දැකිය හැකිය. මොණරාගල, කිලිනොච්චිය, අනුරාධපුරය, පොළොන්නරුව පමණක් නොව මාතලේ, මහනුවර, නුවරඑළිය යන මධ්‍යම පලාතට අයත් දිස්ත්‍රික්කවල ද දැකගත හැකිය. රටක දරුවන්ගේ පෝෂණය මැනෙන දර්ශක ලෙස උපත් බර, වයසට නිසි බර, උසට සරිලන බර (බී.එම්.අයි දර්ශකය) රුධිරයේ ඇති යකඩ ප්‍රතිශතය වැනි කරුණු විමසීමෙන් තීරණය කළ හැකිය. ශ්‍රී ලංකාවේ වර්තමාන දූෂ්පෝෂණ දර්ශකය 20% සිට 40% අතර පවතී. ශ්‍රී ලංකාවේ දරිද්‍රතාවය, ළමා පෝෂණ ඌනතාවය කෙරෙහි බලපාන්නේ ද යන්න විමසීම මෙම අධ්‍යයනයේ මූලික අරමුණකි. මව් කුසක සිටින දරුවාගේ සිට දරුවන්ට ලබාදෙන ආහාර පිළිබඳව සැලකිලිමත් විය යුතුය. මව ගන්නා අහාර, කුඩා දරුවන්ට ලබාදෙන ආහාර ප්‍රමාණාත්මක ද ගුණාත්මක ද එය නිසි කලට ලබාදෙනවා ද යන්න පිළිබඳවත් අවධානය යොමුකළ යුතු ය. මේ පිළිබඳව විමසීමේදී, වතුකරයේ ජනතාවට ඉහත කරුණු සමඟ කටයුතු කළ හැකි ද යන්න ගැටලුවකි. ඔවුනගේ රැකියාව, ආදායම දරුවාගේ පෝෂණ ඌනතා ඇති වීමට ඍජු සබඳතාවක් දක්වන බව නොඅනුමානය. මෙම අධ්‍යයනය සඳහා පුවත්පත්, සෞඛ්‍ය අමාත්‍යංශ වාර්තා, මහ බැංකු වාර්තා වැනි ද්විතීක දත්ත පරිශීලනය කෙරුණි. දරිද්‍රතාවය ස්වායත්ත විචල්‍ය ලෙස ගෙන ළමා පෝෂණය පරායත්ත විචල්‍ය ලෙස ගනිමින් සහසම්බන්ධතාව ගණනය කළ අතර එමඟින් දරිද්‍රතාවය හා ළමා පෝෂණය අතර ඍණ සහසම්බන්ධතාවක් පවතීය යන කල්පිතය පිළිගැනීමට හැකි විය. ඒ අනුව දරිද්‍රතාවය වැඩිවන විට ළමා පෝෂණය අඩුවන බව ගම්‍ය විය.

**මුඛ්‍ය පද :** දරිද්‍රතාවය, ළමා පෝෂණය, ශ්‍රී ලංකාව

[1] ආර්ථික විද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, dinuthathsarani05@gmail.com

# Socio Economic Factors Impact on Cancer in Sri Lanka

**K. B. R. Senavirathne**[1]

## Abstract

Cancer is a leading cause of the death worldwide. Cancer is the uncontrolled growth of cells, which can invade and spread to distant sites of the body. Cancer can have several health consequences. Each year, 10 millions of people are diagnosed with cancer around the world, and more than half of the patients eventually die from it. Even in Sri Lanka the cancer incidence have increased from 2000. There had been reported 6800 cancer deaths of males and 7200 deaths of females in 2014. Randomly selected 100 indoor patients, who are getting treatment from National Cancer Hospital in Maharagama, interviewed under semi structured interview method to gather primary data. Annual cancer registration records held by National Cancer Institute in Maharagama were used to obtain secondary data for this sub study. Factor analysis and Chi square test were the main data analysing methods. Socioeconomic factors such as social background, occupation, income and habitual works and environmental factors are affect for cancer incidence in more and it effect on economically as well. Adult risk factors caused for cancer incidence in 2010, 2011, 2012, were respectively physical inactivity, current tobacco smoking, and household solid fuel usage. In 2014, the most common risk factor for cancer incidence was the obesity in Sri Lanka. However, there is no many studies about 'socio economic factors affected on cancer in Sri Lanka'. Therefore, further studies are needed to confirm these findings in other health and social welfare strategies in Sri Lanka.

**Keywords :** Cancer, Socio economic factors, death

[1] Department of Economics, University of Kelaniya, anjalisenavirathne@gmail.com

# අයවැය හිඟය පියවීම සඳහා බදු හා බදු නොවන ආදායම්වල දායකත්වය

**එස්. ඒ. ඩී. යාමිණී**[1]

## සංක්ෂේපය

සංවර්ධනය වෙමින් පවතින රටවල පවතින ප්‍රධාන ගැටලුවක් ලෙස අයවැය හිඟය පෙන්වා දිය හැකි අතර ඉහළ වියදම් මට්ටම් සමග පහළ ආදායම් මට්ටම් ජනිත වීම තුළින් ආදායම් හිඟය පැන නගී. මෙම අයවැය හිඟය පියවීම සඳහා අවශ්‍ය ආදායම එම රජය විසින් බදු හා බදු නොවන ආදායම් ක්‍රම ඔස්සේ උපයා ගනී. මෙම අධ්‍යයනය ඔස්සේ සිදුකරනු ලබන්නේ, බදු හා බදු නොවන ආදායම් අයවැය හිඟය පියවීම සඳහා කොපමණ දායකත්වයක් ලබාදේ ද යන්න විමසා බැලීමයි. මෙහිදී අයවැය හිඟය පියවීමට බදු හා බදු නොවන ආදායම් කොපමණ දායකත්වයක් ලබාදේ ද යන්න විමසා බැලීම අරමුණු කොටගත් අතර එමගින් අයවැය හිඟය පියවා ගැනීමට වාර්ෂිකව සමත් වී ඇති ප්‍රමාණයන් විමසා බැලීමට ලක් කෙරුණි. එහිදී වසර 10ක බදු හා බදු නොවන ආදායම් දත්ත ශ්‍රී ලංකා මහ බැංකු වාර්තාවන් පරිශීලනය කරමින් ද්විතීක දත්ත ලෙස යොදා ගන්නා ලදී. මෙලෙස ලබාගත් දත්ත සහසම්බන්ධතාවය, ප්‍රස්ථාර ආදිය ඔස්සේ තවදුරටත් විශ්ලේෂණය කරනු ලැබූ අතර එහිදී අයවැය හිඟය සහ බදු හා බදු නොවන ආදායම් ප්‍රතිලෝම සම්බන්ධතාවයක් හඳුනා ගත හැකි විය. ඒ අනුව බදු ආදායම එක් ඒකකයකින් වැඩි හෝ අඩු වන විට අයවැය හිඟය 0.0039කින් පමණ විචලනය වන බව හඳුනාගත හැකි විය. මෙයින් නිගමනය වනුයේ අයවැය හිඟය හා බදු හා බදු නොවන ආදායම් අතර දැඩි ප්‍රතිලෝම සම්බන්ධතාවයක් පවත්නා බවත් බදු හා බදු නොවන ආදායම් අයවැය හිඟය සඳහා සැලකිය යුතු බලපෑමක් සිදුකරන බවත් ය.

**මුඛ්‍ය පද :** අයවැය හිඟය, බදු හා බදු නොවන ආදායම්

[1] ආර්ථික විද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, dilekayamini94@gmail.com

# Trends and Determinants of Ageing Population in Global and Sri Lanka

**K. D. Helani Gunasekara**[1]

## Abstract

Every country is experiencing growth in the number and the proportion of older people with respect to their population growth. Ageing population can be defined as the increasing share of older persons (60 years of age considered as the cut off for older people) in the population. However it is becoming one of the most significant socio-economic phenomenon of the twenty-first century and it affects for all the spares in a country as labour markets, goods markets, public expenditure, government budget, capital accumulation and many more. Preparing for the economic and social structures to associate with an ageing population is essential to ensure progress in development. Success of the policy recommendations to ageing population depend on accurate and timely identification of trends of it. Therefore main objectives of the study are to identify the trends of ageing population globally, identify the trends of ageing population in Sri Lanka and identify the determinants of ageing population. This study is mainly based on secondary data collected by using Annual Reports of Central Bank of Sri Lanka, Labour Survey (2014) carried out by the Department of Census and Statistics, Sri Lanka and the United Nations' report-2015 based on population. Accordingly data were analyzed by performing descriptive statistical analysis. Growth of the older people has increases 607.1 million in 2000 to 900.9 million in 2015. It is projected to grow 56% by 2050. Globally and Sri Lankan female ageing population is greater than the male ageing population. Growing ageing population is faster in urban areas (68%-2015) than the rural areas (25%-2015) in globally. Globally and in Sri Lanka, ageing population growth is overlapping or increasing in greater proportions to total population. Upper middle income countries have higher ageing population density. Falling of fertility rates, mortality rates and the high life expectancy are the main determinants of the ageing population. However appropriate policy options are required to address the issues related to the ageing population locally as well as internationally.

**Keywords** : Ageing Population, Sri Lanka, Global, Growth, policy options.

[1] Department of Economics, University of Kelaniya, kdhug1234@gmail.com

# පුස්තකාලය භාවිතයේදී විශ්වවිද්‍යාල සිසුන් මුහුණපාන ගැටලු පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්
## (කැලණිය විශ්වවිද්‍යාලය ඇසුරිනි)

**එච්. එම්. යූ. පී. හේරත්**[1]

## සංක්ෂේපය

විශ්වවිද්‍යාලයේ හදවත ලෙස සැලකෙන පුස්තකාලය සඳහා විශ්වවිද්‍යාල පරමාර්ථ ඉටුකරගැනීම සඳහා සිදු කළ හැකි කාර්ය සමුදායක් වේ. උසස් ශ්‍රම හා බුද්ධි බලකායක් නිර්මාණය කිරීමට අවශ්‍ය වන දැනුමක් එක්රැස් කිරීම ද, සංවිධානය කිරීමද, තැම්පත් කර ආරක්‍ෂා කරගැනීමද, අවශ්‍ය අවස්ථාවන්හිදී එම දැනුම ප්‍රයෝජනයට ගැනීමට පහසුකම් සැලසීම ද විශ්වවිද්‍යාල පුස්තකාලයේ ඉටුවිය යුතු වැදගත් කාර්යන් වේ. ඒ අනුව, කාර්යක්‍ෂම හා ඵලදායි පුස්තකාල සේවාවක් සැපයීම සඳහා පාඨකයින් පුස්තකාල භාවිතයේදී මුහුණපාන ගැටලු හඳුනාගත යුතු ය. එසේ හඳුනා ගැනීමෙන් පුස්තකාල සේවා වැඩිදියුණු කිරීමටත් පවත්නා දුර්වලතා මඟහරවා ගැනීමටත් විකල්ප සේවාවන් හඳුන්වා දීමටත් හැකියාව ලැබෙනු ඇත. මෙම අධ්‍යයනය කැලණිය විශ්වවිද්‍යාලය මූලික කරගනිමින් කරන ලදී. පුස්තකාලය විසින් පවත්වාගෙන යනු ලබන සේවා හඳුනාගැනීම සහ ඇගයීම, ශිෂ්‍යයන් අධ්‍යයන පුස්තකාලය භාවිතයේදී මුහුණපාන ගැටලු හඳුනාගැනීම සහ පුස්තකාල වැඩිදියුණු කිරීම සඳහා ගතහැකි ක්‍රියාමාර්ග හඳුනාගැනීම අධ්‍යයනයේ අරමුණ විය. දත්ත එක්රැස් කරගැනීම සඳහා ප්‍රශ්නාවලි, සම්මුඛ සාකච්ඡා, පුස්තකාලය නිරීක්ෂණය කිරීම ආදිය භාවිත කළ අතර නියැදිය සඳහා දෙවන වසර සිසුන් සියලුම පීඨ නියෝජනය වන පරිදි අහඹු ලෙස 100 ගෙන් යුතු නියැදියක් තෝරාගන්නා ලදී. මෙමගින් පාඨක අධ්‍යාපන, පුස්තතකාල එකතුව වර්ධනය කිරීම, පුස්තකාල ප්‍රකාශන හා නව තොරතුරු තාක්‍ෂණය භාවිතයට ගැනීම, ඡායා පිටපත් සේවය වැනි පුස්තකාල සඳහා ලබා දෙන යටිතල පහසුකම් වැඩිදියුණු කළයුතු බවට තව තවදුරටත් අධ්‍යයනය මඟින් අවධාරණය විය. පුස්තකාල භාවිතයේදී, ශිෂ්‍යයින් මුහුණපාන ගැටලු සැලකිල්ලට ගැනීමේදී සම්පත් හිඟකම, සම්පත් පිළිබඳ ප්‍රමාණවත් දැනුමක් ඇති පුස්තකාල නිලධාරින් හිඟකම, සම්පත් පිළිබඳ සිසුන් තුළ අවබෝධයක් නොමැතිකම පෙන්වා දී ඇත. පුහුණු ශ්‍රමිකයින් ප්‍රමාණවත් නොවීම, පුස්තකාල සම්පත් ලබාගැනීමේ අපහසුව හා කාර්යමණ්ඩලයේ තාක්‍ෂණික දැනුම අඩුකම පුස්තකාල නිලධාරින් හමුවේ ඇති ගැටලුවේ. පවත්නා මූලාශ්‍ර මඟින් තොරතුරු ලබාගැනීම හා ශිෂ්‍යයින්ගේ අධ්‍යාපන වැඩසටහන් වලට නවීන සේවා හඳුන්වා දෙමින් පාඨක අධ්‍යාපන වැඩසටහන් පැවැත්වීම, පුහුණු වැඩසටහන්, සූචි සම්පාදනය, අන්තර් පුස්තකාල පිරුළු සේවා මෙන්ම පුස්තකාල සහයෝගීතාවය මත සම්පත් හුවමාරු කරගැනීම ආදිය අධ්‍යයනය මගින් යෝජිත සේවා කිහිපයකි.

**මුඛ්‍ය පද :** අධ්‍යයන පුස්තකාල, විශ්වවිද්‍යාල සිසුන්, පුස්තකාල සේවා

[1] ආර්ථික විද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය,
udithapriyankara9525@gmail.com

# Money Laundering and its Economic Concerns

**P. A. Thilini Padmasika**[1]

## Abstract

Money laundering is usually regarded as the process by which 'illegal' or 'black' or 'dirty' money is transformed in to legally and socially acceptable forms of assets. However, several factors have emerged within the last two or three decades, that have made it a far more serious problem that on developing countries as Sri Lanka. Thus, the main objectives of this research are to evaluate, the impact of money laundering on economic development and financial stability of Sri Lanka and to identify the factors affecting for money laundering. This study entirely based on secondary sources of information collected based on Annual Reports and News Survey Reports of Central Bank, Sri Lanka. The findings of the analysis that, there are so many factors have affected to rises the problem of money laundering. Among the most important of these factors are rapid economic globalization, relaxation of capital controls, emergence of new economies, sale of state owned enterprises and development of new financial instruments and technology etc.The main economic concerns discovered through in this research are breakdown of the market mechanism, the magnitude of the funds involved, flows of funds are not based on returns to investment, flows of funds to countries are not based on economic fundamentals, demand of money would not reflect basic levels of economic activity, distortion in taxes, income distribution effect, economic instability and assets price bubble. However there should be a systematic mechanism to overcome the issues related to the money laundering in Sri Lanka. Therefore it would be necessary to adopt a cautious approach in the implementation of money laundering legislation so as to ensure the quality of money in Sri Lanka.

**Keywords :** Money laundering, Economic Concerns, Sri Lanka, legislation, Money.

[1] Department of Economics, University of Kelaniya, thilinipatp@gmail.com

# සේවා නියුක්ත හා සේවා වියුක්ත විශ්වවිද්‍යාල විද්‍යාර්ථයින්ගේ අධ්‍යාපන සාර්ථකත්වය (කැලණිය විශ්වවිද්‍යාලය ඇසුරින්)

ඩී. එම්. එච්. දසනායක[1]

**සංක්ෂේපය**

රජය විසින් අධ්‍යාපනය සඳහා විශාල මුදලක් වෙන් කරනු ලබන අතර විශ්වවිද්‍යාල අධ්‍යාපනය සඳහා ද සැලකිය යුතු මුදල් ප්‍රමාණයක් වෙන් කරනු ලබයි. විශ්වවිද්‍යාල අධ්‍යාපනය ලබන විද්‍යාර්ථයින්ගේ අධ්‍යාපන කටයුතු සාර්ථකව සිදුකර ගැනීම සඳහා රජය විසින් මහපොළ, ශිෂ්‍යාධාර වැනි මුදල් ප්‍රතිපාදන වෙන් කරනු ලබයි. එවැනි මුදල් ප්‍රතිපාදන විද්‍යාර්ථයින් සඳහා වෙන් කළද ඔවුන්ගේ වියදම් අංශය ක්‍රමයෙන් ඉහළ යයි. ඒ අනුව විද්‍යාර්ථයින් තම අධ්‍යයන අවශ්‍යතා වෙනුවෙන් මුදල් උපයා ගැනීම සඳහා විවිධ රැකියාවන්හි නියුක්ත වනු ලැබේ. මෙසේ රැකියාවන්හි නියුක්ත වීම තුළින් අධ්‍යයන සාර්ථකත්වය සඳහා කෙබඳු බලපෑමක් ඇති කරන්නේද යන්න විමසා බැලීම මෙම අධ්‍යයනයේ අරමුණ වී ඇත. මෙම පර්යේෂණය සඳහා සංගහනය ලෙස කැලණිය විශ්වවිද්‍යාලය තුළ ලියාපදිංචි වී සිටින සියලු විද්‍යාර්ථයින් තෝරා ගත් අතර නියැදිය වශයෙන් ස්තෘත සසම්භාවී නියැදුම් ක්‍රමය භාවිත කරමින් 100 දෙනෙකුගෙන් යුත් නියැදියක් තෝරා ගන්නා ලදී. මෙම අධ්‍යයනය සඳහා ප්‍රාථමික දත්ත යොදා ගත් අතර ප්‍රශ්නාවලි ක්‍රමය භාවිත කරමින් අදාළ දත්ත රැස් කර ගන්නා ලදී. දත්ත විශ්ලේෂණය සඳහා ප්‍රමාණාත්මක දත්ත විශ්ලේෂණ ක්‍රම යොදා ගන්නා ලදී. මෙහිදී සිසුන්ගේ අධ්‍යයන සාර්ථකත්වය මිනිය හැකි සුදුසුතම මිනුම ශ්‍රේණි ලකුණු සාමාන්‍ය (GAP) වන බැවින් ඒ පිළිබඳව මෙම අධ්‍යයනයේදී අවධානය යොමු කරන ලදී. සිසුන්ගෙන් 29% සතියකට පැය 30-39 අතර ප්‍රමාණයක් වැඩ කරන අතර 39% පූර්ණ කාලීන රැකියාවන්හි නිරත වන බවත් මේ නිසා ඔවුන්ගේ අධ්‍යාපනික වෘද්ධිය කෙරෙහි ප්‍රබල ලෙස බලපාන බවත් ප්‍රකාශ විය. සතියකට පැය 1-15 අතර කාලයක් අධ්‍යයන කටයුතුවල නියුතු වන අතර ඔවුන්ගේ GPA අගය තරමක් ඉහළ අගයක් ගන්නා අතර සේවය නොකරන සහ පූර්ණ කාලීනව සේවයේ නියුතු අයගේ GPA අගයට වඩා ඉහළ අගයක් වේ. මේ අනුව මෙම අධ්‍යයනය මඟින් හෙළි වූයේ සතියකට වැඩි පැය ගණනක් අධ්‍යාපන කටයුතුවල නිරත වන සිසුන්ගේ ශ්‍රේණි ලකුණු සාමාන්‍ය ඉහළ අගයක් ගන්නා බවයි.

**මුඛ්‍ය පද :** විද්‍යාර්ථයින්, අධ්‍යයන සාර්ථකත්වය, ශ්‍රේණි ලකුණු සාමාන්‍ය, සේවා නියුක්තිය

[1] ආර්ථිකවිද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය,
harshanidasanayake1991@gmail.com

# Potential Implementations to increase the number of Female Parliamentarians in Sri Lanka

**K. D. H. U. Gunasekara[1]** **G. A. Rajapaksha[2]**

## Abstract

Parliament is a centre for any form of democracy and citizens of a country select their representatives to parliament by their rates in the general election with the intention to represent them in law making process. Sri Lanka, a country that respect women's rights and has a majority of females in the total population, should have considerable amount of female parliamentarians to raise their voice when talking decisions relating to women and in all other spheres. Even though Sri Lanka produced the world's first female prime minister there is no systematic mechanism to encourage women to involve in politics and also numerous other obstacles can be perceived when females actively participate in politics. When Comparing with South Asian countries, Sri Lanka holds the minimum number of female parliamentarians and still there is no proper agenda to increase the number. The 20th amendment for the constitution 1978 of Sri Lanka also fails to make provisions to solve the issue. Therefore, in this paper research objectives are to identify how females can maximize their impact on the political process through parliament and to identify methods that are most effective in increasing the number of female parliamentarians. Descriptive statistical analysis was performed based on the collected primary data. Increasing the nomination quota in order to maximize the number of female parliamentarians, reserving more electorate seats for female parliamentarians, increasing the number of female representatives of the national list and the district proportional list are the methods, which seem viable for practice to increase the number of female parliamentarians.

**Keywords :** Female parliamentarians, women, Parliament, Politics, Sri

[1] Department of Economics, University of Kelaniya, kdhug1234@gmail.com

[2] Faculty of Law, General Sir John Kotelawala Defence University, rajapakshagaya@yahoo.com

# ශ්‍රී ලංකා යටිතල පහසුකම් සංවර්ධනය සඳහා හම්බන්තොට වරාය ව්‍යාපෘතිය

**එස්. එම්. ප්‍රේමරත්න**[1]

**සංක්ෂේපය**

හම්බන්තොට දිස්ත්‍රික්කයේ තිස්සමහාරාම මැතිවරණ කොට්ඨාශයේ පැරණි කරගංලේවාය තිබූ ස්ථානයේ මාගම්පුර මහින්ද රාජපක්ෂ ජාත්‍යන්තර වරාය ඉදිකර තිබේ. මහජන චීන සමූහාණ්ඩුව සහ ශ්‍රී ලංකාව අතර පවතින මිත්‍රත්වයට වසර 50ක් සැපිරීමත් සමඟ එම සිහිනය යථාර්තයක් බවට පත් විය. 2008 වර්ෂයේ ජනවාරි මස වරායෙහි වැඩ ආරම්භ කළ අතර 2010. 11.18 දින වැඩ නිම කර ජන සතු කරන ලදී. චීන මූල්‍ය අනුග්‍රහය ලබා ගෙන නිමවා ඇති ලොව ප්‍රථම අභ්‍යන්තර වරාය වේ. මුළු පිරිවැය ඇමරිකානු ඩොලර් මිලියන 361කි. ඉන් 85%ක් චීන එක් ඊම් බැංකුව හරහා ද, ඉතිරි 15% ශ්‍රී ලංකා වරාය අධිකාරිය මඟින් ද ලබා දී තිබේ. මාගම්පුර මහින්ද රාජපක්ෂ ජාත්‍යන්තර වරායෙන් බලාපොරොත්තු වූ අරමුණ ඉටු වීම පිළිබඳ ව අධ්‍යයනය කිරීම මෙහිදී ප්‍රධාන අරමුණ විය. මෙම පර්යේෂණය සඳහා ප්‍රාථමික හා ද්විතීක දත්ත භාවිතයට ගනු ඇත. රැස්කරගත් දත්ත ප්‍රමාණාත්මක සහ ගුණාත්මක ක්‍රමවේද ඔස්සේ විශ්ලේෂණය කරයි. ශ්‍රී ලංකාව තුළ හම්බන්තොට හැර වෙනත් වරායන් තිබෙන අතර මෙහිදී හම්බන්තොටට වරායක ඇති අවශ්‍යතාවය සහ බලාපෙරොත්තු වු අරමුණු ඉටුවුන බව අධ්‍යයනය තුළින් අනාවරණය විය. මුහුදු සේද මාවත ගමන් කරන්නේ, ශ්‍රී ලංකාවේ දකුණු දෙසින් වන අතර මාගම්පුර වරායේ සිට ජාත්‍යන්තර නාවික මාර්ගයට ඇත්තේ මුහුදු සැතපුම් 12කි. දිනකට ගමන් කරන නැව් 400ට අධික නැව්වලින් 10 කට අවශ්‍ය ඉන්ධන, ආරක්ෂාව, අළුත්වැඩියාව, ආහාර පාන යනාදිය සැපයීම තුළින් ඉන් ලැබෙන ධනස්කන්ධය ශ්‍රී ලංකාවේ විදේශ විනිමය සඳහා යොදා ගැනීමට හැකිවීම යනාදියයි. කොළඹ වරායේ තවදුරටත් පුළුල් කිරීමේ ඉඩකඩ අවම වීම, එසේම කොළඹ වරාය ජාත්‍යන්තර මුහුදු මාර්ගයට වඩා බෙහෙවින් ඈතින් පිහිටීම, මාගම් පුර වරාය මඟින් වාහන ආනයනය කිරිම තුළින් අගනුවර පැවැති මාර්ග තදබදය අවම වීම, මාගම්පුර වරාය ගොඩබිම හාරා ඉදි කිරීම තුළින් ඒ සඳහා වැයවූ මුදල අනෙකුත් වරායන් ඉදිකිරීමේදී වැයවන මුදලට වඩා අඩු වීම යන කරුණු මත කොළඹ වරායේ ඉඩකඩ සීමිත බැවින් වාහන ප්‍රතිඅපනයනය සඳහා මාගම්පුර මහින්ද රාජපක්ෂ ජාත්‍යන්තර වරාය සුවිශේෂී කාර්යභාර්යයක් සිදු කරනු ලබයි.

**මුඛ්‍ය පද :** වරාය අධිකාරිය, යටිතල පහසුකම්, මූල්‍ය පිරිවැය, වරාය සේවා

[1] ආර්ථික විද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, shayinipremara2@gmail.com

# ඉගෙනුම් ඉගැන්වීමේ ක්‍රියාවලිය සඳහා නව තාක්‍ෂණය යොදා ගැනීමේදී ගුරුවරයා දක්වන දායකත්වය

**පී. සී. විජේසිංහ**[1]

**සංක්ෂේපය**

නිරන්තර දියුණුවට ලක්වන නව තාක්ෂණය 21 වැනි සියවසේ අධ්‍යාපන අංශය කෙරෙහිද දායකත්වය දක්වමින් සුවිශේෂී වූ වෙනස්කම් රාශියක් සිදුකර ඇත. එදා පොතපතින් ලබා ගත් දැනුමට පමණක් සීමා වූ පාසල් අධ්‍යාපනය විෂය දැනුම ගවේෂණයට ඉඩ දෙන පාසල් ඉගෙනුම් ඉගැන්වීමේ ක්‍රියාවලියක් දක්වා ගෙන ඒමට නව තාක්ෂණය උපකාරයෙන් හැකියාව ලැබී ඇත. මෙලෙස නව තාක්ෂණය පදනම් කර ගත් පාසල් ඉගෙනුම් ඉගැන්වීමේ ක්‍රියාවලිය අධ්‍යාපන අමාත්‍යාංශය විසින් දිවයින පුරා පාසල් වල ක්‍රියාත්මක කිරීමට කටයුතු යොදා ඇත. මෙම මෘදුකාංග හා සිසුන් සම්බන්ධීකරණය කරන ප්‍රධාන මාධ්‍ය වන්නේ, ගුරුවරයා ය. නමුත් සෑම ගුරුවරයෙකු තුළ ම තමන්ට අදාල විෂය දැනුමට අමතරව නව තාක්‍ෂණය භාවිතය සම්බන්ධයෙන් ද නිසි අවබෝධය තිබේද යන්න ගැටලුවකි. ඒ අනුව මෙම අධ්‍යයනයේ ප්‍රධාන අරමුණ වූයේ, ඉගෙනුම් ඉගැන්වීමේ ක්‍රියාවලිය තුළ නව තාක්‍ෂණික ශිල්ප ක්‍රම භාවිතය පිළිබඳ ගුරුවරයාගේ දැනුවත් භාවය පරීක්‍ෂා කිරීමයි. මේ පිළිබඳ අධ්‍යයනයට ගම්පහ දිස්ත්‍රික්කයේ අර්ධ නාගරික ප්‍රදේශයක පිහිටා ඇති ඌරාපොල මධ්‍ය මහා විද්‍යාලයේ සසම්භාවී ව තෝරාගත් ගුරුවරුන් 20ක් යොදා ගෙන පරීක්‍ෂණය සිදු කරන ලදී. ප්‍රශ්නාවලි හා සම්මුඛ සාකච්ඡා මගින් ප්‍රාථමික දත්ත ද, ද්විතික දත්ත වශයෙන් ආශ්‍රිත ග්‍රන්ථ හා අන්තර්ජාලයත් භාවිතා කෙරුණි. දත්ත විශ්ලේෂණයෙන් අනාවරණය වූයේ, ඉගෙනුම් ඉගැන්වීමේ ක්‍රියාවලිය සඳහා නව තාක්‍ෂණික ශිල්ප ක්‍රම භාවිතයේ දී ගුරුවරයා ගැටලු කිහිපයකට මුහුණ දෙන බවයි. මේ සඳහා ගුරුවරයා සතු දැනුම ප්‍රමාණවත් නොවීම, පාසල් පරිගණක පහසුකම් ප්‍රමාණවත් නොවීම, ගතානුගතික අධ්‍යාපන රටාවෙන් මිදීමට ඇති අකමැත්ත, කාලච්ඡේද වෙන් කර ගැනීමේ අපහසුතා ආදී වශයෙන් ඒවා හඳුනා ගත හැකි විය. මේ අනුව පාසල් ඉගෙනුම් ඉගැන්වීමේ ක්‍රියාවලිය සඳහා නව තාක්ෂණය පදනම් කර ගැනීමට පෙර ඒ සඳහා අවශ්‍ය ප්‍රායෝගික පුහුණුව මෙන්ම අවශ්‍ය පහසුකම් ලබා දීමෙන් වඩාත් සාර්ථක ප්‍රතිඵල ලබා ගැනීමට හැකි බව හඳුනාගත හැකි විය.

**මුඛ්‍ය පද :** ඉගෙනුම් ඉගැන්වීමේ ක්‍රියාවලිය, නව තාක්ෂණය, ගුරුවරයා

[1] ආර්ථික විද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, chathuwijesinghe16@gmail.com

# ලෝකයේ රිය අනතුරු සඳහා බලපාන සාධක පිළිබඳ ආනුභවික අධ්‍යයනයක්

**ජී. එල්. ඩී. එච්. සී. මදුසංක**[1]

**සංක්ෂේපය**

21 වන සියවස වන විට ලෝක ජනගහනය බිලියන 7.4 ක් පමණ වන අතර ජනගහනයේ සිදු වන මෙම සීඝ්‍ර වර්ධනය හා කාර්මීකරණයත් සමග ඔවුන්ගේ අවශ්‍යතා හා උවමනාවන් ද පුළුල් වී තිබේ. මේ සමග ම මොවුන්ගේ වුවමනා කාර්යක්ෂමව සිදුකර ගැනීම පිණිස රථ වාහන භාවිතය දිනෙන් දින ඉහළ යමින් පවතී. මේ හේතුවෙන් ලෝකයේ සිදුවන රිය අනතුරු ප්‍රමාණය ද දිනෙන් දින ඉහළ යමින් පවතී. ලෝක සෞඛ්‍ය සංවිධානයේ වාර්තාවලට අනුව රිය අනතුරු වලින් වර්ෂයකට ලෝකයේ පුද්ගලයින් මිලියන 1.25ක් පමණ ජීවිතක්ෂයට පත්වන අතර පුද්ගලයින් මිලියන 20-50ක් පමණ ආබාධයට ලක් වේ. එමනිසා මෙම අධ්‍යයනය ලෝකයේ රිය අනතුරු සඳහා බලපාන සාධක හඳුනා ගැනීම අරමුණු කර ගනිමින් සිදු කරන ලදී. මේ සඳහා ලෝකයේ විවිධ පර්යේෂකයින් විසින් සිදුකරන ලද පර්යේෂණ, පොත් පත්, පුවත් පත්, සඟරා ආදී ද්විතික දත්ත මූලාශ්‍ර අධ්‍යයනය කරන ලදී. මෙම අධ්‍යයනයට අනුව නිදිමත, තෙහෙට්ටුව, අධික වෙහෙස, රියැදුරන්ගේ වයස, අධ්‍යාපන මට්ටම, වෘත්තිය මට්ටම, පුම්තිරිභාවය, රියැදුරු බලපත්‍රය, ගමන් ගන්නා වේගය, විවිධ උපාංග භාවිතය, සට්ටනීය ස්ථානය, මධ්‍යසාර හා මත්ද්‍රව්‍ය භාවිතය, පෞද්ගලික තත්ත්වය හා ස්ත්‍රී පුරුෂ බව රිය අනතුරු සඳහා බලපාන සාධක ලෙස හඳුනා ගන්නා ලදී. ඒ අතරින් වේගය සහ මධ්‍යසාර හා මත්ද්‍රව්‍ය භාවිතය රිය අනතුරු සඳහා වැඩිම බලපෑමක් සිදු කරන සාධක ලෙස හඳුනා ගන්නා ලදී.

**මුඛ්‍ය පද** : රිය අනතුරු, ආනුභවික අධ්‍යයනය, මධ්‍යසාර හා මත්ද්‍රව්‍ය භාවිතය, පුම්තිරිභාවය

[1] ආර්ථික විද්‍යා අධ්‍යන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, hchamithmadusanka@gmail.com

# අන්තර්ජාල භාවිතය පාසල් ළමුන් කෙරෙහි ඇති කරනු ලබන බලපෑම (ගම්පහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය ඇසුරෙන්)

එම්. ඩී. ඒ. නිශාදි[1]

## සංක්ෂේපය

පාසල් ළමුන්ගේ අන්තර්ජාල භාවිතය ඔවුන්ගේ අධ්‍යාපනයට හා හැසිරීම් රටාවට හිතකර මෙන්ම අහිතකර ප්‍රතිඵල රැසක් ඇති විය හැකි බව මෑත කාලීනව සිදුකරන ලද පර්යේෂණ මඟින් තහවුරු කර ඇත. එබැවින් අන්තර්ජාල භාවිතය මගින් පාසල් ළමුන් කෙරෙහි ඇති කරන බලපෑම් කෙබඳු ද යන්න හඳුනා ගැනීමට මෙම අධ්‍යයනය සිදුකර ඇත. ඒ සඳහා බලපාන සාධක සෙවීම අධ්‍යයනයේ අරමුණයි. අධ්‍යයනය සඳහා ගම්පහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තෝරාගත් අතර සරල සසම්භාවී නියැදුම් ක්‍රමය යටතේ, පාසල් සිසුන් 200 දෙනෙක් අධ්‍යයනයට භාවිත කරන ලදී. සම්මුඛ සාකච්ඡා සහ ප්‍රශ්නාවලි ක්‍රමය උපයෝගී කර ගනිමින් දත්ත එක් රැස්කර ඇත. ඒ අනුව, නියැදියෙන් 90% ක් අන්තර්ජාල භාවිතය කරන අතර දිනකට පැය 1-3 ත් අතර කාලයක් අන්තර්ජාල භාවිතය සිදු කරනු ලබන බව තහවුරු විය. එමෙන්ම හරාත්මක වැඩසටහන් අධ්‍යයනය කිරීමේ ඌනතාවයක් දක්වන බවත්, විදේශීය වැඩසටහන් සහ සමාජ ජාල භාවිතය සඳහා වැඩි නැඹුරුතාවයක් දක්වන බවත් අනාවරණය විය. තවද, සමාජ ජාල භාවිතයේදී, ස්ත්‍රී පුරුෂ වශයෙන් වෙනස්කම් පවතින බවත් හෙළි විය. දෙමාපියන් රැකියාවල නිරතව සිටින හා නාගරික ප්‍රදේශවල ජීවත්වන ළමුන් වැඩි වශයෙන් අන්තර්ජාල භාවිත කරන බව අනාවරණය විය. ළමුන් බහුලව අන්තර්ජාලය භාවිත කරන කාල සීමාවන් තුළදී අධ්‍යපනික හා හරාත්මක වැඩසටහන් අධ්‍යයනය කිරීමටත්, සමාජ ජාල භාවිතය, චිත්‍රපට ආදී වැඩසටහන් කෙරෙහි ඇති නැඹුරුතාවයෙන් මුදවා ගැනීම මඟින් අහිතකර භාවිතය තුළින් පාසල් ළමුන් කෙරෙහි ඇති කරනු ලබන සෘණාත්මක බලපෑම් අවම කල හැකි බව මෙම අධ්‍යයනය මඟින් තවදුරටත් අනාවරණය විය.

**මුඛ්‍ය පද :** අන්තර්ජාල, හරාත්මක වැඩසටහන, අධ්‍යාපනය.

[1] ආර්ථික විද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, anuththara.nishadi6@gmail.com

# Author Index – English


| | |
|---|---|
| Abeysinghe, M. S. | 03 |
| Dissanayake, D. K. S. M. A. | 01 |
| Fernando, K.C. L. | 03 |
| Fernando, K. D. A. K. | 95 |
| Gunasekara, K. D. H. | 99 |
| Gunasekara, K. D. H. U. | 103 |
| Gunasekara, M. G. R. V. | 51 |
| Jayawardena, M.Y. G. V. | 14 |
| Kamalawarna, R. S. S. | 26 |
| Koshila, W. M. A. S. | 16 |
| Liyanapathirana, L. N. M. | 40 |
| Madhushani, P. A. G. | 58 |
| Madushani, H. D. P. | 61 |
| Marapana, M. B. M. R. C. S. | 67 |
| Moragolla, U. R. G. D.A. K. | 30 |
| Nayomi, W. V. P. M. | 72 |
| Padmasika, P. A. T. | 101 |
| Rajapaksha, G. A. | 103 |
| Samarsinghe, K. N. | 78 |
| Sandamali, M. A. D. N. | 73 |
| Senavirathne, K. B. R. | 97 |
| Silva, A. K. M. D. | 21 |
| Sudasinghe,K. M. | 92 |
| Weerasinghe, M. W.A.S.M. | 89 |
| Wijesinge, S. A. D. M. D. | 82 |

# කර්තෘ නාම අනුක්‍රමණිකාව


| | |
|---|---|
| අධිකාරි ඒ. ඒ. එස්. ඩී. | 55 |
| අමරසිංහ ඒ. ඒ. එම්. කේ. | 23 |
| අස්සැල්ල ඒ. ඩී. එන්. පී. | 15 |
| ආරියකරුණා ටී. ඩබ්. කේ. එම්. | 69 |
| උබේසේන එම්. ඩී. එම්. | 10 |
| ඒකනායක එච්. කේ. | 22 |
| කාංචනමාලා ටී. ඩබ්. එස්. | 19 |
| කාරියප්පෙරුම කේ. ඒ. ඩී. එස්. | 87 |
| කුමාරි ඒ. එල්. ඒ. ඩී. පී. | 86 |
| කුමාරිහාමි වයි. එම්. ආර්. | 76 |
| කුලසිංහ කේ. ඒ. එස්. ආර්. | 94 |
| ගජනායක ජී. එම්. ජී. සී. | 80 |
| ගමගේ පී. ජී. එන්. එල්. | 75 |
| ගුණවර්ධන කේ. එල්. අයි. බී. | 07 |
| චතුරංග ආර්. ඩී. | 83 |
| චන්ද්‍රසිරි කේ. එල්. සී. එස්. | 19 |
| ජයපත්ම ජේ. එච්. එම්. සී. | 68 |
| ජයසේකර ආර්. එම්. ටී. පී. | 77 |
| තිලකරත්න බී. එම්. එන්. එම්. | 32 |
| දයාරත්න ඩී. එම්. එස්. එස්. | 35 |
| දසනායක ඩී. එම්. එච්. | 102 |
| දිල්රුක්ෂි එල්. එච්. සී. | 37 |
| දිල්ෂානි එම්. ඒ. ආර්. | 13 |
| දිසානායක ඩී. එස්. පී. | 54 |
| දොලපිහිල්ල වී. එන්. | 47 |
| දුලාරි ඩී. පී. ඩී. | 66 |
| නමුණුකුල එන්. කේ. අයි. ටී. | 96 |
| නිෂාදි එම්. ඩී. ඒ. | 107 |
| පතිරත්න බී. පී. එස්. පී. | 52 |
| පතිරාජ එම්. පී. ඒ. ඩබ්. | 53 |
| පෙරේරා එල්. ජී. ඩී. | 29 |
| ප්‍රනාන්දු ඩී. එන්. | 65 |
| ප්‍රනාන්දු එල්. යූ. එස්. | 81 |
| ප්‍රියංගනී කේ. එම්. සී. | 90 |
| ප්‍රියදර්ශන ඩබ්. එච්. එස්. එල්. | 59 |
| ප්‍රියදර්ශනී ඩබ්. එච්. එස්. | 38 |
| ප්‍රේමරත්න ආර්. පී. ඩී. එන්. වයි. | 84 |
| ප්‍රේමරත්න එස්. එම්. | 104 |
| බණ්ඩාරනායක එන්. ඩබ්. | 71 |
| මදුසංක ජී. එල්. ඩී. එච්.සී. | 106 |
| මධුභාෂිණී ඒ. ඒ. පී. එම්. | 06,42,63 |

| | |
|---|---|
| මධුභාෂිණී කේ. පී. එල්. | 31 |
| මධුභාෂිණී පී. එස්. | 24 |
| මධුවන්ති ඩී. එච්. එස්. | 33 |
| මධුවන්ති ජී. ඒ. එස්. | 27 |
| මධුශානී එම්. ආර්. එස්. | 60 |
| මානපුරාව ඩබ්. ඒ. ටී. ඩී. එස්. | 88 |
| මැණික්ගේ එම්. පී. එන්. පී. | 44 |
| මුතුමාල එස්. වී. | 57 |
| යසින්තා එම්. එල්. සී. | 02 |
| යාමිණී එස්. ඒ. ඩී. | 98 |
| රණසිංහ යූ. ආර්. එන්. එස්. | 36 |
| රාජකරුණා ආර්. එච්. එම්. අයි. එම්. | 93 |
| රාජපක්ෂ ආර්. එන්. කේ. | 17 |
| රුවන්ති ඩබ්. ජී. ආර්. | 56 |
| රෝහණ ජේ. එම්. ඒ. | 18 |
| ලසන්ති එස්. සී. | 08 |
| ලියනගේ එම්. කේ. එන්. එස්. | 25 |
| ලියනගේ එල්. එන්. | 04 |
| ලොරෙන්සුහේවා එල්. එල්. ආර්. | 11 |
| වත්සලා බී. කේ. ජී. | 70 |
| විජේතුංග ඩබ්. ඩබ්. එම්. ටී. ඩී. | 34 |
| විජේරත්න ඊ. ඒ. එම්. | 79 |
| විජේසිංහ පී. සී. | 105 |
| විජේසේකර ඩබ්. පී. ඒ. එස්. | 05 |
| වෙදමුණි ඩබ්. එන්. ඩී. එස්. එස්. | 48 |
| වෙලගෙදර ඩබ්.ඩී.එල්. | 62 |
| ශාන්ති යූ. කේ. ඩී. | 41 |
| ශාලික එච්. ටී. ඒ. | 45 |
| සමරනායක යූ. ජී. පී. එස්. | 09 |
| සමරසිංහ සී. ටී. | 39 |
| සඳමාලි එම්. පී. ඩී. | 50 |
| සමුද්‍රිකා අයි. පී. එච්. | 49 |
| සිරිවර්ධන ඒ. පී. ටී. එම්. | 74 |
| සේනපාල කේ. ඒ. ඩී. එල්. වයි. එම්. | 20 |
| සෝමරත්න එම්. ආර්. එස්. | 91 |
| සෝමසිරි පී. එන්. ඩී. ඒ. | 12,46 |
| හංසිකා ජී. එන්. ඩී. | 64 |
| හපුආරච්චි එච්. ඒ. ඩී. ටී. | 43 |
| හේමචන්ද්‍ර ඩී. එස්. ආර්. | 85 |
| හේරත් එච්. එම්. යූ. පී. | 100 |
| හේරත් එච්. එම්. එන්. ඩී. | 28 |